# තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

# 2016

## කාර්ය සාධන වාර්තාව
## (2016.01.01 – 2016.12.31 දක්වා)

**9 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල**

## ගරු අමාත්‍යතුමාගෙන්. . . . . . . .

මිහිතලයේ පූර්ණ අයිතිය මිනිසාට පමණක් හිමි වූවක් නොවේ. එම අයිතිය සතුන්ට ද හිමි වූවකි. මිනිසා මෙන්ම සතුන්ද ජීව ලෝකයේ සාමාජිකයෝය. එබැවින් මිහිතලයේ කවර තැනක හෝ දිවි ගෙවීමට මිනිසාට ඇති අයිතිය සියළු සතුන්ට ද හිමි වූවකි.

අප මවුබිම දහම් දිවයිනක් බවට පත්වීමේ ඓතිහාසික සිදුවීම මහින්දාගමනයයි. දඩ කෙළියෙහි යෙදුණු දේවානම්පියතිස්ස රජුන් අමතන මිහිඳු මහරහතන් වහන්සේ විසින් කරන ලද ප්‍රකාශය වනජීවී සංරක්ෂණයේ වාර්තාගත වී ඇති ප්‍රථම ප්‍රකාශනයයි. "අහසේ සැරිසරන සියොතුන්ට ද මිහිමත සැරිසරන වන සතුන්ට ද කවර තැනක හෝ ජීවත් වීමට ද ඔබ මොබ යාමට ද නුඹට හා සමාන වූ හිමිකමක් ඇත්තේය. සියළු මිනිසුන් හා ජීවීන් එහි උරුමකරුවන් වන අතර නුඹ එහි හුදු භාරකරු පමණි". මෙම ප්‍රකාශය පිළිගත් රජතුමා සතුන්ට අභය දානය දෙමින් සිරිලක අභය භූමියක් බවට පත් කළේය. ලෝකයේ මුල්ම අභය භූමිය මෙය බව යුනෙස්කෝ ආයතනය විසින් පිළිගෙන තිබේ.

දිවයිනේ භූමියෙන් 14% ක් ආවරණය කරමින් වනජීවී රක්ෂිත ක්‍රියාත්මකය. ජාතික උද්‍යාන 22 ක්, උද්භිද උද්‍යාන 5ක්, දැඩි ස්වභාවික රක්ෂිත 5ක්, අභය භූමි 63ක් හා සත්ව උද්‍යාන 2 ක වගකීම තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් දරනු ලැබේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, වනජීවී භාරය හා තිරසර සංවර්ධන ඒකකයේ ලේකම් කාර්යාලය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකය. මෙම සියළු ආයතන සහ දෙපාර්තමේන්තු ද මෙහෙයවීමේ සංකල්ප අප ගොඩනගාගෙන ඇත්තේ මිහිඳු මහරහතන් වහන්සේගේ ඉහත ප්‍රකාශය සමඟිනි. වනජීවී සංරක්ෂණය පිළිබඳ විශ්ව ප්‍රකාශය මෙම සංකල්පය සමඟ මැනවින් ගැලපේ. නීතිය බලාත්මක කිරීම මෙන්ම අවබෝධය පුළුල් කිරීම මඟින් වනජීවී සංරක්ෂණයට සමස්ථ ජනතා දායකත්වය ලබා ගැනීම අපගේ අරමුණයි.

තිරසර සංවර්ධනය නව සංකල්පයක් බව සත්‍යයකි. එහෙත් එය අප රටට ආවේණික දේශජ, ජාතික, ආගමික සංකල්පයකි. අප අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන තිරසර සංවර්ධන ක්‍රියාදාමයන් විශ්ව ප්‍රඥප්ති රැසක ආභාසය ලබා තිබේ. අප අමාත්‍යාංශයට අයත් විෂය සීමාව තුළ වනජීවීන් හා ස්වභාවික සම්පත් ආරක්ෂා කර ගනිමින් මතු පරම්පරාවට දායක කිරීමේ වගකීමට අපි උරදී සිටින්නෙමු. මාගේ ප්‍රයත්නයට ශක්තියක් වෙමින්, මඟ පෙන්වමින්, නව ව්‍යාපෘති රැසක් ලබා දෙමින්, කටයුතු කරන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් හා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ මෙහෙවර අගය කරමි.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ කාර්යභාරය ශක්තිමත් කොට අපේක්ෂිත අරමුණු යථාර්තයක් බවට පත් කිරීමට අප සමඟ එක්ව සිටිමින් බුද්ධිමය දායකත්වය ලබා දෙන විද්වතුන්ගේ මෙහෙවර සැබවින්ම ශක්තියකි. එසේම අවංක කැපවීමකින් කටයුතු කරන අප නිලධාරීන් හා කාර්ය මණ්ඩල ක්‍රියාකාරීත්වය අගය කරමි. පරිසර සංරක්ෂණය හා තිරසර සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් හා වගකීම් එළි දැක්වීමේ සක්‍රීය මෙහෙවර ආරම්භ වී ඇත්තේ මෙම දෙපාර්ශවයේම දායකත්වය නිසාය.

අප අමාත්‍යාංශට අයත් වනජීවී සංරක්ෂණ, සත්ත්ව උද්‍යාන හා උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු දැයෙහි සංවර්ධනය උදෙසා මුදල් ඉපයීමේ මහඟු මෙහෙවර සාර්ථකව සිදු කරයි. 2016 වසරේ සංචාරක පැමිණීමෙන් රු.මි. 3944 ක ආදායමක් ඉපයීමට මෙම අමාත්‍යාංශය සමත් විය. විශේෂයෙන්ම විදේශිකයන් තුළ ප්‍රසාදනීය ආකල්ප ඇති කිරීම සඳහා කටයුතු කිරීම අතිශය වැදගත් කරුණක් ලෙස සඳහන් කළ හැකිය.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව පුළුල් ජන අවධානයට ලක්වන දෙපාර්තමේන්තුවකි. වනසතුන් සහ පරිසරය පිළිබඳ අප රටෙහි පවතින සංවේදීතාව මෙයට බලපාන ප්‍රබල සාධකයකි. අප කාර්යයන් පිළිබඳ විමසිල්ලෙන් සිටිමින් ජනතාව දැනුවත් කිරීම මෙන්ම විවිධ කරුණු අවධානයට ලක් කිරීමට ද කටයුතු කල ජනමාධ්‍ය වෙතද මගේ ප්‍රසාදය හිමි වේ.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය නව වනෝද්‍යාන රැසක් ඇති කිරීමට සමත් විය. 2016 වසර පැවති වනෝද්‍යාන සංවර්ධනය කිරීමට පියවර රැසක් ගනු ලැබූ වර්ෂයකි. කැපවීමෙන් කටයුතු කරන නිලධාරීන් කාර්ය මණ්ඩල උත්තේජනය කිරීමට අපි කටයුතු කළෙමු. සොබා දහමේ ආශීර්වාද ලද අප දිවයිනේ අපට ආවේණික සත්ත්වයින් සහ ගහ කොළ ආරක්ෂා කර ගැනීමත්, ඓතිහාසික උරුමයේ වටිනාකම් හා සබැඳි ජනතා දායකත්වය ප්‍රශස්ත ලෙස වර්ධනය කිරීමට කැපවීමත් මාගේ ප්‍රාර්ථනයයි.

**ගාමිණී ජයවික්‍රම පෙරේරා**
තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය

## ගරු නියෝජ්‍ය අමාත්‍යතුමියගෙන්. . . . . . . .

වනජීවී සම්පත රැකගෙන තිරසර රටක් වෙනුවෙන් රටේ සංවර්ධනයට උරදෙන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2016 වසර සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාවට සුබපැතුම් පණිවිඩයක් එක්කිරීමට අවස්ථාව ලැබීම ගැන ප්‍රථමයෙන්ම මාගේ සතුට ප්‍රකාශ කරමි.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වනජීවී භාරය යන අප අමාත්‍යාංශයට අයත් ආයතන මඟින් ගරු අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාගේ උපදෙස් අනුව වර්තමානයේදී සුවිශේෂී කාර්යයභාරයන් රැසක් සිදුකෙරෙමින් පවතී.

ශ්‍රී ලංකාවේ රක්ෂිත වනජීවී ජාලය ස්ථාපිත කිරීම, වඳවීමේ තර්ජනයට ලක්ව සිටින සියලු වනජීවීන් සංරක්ෂණ කිරීම, අන්ත්‍රාවට ලක්වූ සත්ත්ව විශේෂ සංරක්ෂණය, දේශීය ශාඛ හා මල් වර්ග ගවේෂණ කටයුතු මෙන්ම සංරක්ෂණ කටයුතු සිදු කිරීම, මානව සම්පතට හා අලි සම්පතට කිසිදු හානියක් සිදු නොවන ආකාරයෙන් අලි මිනිස් ගැටුම් අවම කර ගැනීම, ජාතික උද්‍යාන රැසක සංවර්ධනය කිරීම ඇතුළු කරුණු රැසක් මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා පසුගිය කාලය තුළ පියවර රැසක් ගත් අතර එසේ නොවූයේ නම් මිනිස් ජීවිත නැති වන සංඛ්‍යාව හා අලි සම්පත නැතිවන ප්‍රමාණය මීට වඩා සැළකිය යුතු මට්ටමකින් ඉහළයාමට බොහෝදුරට ඉඩ තිබුණි.

මොණරාගල, තණමල්විල, වැල්ලවාය ඇතුළු ප්‍රදේශ කිහිපයක වනජීවී නිලධාරීන් දැඩි කැපවීම් මධ්‍යයේ කළ මෙහෙයුම් වලදී මිනිස් ජීවිතවලට හානි සිදුකරන දරුණු වනඅලි 6 දෙනෙකු අල්ලාගෙන හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට ගෙන යාමට හැකිවිය.

ජාතික උද්‍යානවලින් දිනකට රටට ලැබෙන ආදායම දළ වශයෙන් රු.මි. 20ක් පමණ වේ. මෙම ආදායම වැඩි කරගැනීම සඳහා නව යෝජනා කිහිපයක්ද මේ වන විට ක්‍රියාවට නංවා ඇත.මීට පෙර එතරම් අවධානයට යොමු නොවුණු තල්මසුන් හා ඩොල්ෆින් නැරඹීම කෙරෙහි දෙස් විදෙස් සංචාරකයින්ගේ වැඩි උනන්දුවක් මේ වනවිට පවතී.

සත්වයින් නිදහසේ ජීවත්වන අවස්ථා නැරඹීමටද දෙස් විදෙස් සංචාරකයින්ගේ වැඩි උනන්දුවක් පවතින අතර රිදීයගම සෆාරි සහ පින්නවල සත්වෝද්‍යානවල ආදායම් වැඩිවීමෙන් ඒ බව මැනවින් පසක් වෙයි.මල් අපනයනය කිරීමේදී විශාල මුදලක් උපයාගත හැකි වන අතර මල්වගාකරුවන් දිරිගැන්වීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව හරහාද වැඩසටහන් රැසක් දිවයින පුරා මේ වනවිට ක්‍රියාවට නංවා තිබේ.

පරිසරය රැකගෙන පරිසරයට හිතකර ආකාරයෙන් සංවර්ධන කටයුතු ද මෙහෙයවීම අද ලෝකයේ තිබෙන බරපතලම අභියෝගාත්මක ගැටළුවකි. පසුගිය අවුරුදු 30 – 40 තුළ විවිධ ආකාරයෙන් පරිසරය දූෂණය වීම නිසා සිදුවූ ඵලවිපාක මේ වන විට මුළු ලෝකයේම ජනතාවට ක්‍රම ක්‍රමයෙන් අත්විදීමට සිදුවී තිබේ. සෑම රටකම විවිධ දේශගුණික විපර්යාසයන් ඇතිවී අඩු වැඩි වශයෙන් හදිසි ආපදා, ස්වභාවික විපත් සිදුවී ජනතාව අසරණවී සිටින්නේද තිරසර සංවර්ධනයක් සැලසුම් සහගතව ක්‍රියාත්මක නොවූ නිසාය. එම නිසා තිරසර සංවර්ධනය යන විෂය ප්‍රථම වරට අමාත්‍යාංශයක් යටතට පත්කොට පරිසරය රැකගෙන සියලු සංවර්ධන කටයුතු සිදුකළ යුතු බවට තිරසර සංවර්ධන මහ ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම 2016 වර්ෂය තුළ දී ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි. ඒ සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේත් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේත් ආශිර්වාදය හිමිවී තිබේ.

**සුමේධා ජී. ජයසේන**
තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍ය

## ලේකම්තුමාගෙන් . . . . . . . .

ලාංකීය ජන සමාජයට නව විෂය ක්ෂේත්‍රයක් දායාද කරමින් තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය 2015 සැප්තැම්බර් 21 දිනැති 1933/13 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව ස්ථාපනය කෙරිණි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, වනජීවී භාරය සහ යෝජිත තිරසර සංවර්ධන කවුන්සිලය මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෙරෙන ආයතන වේ.

සියලුම රටවල් විසින් ක්‍රියාවට නැංවීමට කැපවී සිටින ක්ෂේත්‍ර 17 ක් ආවරණය කරගත් තිරසර සංවර්ධන අභිමතාර්ථයන් ද ඒ යටතේ විහිද ගිය අරමුණු 169 කින්ද සමන්විත තිරසර සංවර්ධන ප්‍රඥාප්තිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ කාර්යය මෙම අමාත්‍යාංශය මඟින් මෙහෙයවීමට ලැබීම අප ලද මහඟු අවස්ථාවකි. මෙම වගකීම ඉටුකරලීම පිණිස වූ අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අංශය ද නුදුරේදී ස්ථාපනය කිරීමට නියමිත තිරසර සංවර්ධන කවුන්සිලය ද මඟින් ශ්‍රී ලංකාවට අභිනව සංවර්ධන මාවතක් හඳුන්වාදෙනු ඇත.

මීට අමතරව අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව හා වනජීවී භාරය යන ආයතන මඟින් පරිසරය ඇතුළු වනජීවීන්ගේ සංරක්ෂණය ප්‍රමුඛ කර ගනිමින් සංචාරක කර්මාන්තය හා එමඟින් ජාතික ආදායම ඉහල නැංවීම සඳහා අවශ්‍ය සියළු පියවර ගනිමින් සිටියි.

අපේ රටේ ජෛව විවිධත්වය සුරක්ෂිත කරමින් උරුම වී තිබෙන ශාක සහ සත්ත්ව ප්‍රජාවන්ගෙන් ගහණ වූ පරිසර පද්ධතීන් ආරක්ෂා කරගැනීමෙහි මූලික වගකීම පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වේ. විශේෂයෙන්ම අලි මිනිස් ගැටුම අවම කර රටේ අභිමානය වූ අලි සම්පත ඇතුළු සියළු ජීවීන්ගේ පැවැත්ම තහවුරු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ අරමුණය.

සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවද සත්වයින්ගේ සුබසාධනය මෙන්ම සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගනිමින් සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.තර්ජනයට ලක්වූ සත්ත්ව විශේෂ සුපෝෂණය කරමින් සත්ත්ව ගහණයන් කළමනාකරණය කිරීම උදෙසා වැදගත් කාර්යභාරයක් සත්වෝද්‍යාන මඟින් ඉටු කරනු ලබයි. වර්තමානයේ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, දෙහිවල සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය, රිදියගම සෆාරි උද්‍යානය සහ දෙහිවල සත්වෝද්‍යානයේ සතුන්ට පළතුරු, එළවළු සපයන ගෝනපොල ගොවිපල දක්වා ව්‍යාප්තව ඇත.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධව ශ්‍රී ලංකාවේ පුරෝගාමී ආයතනය වේ. එම දෙපාර්තමේන්තුව ශාක විතැන් සංරක්ෂණය, ශාක පිළිබඳ අධ්‍යයන කටයුතු, ශ්‍රී ලංකාවේ උද්‍යාන අලංකරණ විද්‍යාව ප්‍රවර්ධනය සඳහා පර්යේෂණාත්මක සහ තාක්ෂණික වැඩසටහන්, මල්වගා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදෙන අතර දෙස් විදෙස් සංචාරකයින් සඳහා ආකර්ශනීය ස්ථානයක් ද වේ.

වනජීවී භාරය පාරිසරික අගය වර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම, සංරක්ෂණ ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාව බලගැන්වීම සහ පාරිසරික නීති ප්‍රචලිත කිරීම මඟින් ජෛව විවිධත්වය සුරැකීමට කටයුතු කරමින් සිටියි.

පසුගිය වර්ෂය තුල අමාත්‍යාංශය යටතේ පවත්නා ඉහත ආයතන මඟින් අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ළඟා කර ගැනීම සඳහා නිරන්තරයෙන් මඟ පෙන්වමින්, නායකත්වය හා උපදේශකත්වය ලබා දුන් තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාට හා නියෝජ්‍ය ඇමතිණී ගරු සුමේධා ජී. ජයසේන මැතිණියට මගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

2016 වසරේ කාර්යය සාධන වාර්තාව සඳහා තොරතුරු ලබා දුන් සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට සහ අංශ ප්‍රධානීන්ටත්, කාර්ය සාධන වාර්තාව සැකසීමේ කටයුතුවල නිරත වූ සියළුම නිලධාරීන්ට හා භාෂා පරිවර්තක කටයුතු කර දුන් නිලධාරීන්ටත් මාගේ ස්තුතිය පුද කරමි.

**ආර්.එම්.ඩී.බී.මීගස්මුල්ල**
ලේකම්
තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

# පටුන

පිටුව

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

අමාත්‍යාශයේ දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන් 11

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන 12

පාලන අංශය 13

සැලසුම් අංශය 16

සංවර්ධන අංශය 18

තිරසර සංවර්ධන අංශය 21

මුදල් අංශය 26

අභ්‍යන්තර විගණන අංශය 29

නීති අංශය 31

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව 33

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව 53

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව 85

ශ්‍රී ලංකා වනජීවී භාරය 115

# තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය

## දැක්ම

" තිරසර දේශයක්"

## මෙහෙවර

" ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණය තහවුරු කරමින්, තිරසර සංවර්ධනය සඳහා වූ ජාතික මෙහෙවර ඉටු කිරීම සඳහා වන නියමු ආයතන සම්බන්ධීකරණය තුළින් ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවට නැංවීම"

## ප්‍රධාන කාර්යයන්

- තිරසර සංවර්ධන, වනජීවි, උද්භිද උද්‍යාන හා සත්වෝද්‍යාන යන විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන්, ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම් කටයුතු කිරීම.
- 1937 අංක 02 දරණ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂා ආඥා පනත ක්‍රියාත්මක කරවීම.
- 1928 අංක 31 දරණ උද්භිද උද්‍යාන ආඥා පනත ක්‍රියාත්මක කරවීම.
- 1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනත ක්‍රියාත්මක කරවීම.
- තිරසර මිනුම් සහ පාරිසරික දර්ශක සම්පාදනය කිරීම.
- ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණය, උද්භිද උද්‍යාන නඩත්තුව හා මල් වගා කිරීම වැඩිදියුණු කිරීම.
- සිව්පාවන්, පක්ෂීන් සහ උරගයින් ආදී විවිධ සතුන් ඒකරාශී කිරීම හා ප්‍රදර්ශනය කිරීම.
- වනජීවී සම්පත් සංරක්ෂණය කිරීම.
- වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේ දී පරිසර සංරක්ෂණය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- වනජීවී භාරය, වන සත්ත්ව සංරක්ෂණ අරමුදල, සත්ත්ව උද්‍යාන සංරක්ෂණ අරමුදල, උද්භිද උද්‍යාන භාරකාර අරමුදල සම්බන්ධ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය.

# අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු හා ආයතන

**තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය**

දෙපාර්තමේන්තු

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

ආයතන

- ශ්‍රී ලංකා වනජීවී භාරය
- තිරසර සංවර්ධන කවුන්සිලය (ඉදිරියේදී පිහිටුවීමට නියමිතයි)

# පාලන අංශය

## හැඳින්වීම

මෙම අමාත්‍යාංශය සතුව පවතින වටිනාම සම්පත වන මානව සම්පත මනාව කළමනාකරණය කිරීම තුළින් අමාත්‍යාංශ අරමුණු ඉටු කරවා ගැනීම සඳහා අවශ්‍ය සහය ලබා දීම පාලන අංශය මඟින් සිදු කරනු ලබයි.

## කාර්යභාරය

- අමාත්‍යාංශය තුළ සාමාන්‍ය පරිපාලනය හා විනය පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ගේ ආයතන කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු නිසියාකාරව සිදු කිරීමට අමාත්‍යාංශයෙන් අවශ්‍ය සහය ලබා දීම.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තු ප්‍රශ්න හා අමාත්‍ය මණ්ඩල සංදේශ වලට අදාළ කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

## 2016.12.31 දිනට ප්‍රගතිය

- වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව හා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යන ආයතන තුනටම අදාල ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2017.01.01 දිනට වැටුප් පරිවර්තන ලිපි 72 සැකසීම.
- 2016.12.31 දිනට වැටුප් වර්ධක ලැබීම සඳහා හිමිකම් ලබා තිබූ නිලධාරීන් 41 දෙනෙකු සඳහා වැටුප් වර්ධකය ගෙවා ඇත.
- පාලන අංශයට ලැබෙන සියලුම ලියාපදිංචි ලිපි හා සාමාන්‍ය ලිපි අප්‍රමාදව අදාළ ආයතන හා අංශ වලට යොමු කරනු ලබයි.
- අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්යාලය, නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය, මාණ්ඩලික නිලධාරීන් 13 දෙනෙකුගේ රාජකාරී දුරකතන, නිවාස දුරකතන, ජංගම දුරකතන බිල්පත් කඩිනමින් ගෙවීම් කටයුතු සිදුකර ඇත.
- පාලන අංශය තුළ ආරම්භ කල පුස්තකාලය මගින් අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයට පොත් ලබා දීම තුළින් ඔවුන්ගේ දැනුම් මට්ටම් ඉහළ නැංවීමට හා කියවීමේ රුචිය පුළුල් කිරීමට කටයුතු කර ඇත.
- අදාල කාලය තුල නිලධාරීන් තිදෙනෙකු ස්ථිර කර ඇති අතර එක් නිලධාරියෙක් සඳහා උසස්වීම් ලබා දී ඇත.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 45 ක් මේ වන විට යොමුකර ඇත.
- ගරු තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමාගෙන් වාචික පිළිතුරු අපේක්ෂිත පාර්ලිමේන්තු ප්‍රශ්ණ 14 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

- කාර්යාල සේවක සේවයේ III වන පන්තිය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2016.09.09 දින මෙම අමාත්‍යාංශයේදි පැවැත්විය. කා.සේ.සේ. නිලධාරින් 07 දෙනෙකු පෙනි සිටි අතර එම නිලධාරීන් සියළුම දෙනා අදාල පරීක්ෂණය සමත් විය.
- ප්‍රවාහන අංශය මගින් පවත්වාගෙන යනු ලබන වාහන සංචිතයේ වාහන 12 ක් පවතින අතර එමඟින් මෙම අමාත්‍යාංශයේ සියළු අංශවලට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් කඩිනම්ව හා කාර්යක්ෂමව ලබා දේ. ඊට අමතරව ප්‍රවාහන අංශය මඟින් නිල වාහන 28 ක් නඩත්තු කරනු ලැබේ. 2016.12.31 දින වන විට විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු නමින් පැවති වාහන 12 ක් මෙම අමාත්‍යාංශය නමින් පවරා ගැනීමට කටයුතු කර ඇත. තවත් වාහන 03 ක් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

## විදේශීය පුහුණු සහ වැඩමුළු

අමාත්‍යාංශ ලේකම් ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මහතා තායිලන්තයේ පැවති ( 2 nd A-P Regional Forum on e-Government and Smart Cities for Sustainable Development ) වැඩමුළුව සහ නිව්යෝර්ක් නුවර පැවති (High Level Thematic Debate on Achieving the Sustainable Development Goals) සම්මුතිය සඳහා සහභාගී විය.අමාත්‍යාංශ අතිරේක ලේකම් ( සංවර්ධන ) එල්.ජේ.එම්.ජී.සී. බණ්ඩාර මහතා මාලදිවයිනේ පැවති " Information on the Second International Shark & Ray Conservation Symposium" වැඩමුළුව සඳහා සහභාගී වූ අතර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් එච්.ඒ.වී.පී. හපන්ගම මහතා සහ අධ්‍යක්ෂ ඉංජිනේරු කේ.ආර්.එස්. පෙරේරා මිය තායිලන්තයේ පැවති "Asia- Pacific Forum on Sustainable Development Regional Priorities for Implementation of the 2030 Agenda for Sustainable Development in Asia and Pacific "වැඩමුළුව සඳහා සහභාගී විය. තව ද අමාත්‍යාංශ සහකාර ලේකම් එම්.ඩී.එම්. කුමුදුනී මෙනවිය චීනයේ පැවති Seminar on International Production Capacity Co-operation for "the Belt and Road " ( Asian ) Countries වැඩමුළුව සඳහා සහභාගී විය.මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී සෝමසිරි දෙණියවත්ත මහතා සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක ජේ.ඩී.ඒ.පී. ජයසිංහ මහත්මිය තායිලන්තයේ පැවති (PIM International Programme in Management) වැඩමුළුව සඳහා සහභාගී වූහ.

### මානව සම්පත සංවර්ධනය උදෙසා ලබා දුන් පුහුණු වීම්

| පුහුණු ආයතනය | පුහුණුවේ නම | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ශ්‍රම ඵලදායිතා වර්ධනය සඳහා කාර්යාල කළමනාකරණය | 3 |
| ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | Capacity building Programme for SLAS class I officers | 1 |
| නිපුණතා සංවර්ධන අරමුදල | තොරතුරු තාක්ෂණයට අදාල භාණ්ඩ ප්‍රසම්පාදනය සහ ඇගයීම | 7 |
| දුරස්ථ අධ්‍යාපන ආයතනය | Results Based Management | 1 |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ශ්‍රම ඵලදායිතා වර්ධනය සඳහා කාර්යාල කළමනාකරණය | 1 |
| Adams Skills Development Centre | Microsoft Excel | 5 |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | එක් දින, දෙදින හා තෙදින පුහුණු වැඩසටහන් හා සහතික පත්‍ර පාඨමාලාව. | 3 |
| Adams Skills Development Centre | Microsoft Excel | 5 |
| මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | Advanced programme attitudes and skills Development. | 1 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | Diploma in English | 1 |
| MILODA<br>Academy of financial Studies | Diploma in Procurement Contract Administration | 2 |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | Professional Development of Drivers and K.K.S. to Words a quality work environment | 5 |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ගිණුම්කරණයේ නීති | 8 |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ගැටළු විසඳීම හා තීරණ ගැනීම | 2 |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | Procurement Procedure | 5 |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | Effective Handling of Personal Files | 2 |

# සැලසුම් අංශය

## හැඳින්වීම

අමාත්‍යාංශයේ සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම මෙම අංශයේ අරමුණ වේ.ඒ අනුව ජාතික අවශ්‍යතාවන් හඳුනාගනිමින් සංවර්ධන කටයුතු සැලසුම් කෙරෙන අතර එකී සැලසුම්, අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතන මඟින් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ. 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සැලසුම් කටයුතු වල නිරතවීම මෙම අංශය මඟින් සිදු කරනු ලැබීය.

## කාර්යභාරය

- අමාත්‍යාංශයට අදාළ සංවර්ධන සැලසුම් සකස් කිරීම.
- ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව හා ආයතන සම්බන්ධීකරණය කරගනිමින් මාසික, ත්‍රෛමාසික හා වාර්ෂිකව සමස්ත ප්‍රගතිය ලබාගැනීම හා තොරතුරු විමර්ශනය කර ප්‍රගති සමාලෝචන වාර්තා පිළියෙළ කිරීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු පිළියෙළ කිරීමට සහායවීම හා එම ආයතනය විසින් ක්‍රියාත්මක ව්‍යාපෘති අධීක්ෂණය හා මෙහෙයවීම.
- අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තුවල සංවර්ධන යෝජනා සැකසීමේ දී අවශ්‍ය උපදෙස් ලබා දෙමින් එම යෝජනා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කිරීම.
- රු.මි. 50 ට වැඩි ව්‍යාපෘති වල ප්‍රගතිය මුදල් අමාත්‍යාංශය හා ව්‍යාපෘති කළමනාකරණ මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම.
- අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශයේ ප්‍රගතිය ඇතුළත් කාර්ය සාධන වාර්තා සැකසීම.
- වාර්ෂික කාර්ය සාධන වාර්තා සැකසීම.
- ජනාධිපති ලේකම් කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ප්‍රතිපත්ති සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා මහ බැංකුවට, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවලට අවශ්‍යතාවය මත තොරතුරු ලබාදීම.

- අමාත්‍යාංශයට අදාළ විෂයයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම.
- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති වාර්තා සැකසීම සහ එයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තු වල සිදුවන විශේෂ සිදුවීම් පිළිබඳ තොරතුරු සතිපතා ජනාධිපති ලේකම් කාර්යාලයට වාර්තා කිරීම.
- කාර්තුමය ප්‍රගතිය ජනාධිපති ලේකම් කාර්යාලයට වාර්තා කිරීම.
- දිස්ත්‍රික්ක වල පැවැත්වෙන වනජීවී දෙපාර්තමේන්තු වලට අදාළ රැස්වීම් සංවිධානය හා සම්බන්ධීකරණය.
- වනදිවි මිතුරු කමිටු හා අමාත්‍යාංශය සම්බන්ධීකරණ කටයුතු.
- "ජනපතිට කියන්න" මහජන පැමිණිලි සම්බන්ධව ක්‍රියා කිරීම.
- වනඅලි තර්ජන නිසා සිදුවන ජීවිත හා අනිකුත් හානි වෙනුවෙන් වන්දි ලබාදීමේ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

## 2016.12.31 දිනට ප්‍රගතිය

- 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනයන්හි කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වන ලදී.
- ව්‍යාපෘති වල ප්‍රගතිය මුදල් අමාත්‍යාංශයට යොමු කොට ඇත.
- 2015 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකසා අවශ්‍ය ආයතන වෙත ලබා දී ඇත.
- අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන 2016.09.30 දින ප්‍රගතිය ඇතුළත් කාර්යය සාධන වාර්තාව සකස් කර ඇත.
- ජනාධිපති ලේකම් කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා මහ බැංකුවට, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අවශ්‍ය තොරතුරු ලබා දී ඇත.
- ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය තොරතුරු ලබා දෙමින් ඔවුන් සමඟ සම්බන්ධීකරණය කිරීම.
- 2017 අයවැය සඳහා ව්‍යාපෘති වාර්තා සහ අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම.
- වනජීවී, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන සම්බන්ධ ගැටළු වලදී අදාල ආයතන සමඟ එක්ව ඒවා නිරාකරණය සඳහා කටයුතු කිරීම.
- උතුරු පළාත් ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම සහ පුත්තලම ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත.
- මෙහෙයුම් මැදිරිය ස්ථාපනය කිරීමේ කටයුතු සහ තොරතුරු යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

# සංවර්ධන අංශය

## හැඳින්වීම

මෙම අංශය මඟින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු විධිමත්ව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම සඳහා සම්බන්ධීකරණය සිදුකරනු ලබයි.

## කාර්යභාරය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍යවන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- වනජීවී සම්පත් සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සම්බන්ධව අමාත්‍යාංශය වෙත ලැබෙන මහජන පැමිණිලි පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීම.
- ජනාධිපති කාර්යාලය වෙත සහ අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබෙන වනජීවී, උද්භිද උද්‍යාන හා සත්වෝද්‍යාන විෂයයන්ට අදාල මහජන පැමිණිලි විසඳීම සඳහා අදාළ ආයතන වෙත යොමු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සතු ඉඩම්, පුරාවිද්‍යා රක්ෂිත ආශ්‍රිත ගැටළු සහ රක්ෂිත තුළ පදිංචි මහජනතාවගේ ගැටළු පිළිබඳව කටයුතු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් අත්පත් කර ගැනීම, විරෝධතා පරීක්ෂණ පැවැත්වීම සහ නව අත්පත් යෝජනා යැවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් සම්බන්ධ ඉල්ලීම්, පැවරීම් හා ගැටළු සම්බන්ධව කටයුතු කිරීම.
- ජාතික වනෝද්‍යාන, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන තුළ සිදුකරන සංවර්ධන කටයුතු, සත්ත්ව රෝහල් ඉදි කිරීමේ කටයුතු, විදුලි වැට ඉදි කිරීම, වනඅලි රැඳවුම් මධ්‍යස්ථාන ඉදිකිරීම, වාසස්ථාන සුපෝෂණය කිරීම යනාදී කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
- වනජීවී, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන කටයුතු වලට අදාළව සහ මෙම අමාත්‍යාංශයේ විෂය කටයුතු වලට අදාලව වෙනත් අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- වන අලි තර්ජනයට ලක්වන ජනතාව උදෙසා සකස් කරන රක්ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම.
- අභය භූමි මායිම් නැවත සලකුණු කිරීමට අදාළ කටයුතු.

- හීලෑ අලි පැටවුන් සහ වෙනත් වනජීවී සතුන් සම්බන්ධ ඉල්ලීම් පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය.
- ආගමික පෙරහැර කටයුතු සඳහා හීලෑ අලි ඇතුන් ලබා දීම විධිමත් කිරීම හා ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කිරීම.
- මහජන පීඩාකාරී සත්ත්ව ප්‍රජාවන් සම්බන්ධ ගැටළු නිරාකරණ කිරීමට අදාළ පර්යේෂණ හා නිර්දේශ ලබාදීම.
- අලි සංරක්ෂණය සම්බන්ධ කටයුතු.
- පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමනාකරණ ව්‍යාපෘතිය සම්බන්ධව අදාල ආයතන සමඟ එක්ව කටයුතු කිරිම.
- ශ්‍රී ලංකාව තුළ මල් වගාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පුළුල් සැලැස්මක් සකස් කිරීමට අදාල ආයතන සමඟ එක්ව කටයුතු කිරිම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු තුනට අදාල සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සම්බන්ධව කටයුතු ඉටු කිරීම.
- ජල සම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳව අදාල ආයතන සමඟ එක්ව කටයුතු කිරිම.
- ආපදා කළමනාකරණ සැලැස්ම සහ වැඩසටහන් ව්‍යාපෘතිය 2014 – 2018 එම ව්‍යාපෘතිය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරවීම.
- සමුද්‍ර ක්ෂීරපායින් සංරක්ෂණය සම්බන්ධ කටයුතු.
- අමාත්‍යාංශයේ සියලුම නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සැකසීම, නිර්දේශ කිරීම, අධීක්ෂණය සහ ගෙවීම් කටයුතු සඳහා නිර්දේශ ලබා දීම.
- මහළුළිය කුඩා ජල විදුලි බලාගාරය -හෝර්ටන් තැන්න ව්‍යාපෘතිය හා මුහුදු පැළෑටි සංරක්ෂණ ව්‍යාපෘතියට අදාල කටයුතු.
- ජනාධිපති කාර්යාලයේ අධීක්ෂණය යටතේ උතුරු නැගෙනහිර පළාත්වල කැළෑ ඉඩම් එළිපෙහෙලි කිරීමේ කමිටුව සඳහා අවශ්‍ය සහාය ලබා දීම.
- නව සංවර්ධන යෝජනා ක්‍රම පිළිබඳව යෝජනා ලබා ගැනීම, ඇඟයීම හා නිර්දේශ ලබාදීම.
- පාර්ලිමේන්තුවේදී විවාදයට ගනු ලබන පාර්ලිමේන්තු ප්‍රශ්න විශ්ලේෂණය කර සාරාංශගත කිරීම.
- සියළුම නීති කටයුතු අධීක්ෂණය. මෙහිදී පනත් සඳහා අවශ්‍ය වන රෙගුලාසි නියෝග සංශෝධන සකස් කිරීම පිළිබඳව සහ ගැසට් පත්‍ර පල කිරීම් ආදිය පිළිබඳව අධීක්ෂණය කරනු ලබයි.
- ගරු අමාත්‍යතුමා සහභාගී වන දිස්ත්‍රික් වැඩමුළු සහ සංචාරයන් පිළිබඳව සම්බන්ධීකරණ කටයුතු සිදු කිරිම සහ එම අවස්ථාවන්හි දි ඉදිරිපත් කරනු ලබන ගැටළු සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම.
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන සත්ත්ව හුවමාරු වැඩසටහන් පිළිබඳව සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම සහ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

## 2016.12.31 දිනට ප්‍රගතිය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාලව ලැබුණු මහජන පැමිණිලි 26 ක් සම්බන්ධව කටයුතු කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
- ජනාධිපති කාර්යාලයෙන් ලැබෙන වනජීවී, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන විෂයට අදාල මහජන පැමිණිලි 53 ක් සම්බන්ධව කටයුතු කිරීම සඳහා අදාල ආයතන වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
- අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ලැබෙන වනජීවී, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන විෂයට අදාල මහජන පැමිණිලි 20 ක් සම්බන්ධව කටයුතු කිරීම සඳහා අදාල ආයතන වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් සම්බන්ධව පිටස්තර පුද්ගලයන් හා ආයතන අතර පවතින ගැටළු 09 ක් නිරාකරණය කිරීමට කටයුතු සලසා ඇත.
- ජාතික උද්‍යාන තුල වැව් ප්‍රතිසංස්කරණය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව වැඩසටහනක් ක්‍රියාත්මක කරවීම මඟින් වනජීවී දෙපාර්තමේන්තුවේ උද්‍යාන වල වැව් ප්‍රතිසංස්කරණ කටයුතු කිසිවක් මේ වසර තුළ සිදුකර නොමැත.
- සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය අවස්ථා වල අමාත්‍යාංශයේ සහය ලබා දී ඇත.
- වනජීවී සංරක්ෂණ විෂය සම්බන්ධව වෙනත් අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කර තිබූ කැබිනට් පත්‍රිකා 02 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පින්නවල නව සත්වෝද්‍යානයට සහ අලි අනාථාගාරය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනිමේ ක්‍රියාවලියේ දී නව අත්පත් යෝජනා 4 ක් ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර විරෝධතා පරීක්ෂණ 6 ක් සිදු කර අවසන් අතර නිර්දේශ ඉඩම් අමාත්‍යාංශය වෙත යැවීමට නියමිතය.
- ජල සම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳ අදාළ ආයතන මඟින් පවත්වනු ලබන රැස්වීම්, වැඩමුළු සහ ක්ෂේත්‍ර පරීක්ෂණ වලට සහභාගි වී ඇත.
- වනජීවී සංරක්ෂණ, වනෝද්‍යාන සහ උද්භිද උද්‍යාන සම්බන්ධ පොදු කටයුතු සිදු කිරීම.
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට සත්ත්ව විශේෂ අල්ලා ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය අනුමැතිය ලබා දීමට කටයුතු කිරීම.
- රාජතාන්ත්‍රික ප්‍රදානයක් ලෙස නවසීලන්තයේ ඕක්ලන්ඩ් සත්වෝද්‍යානයට ගැහැණු අලි පැටවකු ප්‍රදානය කිරීම සඳහා සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අදාල අනුමැතිය ලබා දීමට කටයුතු කිරීම.
- ශ්‍රී පාද අඩවිය ආසන්නයේ නව උද්භිද උද්‍යානයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම.
- රජරට නවෝදය - ජනපති වැඩසටහන ක්‍රියාත්මක කරවීම සඳහා, අවශ්‍ය අවස්ථා වල දී අමාත්‍යාංශයේ සහය ලබා දීම.
- හීලෑ අලි ඇතුන් විධිමත් කිරීම සම්බන්ධව නීති රෙගුලාසි හා නිර්නායකයන් සකස් කර අමාත්‍ය මණ්ඩල සංදේශ මඟින් අනුමත කරවා ගැනීම.

# තිරසර සංවර්ධන අංශය

## හැඳින්වීම

තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය ස්ථාපනය කිරීම තුළින් මෙරට තිරසර සංවර්ධන අවශ්‍යතා සහ උපමානයන් සම්බන්ධීකරණය පිණිස වූ සමෝධානිත අවස්ථාවක් ඇති කරලයි.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ මූලික මෙහෙවර වන්නේ සම්මධායික ප්‍රවේශයක්, අන්තර් අමාත්‍යාංශ/ ආයතන යාන්ත්‍රණයක් සහ පාර්ශවකරුවන්ගේ පුළුල් සහභාගිත්වය තුළින් පාරිසරික, සාමාජයීය සහ ආර්ථික තිරසාරභාවය සහතික කරලීම උදෙසා සංවර්ධන අභියෝගයන් මෙහෙයවීම පිණිස වන ප්‍රතිපත්ති, උපායමාර්ග, යාන්ත්‍රණයන් සහ ක්‍රම ශිල්පයන් පිළිබඳ සම්බන්ධීකරණය සිදු කිරීමයි.

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන අභිමතාර්ථයන් (SDG's) ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම සිදු කරන කේන්ද්‍රීය ජාතික මට්ටමේ ආයතනය වන්නේ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයයි.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අංශයක් ස්ථාපනය කර තිබෙන අතර එමඟින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථයන් ඉටු කරලීම පිණිස වන ප්‍රතිපත්තිමය සහ ආයතනික රාමුවක් සහ ක්‍රමෝපායික හා කාර්යය සැලැස්මක් සඳහා වන ජාතික තිරසර සංවර්ධන සැලැස්මක් සැකසීමේ කාර්යය මේ වනවිට ආරම්භ කර තිබේ.

## ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- අවශ්‍ය තිරසර සංවර්ධන ප්‍රතිපත්ති, ක්‍රමෝපායන්, වැඩසටහන්, යාන්ත්‍රණයන් සහ ක්‍රම ශිල්පයන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම ඇතුළු තිරසර සංවර්ධන ක්‍රියාකාරකම් හා මැදිහත් වීම් සිදු කිරීමේ කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කිරීම.
- තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ප්‍රමුඛතා හඳුනා ගැනීම හා යාන්ත්‍රණයන් ගොඩනැඟීම පිණිස ජාතික මට්ටමේ සහ ඉන් පහළ මට්ටමේ අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
- තිරසර සංවර්ධන හා සම්බන්ධ පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම හා එම පර්යේෂණ ප්‍රතිඵල ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හා ක්‍රියාවට නැංවීම පිණිස යොමු කිරීම.
- තිරසර සංවර්ධන 2030 න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන අභිමතාර්ථයන් සඳහා වන ජාතික හා ජාත්‍යන්තර කැපවීම පිණිස අධීක්ෂණය, ඇගයීම හා වාර්තා කිරීම ඇතුළු පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය.

## ක්‍රමෝපායික සැලැස්ම (2016-2017)

තිරසර සංවර්ධන අංශය විසින් ඉටු කිරීමට අපේක්ෂා කරන මූලික ක්‍රියාමාර්ගයන් පහත දැක්වේ.

- ධාරිතා සංවර්ධනය, ක්‍රියාත්මක කිරීමේ විධි ක්‍රම සහ තිරසර සංවර්ධන සඳහා වන සහභාගිත්වය - තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අංශ හා විශේෂඥ ක්‍රියාකාරී කණ්ඩායම සවිමත් කිරීම. තිරසර සංවර්ධන අභිමතාර්ථයන් ක්‍රියාවට නැංවීම පිණිස ජාතික සක්‍යතාව පුළුල් කිරීම සහ ජාතික පරිණාමන ක්‍රියාවලිය සවිමත් කිරීම.

- ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්තිය - පාර්ශවකරුවන් දැනුවත් කිරීම, දැනුම ගොඩ නැගීම හා යෝග්‍ය ඒකාබද්ධ තිරසර සංවර්ධන දැක්මක් හා ගමන් මාර්ගයක් ගොඩ නැගීම සඳහා කැපවීම, සැලසුම් කිරීම සහ ඉදිරියට රැගෙන යාම.

- ජාතික තිරසර සංවර්ධන සැලැස්ම-මෙය ජාතික තිරසර සංවර්ධන ක්‍රමෝපායික සහ කාර්යය සැලැස්මක් දක්වා පුළුල් වන අතර එමෙන්ම පරිවර්තනීය ක්‍රියාවලියට ඉඩ සලසන ප්‍රතිපත්තිමය - නියාමන හා ආයතනික කාර්ය රාමුවක් දක්වා විකසනය වනු ඇත.

- ජාතික තිරසර සංවර්ධන අභිමතාර්ථ සඳහා පහසුකම් සැලැසීමේ යාන්ත්‍රණය - අන්තර් ආයතනික සම්බන්ධීකරණය, තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරලීම පිණිස ආංශික / විෂයාත්මක විශේෂඥතාවය ගොඩනැංවීම සහ අධීක්ෂණය ඇගයීම හා වාර්තා කිරීම.

- ජාතික තිරසර සංවර්ධන දත්ත හා තොරතුරු ද්වාරය - ජාතික මට්ටමින් තොරතුරු හුවමාරුව විප්ලවීය ලෙස ඉහළ නැංවීම පිණිස ප්‍රාදේශීය, ජාතික, කලාපීය මෙන් ම ජාත්‍යන්තර සම්බන්ධතාවයන් ඔස්සේ සියළු තිරසර සංවර්ධන තොරතුරු කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම මෙන්ම ජාතික සැලසුම් සැකසීමේ දී විශ්වාසනීය සංඛ්‍යාමය තොරතුරු විශ්ලේෂණ පද්ධතියක් ලෙස උපකාරී වීම.

- තිරසර සංවර්ධන ප්‍රතිචාර යාන්ත්‍රණය - ජාතික තිරසර සංවර්ධන ප්‍රවේශ අවශ්‍යතාවයන් හඳුනාගැනීම උදෙසා සහ සංවර්ධන කාර්යයන් හෝ ව්‍යාපෘති මෙන්ම නිර්දේශයන් ක්‍රියාවට නැංවීමේ දී සුදුසු පරිදි වැදගත් අමාත්‍යාංශ, ආයතන සහ සංවිධාන සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහ නිර්දේශ ලබා දෙමින් අවශ්‍ය පරිදි සහයෝගය උපකාරය ලබා දීම.

- තිරසර සංවර්ධන නිර්නායක රාමුව - විශේෂඥ අධීක්ෂණ ක්‍රියාදාමයක් ඔස්සේ ප්‍රතිපත්ති සැලසුම් හා අනුමත කිරීමේ ආයතන සඳහා අධීක්ෂණ හා ඇගයීමේ මාර්ගෝපදේශ පිණිස වන මාර්ගෝපදේශ, ක්‍රම ශිල්ප සහ ප්‍රමිතීන් සපයා දීම.

- ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්ති නියාමන ආයතනික කාර්ය රාමුව සහ කාර්ය සැලසුම - මෙය ජාතික තිරසර සංවර්ධන සැලැස්මේ මාර්ගෝපදේශනයට අනුව ගොඩනැගෙනු ඇති අතර ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන උපායමාර්ග සංවර්ධනය සහ ක්‍රියාවට නැංවීම සඳහා වන තිරසර සංවර්ධන කවුන්සලයක් ස්ථාපනය කිරීම පිණිස වූ යෝජිත පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාත්මක වනු ඇත.

- තිරසර සංවර්ධන ආදර්ශන තිරසර සංවර්ධනය සැබෑ සංවර්ධන මාර්ගය ලෙස විශේෂයෙන්ම ප්‍රාදේශීය, ප්‍රජා සහ දිස්ත්‍රික් මට්ටමින් යථාවත් කිරීම පිණිස අදාල පාර්ශවකරුවන් සහ රාජ්‍ය අංශයේ ආයතන

## 2016.12.31 දිනට ප්‍රගතිය

- තිරසර සංවර්ධන කාර්යාලය ආරම්භ කිරීම 2016 මාර්තු මස 01 දින සෙත්සිරිපාය තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේදී සිදුවිය.
- 2016 මාර්තු සහ 16 වන දින 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාවට නැංවීම පිළිබඳ ඉහල පෙළේ රැස්වීමක් බත්තරමුල්ල අපේ ගම පරිශ්‍රයේදී පැවැත්වීණි. එහිදී තිරසර සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ක්‍රියාවට නැංවීමට සැලසුම් කර තිබෙන කාර්යභාරය සම්බන්ධයෙන් තිරසර සංවර්ධන විෂය ක්‍රියාවට නැංවීමට අදාළ පාර්ශවකරුවන් දැනුවත් කෙරිණි.
- ජාතික තිරසර සංවර්ධන දැක්ම හා ගමන් මාර්ගය පිලිබඳ සංවාදයක් 2016 මාර්තු සහ 29 දින පැවැත්විණි. මෙහි මූලික අරමුණ වූයේ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇති තිරසර සංවර්ධන මාර්ග සිතියමට අදාළ දැක්ම සහ ගමන් මාර්ගය පිළිබඳ අදහස් ලබා ගැනිමයි. මෙම සංවාදයෙන් ලද දැනුම 2016 අප්‍රේල් සහ 3 දින සිට 5 දින දක්වා බැංකොක් හී පැවැති ආසියා පැසිපික් තිරසර සංවර්ධන සංසදයේදී ඇති කර ගන්නා ලද එකඟතාවයට පාදක කර ගන්නා ලදී.
- අප්‍රේල් මස 3 සිට 5 දක්වා බැංකොක් නුවරදී ආසියා පැසිපික් තිරසර සංවර්ධන සංසද සැසියක් පැවැත්වූ අතර එහිදී ගාමිණි ජයවික්‍රම පෙරේරා මැතිතුමා 2016 වර්ෂය සඳහා සභාපතීත්වයට තෝරා පත්කර ගන්නා ලදී. මේ සඳහා රාජ්‍ය එක්සත් ජාතීන් සහ සෙසු ජාත්‍යන්තර සංවිධාන නියෝජිතයන් 420 කට වැඩි පිරිසක් සහභාගී වූහ. 2016 ආසියා පැසිපික් තිරසර සංවර්ධන සංසදයේ ප්‍රතිඵල පාරිසරික , සාමාජීය සහ ආර්ථික යන විවිධ අංශයන්හී කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කරනු ඇත. මෙම සංසදය කලාපය තුළ 2030 න්‍යාය පත්‍රය සැකසීමේ කේන්ද්‍රීය ක්‍රියාකාරීත්වය ලෙස කටයුතු කරනු ඇත.
- 2016 අප්‍රේල් 27 දින ශ්‍රී ලංකාවේ අනාගත පරම්පාරාවගේ අයිතීන් පිලිබඳ වටමේස සාකච්ඡාවක් පැවැත්විණි. තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය, ජගත් අනාගත කවුන්සිලය හා සමඟ එක්ව මෙම වටමේස සාකච්ඡාවක් පැවැත්විණි.
- මැයි මස 02 සිට 05 දක්වා ජාතික තිරසර සංවර්ධන මාර්ග සිතියම සැකසීමේ වැඩමුළුව පැවැත්විණි .
- එක්සත් ජාතීන්ගේ තාක්ෂණ පහසුකම් සැලසීමේ යාන්ත්‍රණයක් හා ජාතික විද්‍යා ප්‍රතිපත්ති මණ්ඩපය සෙත්සිරිපාය, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ දී මැයි මස 17 වන දින පැවැත්විණි.
- භූමිකා හා වගකීම් සම්බන්ධව ආකෘති ගොඩ නැංවීම සහ ස්පීතික සිතියම්කරණයේ මූලික වටයේ වැඩසටහන් පැවැත්වීණි. මෙහිදී තිරසර සංවර්ධන ඉලක්ක 169 ක්‍රියාවට නැංවීමට අදාල 416 ක්වූ රාජ්‍ය ආයතන අතර අන්තර් සබැඳියාව අර්ථ ගැන්වීට අභිප්‍රාය විය. මෙහිදී ස්පීතික සිතියම්කරණ කාර්යය විවිධ ඉලක්ක හා ආයතන අනුව ආකෘති සැලසුම්කරණයේ පිණිස මූලික වටය සිවු දිනක් දක්වා පැවැත්වීමට තිරණය කෙරිණි.
- ජාතික තිරසර සංවර්ධන සහභාගීත්ව මණ්ඩපය සහ සමාර්ථනක පරිමණයන්හී සංවාදය 2016 ජුනි මස 03 දින පැවැත්විණි.

- බලයලත් ආයතන පිලිබඳ දත්ත ගොනුවට අදාළ මූලික වටය සම්පූර්ණ කිරීම වෙනුවෙන් කටයුතු කෙරිණි. ශ්‍රී ලංකාවේ වගකිව යුතු ආයතන 416 ක් හඳුනාගැනීම වෙනුවෙන් වූ අභ්‍යන්තර තිරසර සංවර්ධන ක්‍රියාකාරී කාණ්ඩයමක් නිරත විය.
- පරිණාමන ක්‍රියාවලිය විමධ්‍යගතකරණය වෙනුවෙන් වූ පළාත් තිරසර සංවර්ධන සහභාගීත්ව මණ්ඩපය මධ්‍යම පළාත් වැඩසටහන 2016 ජූනි මස 27 වැනි දින දී පැවැත්විණි.
- පද්ධතිමය චින්තන ප්‍රවේශය භාවිතයෙන් තිරසර සංවර්ධන අභිමතාර්ථයන් හා ඉලක්ක ශ්‍රී ලංකාවේ ජල සහ සනීපාරක්ෂක අංශය කෙරෙහි යොදා ගැනීම වෙනුවෙන් වූ විශ්ලේෂණ කාර්යය රාමුවක් පිලිබඳ වටමේස සාකච්ඡාව 2016 ජූනි මස 29,30 හා ජූලි 01 දින පැවැත්විණ.

- 2016.08.04 දින "Roundtable Discussion on planning and Financing the National Sustainable Development Agenda" වැඩමුළුව පැවැත්වූ අතර එමගින් රාජ්‍ය අංශයේ නිලධාරීන් හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හා අනුබද්ධ ආයතන වල නිලධාරීන් සමග සම්බන්ධ වී ඉදිරි සැලසුම් පිළිබඳ සාකච්ඡා කර තීරණ ගන්නා ලදී.
- 2016.09.07 දින තිරසර සංවර්ධන අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන වල කාර්යභාරය පිළිබඳව මූලික දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලද අතර අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සඳහා අදාල වන තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ සාකච්ඡා කිරීම සිදු විය.
- 2016.09.14 හා 15 දෙදින තුල නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය " ලක්දිය මැදුරෙ "හි පවත්වන ලද "Invitation to the National SDG 6 Workshop" වැඩමුළුව සඳහා රාජ්‍ය ආයතන හා පෞද්ගලික අංශය සම්බන්ධ වූ අතර තිරසර සංවර්ධන ඉලක්ක අතරින් 06 වන ඉලක්කය සපුරා ගැනීම හා ඒ සම්බන්ධ කතිකාවතක් ගොඩනැගීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු විය.
- තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රය හා සංවර්ධන අභිමථාර්තයන් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පහසුකම් සැලසීම් සිදුකරන කේන්ද්‍රීය ජාතික මට්ටමේ ආයතන ලෙස තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය ක්‍රියා කරනු ලබයි. ඒ අනුව 2030 වන විට ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සංවාද, වැඩමුළු හා ව්‍යාපෘති සැලසුම් කිරීම සිදු කරමින් පවතින අතර එය ජාතික, පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ මූලික වැඩසටහන් දියත් කරමින් පවතී.
- ඒ අනුව 2016 ඔක්තෝම්බර් මස 05 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික තිරසර සංවර්ධන සහභාගීත්ව මණ්ඩපය සංවිධානය කළ අතර පාර්ලිමේන්තුව නියෝජනය කරමින්, මන්ත්‍රීවරුන්, අමාත්‍යවරුන්, රාජ්‍ය නිලධාරීන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශයේ ප්‍රධානීන් සියලු දෙනා දැනුවත් කිරීමේ සංවාද මණ්ඩපය සංවිධානය කරනු ලබන අතර ශ්‍රී ලංකාව තුල තිරසර සංවර්ධන අභිමතාර්ථයන් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කර, ඒ තුළින් තිරසර රටක් ගොඩනැගීම සඳහා සියලු දෙනා පෙළගැසිය යුතු බවට වන කතිකාවතක් ගොඩනැගීමට හැකියාව ලැබිණි.

- තිරසර සංවර්ධන අභිමතාර්ථ අතරින් සැමට ගුණාත්මක අධ්‍යාපන අවස්ථා ලබාදීමේ අරමුණ ශ්‍රී ලංකාව තුල සාක්ෂාත් කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගයන්, ඒ සඳහා පවතින අවස්ථාවන්, බාධාවන්, අධ්‍යාපනයේ වර්තමාන ගමන්මග සහ එහි වෙනස්කම් සිදුවිය යුතු ආකාරයත්, අනාගත ලෝකයට ගැලපෙන පරිදි ගුණාත්මක අධ්‍යාපන ක්‍රමවේදයක් සැකසීමත්, සියලු දෙනාටම අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව උදා කිරීම හරහා රටේ සමානාත්මතාවය ස්ථාපිත කිරීමට ඒ තුලින් ලබා ගත හැකි දායකත්වය පිළිබඳ පුළුල් සාකච්ඡාවක් අධ්‍යාපනය සම්බන්ධ ගුරු සංගම් වල නියෝජිතයන් සමඟ 2016.10.08 දින පැවැත්වුණි.
- 2016.11.21 දින අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සම්බන්ධ කර ගනිමින් තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුවත් කිරීමේ කමිටුවක් සංවිධානය කල අතර එක් එක් දෙපාර්තමේන්තු වලට අදාල තිරසර සංවර්ධන අරමුණු හඳුනාගැනීමත් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගත් පිළිබඳ මූලික සාකච්ඡාවක් පැවැත්විණි.
- තිරසර සංවර්ධන අභිමතාර්ථ අතරින් තිරසර සංවර්ධනය පිණිස සාගර, මුහුදු හා සාගර සම්පත් සංරක්ෂණය හා ධරණීය භාවිතය පිළිබඳ අභිමතාර්ථ සහ භෞමික පරිසර පද්ධති සම්බන්ධ 15 වන ඉලක්කය ශ්‍රී ලංකාව තුල සාක්ෂාත් කර ගැනීම සඳහා අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු වලට ඒවා අදාල කර ගත යුතු ආකාරය පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමඟ වැඩමුළුවක් 2016.12.04 දින පැලවත්ත CETRAC ආයතනයේ දී පැවැත්විණි.
- 2016. 12. 09 තිරසර සංවර්ධනය පිළිබඳ අරමුණු අතරින් 14 සහ 15 යන අරමුණු පිළිබඳ වැඩමුළුවක් වනජීවී දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව හා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් සමඟ පැලවත්ත CETRAC ආයතනයේ පැවැත්වූ අතර එම ආයතන වල සැලසුම් සකස් කිරිමේදී තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිම සහ එම සැලසුම් අදාල කර ගත යුතු ආකාරයන් පිළිබඳ අදාල සාකච්ඡාවන් සිදු විය.
- සංවර්ධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභාවල අදහස් විමසීම සිදුවෙමින් පවතින අතර එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු වර්තමානයේ සම්පාදනය වෙමින් පවති.

# මුදල් අංශය

## හැඳින්වීම

අමාත්‍යාංශයේ මුදල් අංශය ගෙවීම්, ප්‍රසම්පාදන, ගබඩා හා වත්කම් කළමනාකරණ, ගිණුම් වශයෙන් අංශ 4 කින් සමන්විත වේ. පාර්ලිමේන්තු මුල්‍ය පාලනය උත්තරදායි බව හා බැඳුණු තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස ඉටු කළ යුතු අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මුල්‍ය පාලන කාර්යභාරයට අවශ්‍ය සෘජු සහාය දැක්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය හා කර්තව්‍යයයි. ඒ අනුව අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මුල්‍ය පාලන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම හා ඊට අදාළ පාලන කටයුතු මෙම අංශය මඟින් ඉටුකරනු ලබයි.

වාර්ෂික අයවැය ලේඛනය හා විසර්ජන ගිණුමට අදාළ වන ආදායම් හා වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ඒවා මහා භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය කිරීම, වාර්ෂික මුදල් ප්‍රවාහ පාලනය, ප්‍රසම්පාදන කටයුතු, ගබඩා හා වත්කම් කළමනාකරණය, ගෙවීම් කටයුතු සංවිධානය හා ගෙවීම් කිරීම, කාලීන මුල්‍ය වාර්තා හා මුල්‍ය ප්‍රකාශන ඇතුළුව විසර්ජන ගිණුම පිළියෙල කිරීම සහ විගණකාධිපති හා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා සම්බන්ධ කටයුතු අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධයෙන් ක්‍රියා කිරීම මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

## කාර්යභාරය

- වාර්ෂික විසර්ජන පනතින් බලය ලැබූ වියදම් මුදල් රෙගුලාසි, අණපනත්, චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කරමින් කළමනාකරණය කිරීම.
- විගණකාධිපතිට හා මහා භාණ්ඩාගාරයට අවශ්‍ය මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම.
- විසර්ජන ගිණුම ඇතුළු අවසාන ගිණුම් සැකසීම හා ඉදිරිපත් කිරීම.
- ගබඩා හා වත්කම් කළමනාකරණය.
- වාර්ෂික වියදම් හා ආදායම් ඇස්තමේන්තු සැකසීම.
- අමාත්‍යාංශයට අදාළ වැටුප්, පොදු තැන්පත් ඇතුළු සියළුම මූලධන හා පුනරාවර්තන ගෙවීම් කටයුතු ඉටු කිරීම හා වියදම් කළමනාකරණය කිරීම.
- අමාත්‍යාංශයෙහි හා අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු හා ආයතනවල ප්‍රසම්පාදන කමිටු පත්කිරීම හා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කාර්යයන් ඉටු කිරීම හා අධීක්ෂණය.
- අමාත්‍යාංශයේ හානි හා පාඩු පිළිබඳ ගිණුම් කටයුතු හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල හානි හා පාඩු වාර්තා සැකසීම, වාර්තා කිරීම, සැසඳීම හා විගණකාධිපතිට ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශයට අදාළ රාජ්‍ය ගිණුම් කාරක සභා හා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා කටයුතු ඉටු කිරීම හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ගිණුම් කාරක සභා කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- අමාත්‍යාංශයෙහි මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල වාර්ෂික ගිණුම් හා වාර්තා අධීක්ෂණය.
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ´බී` ගිණුමෙන් ණය ගෙවීම, ඒවා නිසි පරිදි අයකර ගැනීම හා ඊට අදාළ ගිණුම් පවත්වා ගැනීම.
- විගණකාධිපතිගේ විගණන විමසුම් සම්බන්ධ අමාත්‍යාංශ කටයුතු.
- වාර්ෂික මුදල් ප්‍රවාහ කටයුතු, ප්‍රධාන අග්‍රිම, අතුරු අග්‍රිම අධීක්ෂණය හා පාලනය, ගිණුම් තැබීම හා වාර්තා කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අරමුදල් පාලන කටයුතු හා ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණමය කාර්යයන් ඉටු කිරීම සහ ඒවායේ අයවැය හා වාර්ෂික ගිණුම් පිළිබඳ කටයුතු.

**ශීර්ෂ - 161, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය**
**2016 වර්ෂයේ වියදම**
**වැඩසටහන-01මෙහෙයුම් ක්‍රියාකාරකම්**

| වැය විෂය | වැය විස්තරය | 2016 ඇස්තමේන්තුව | අතිරේක ප්‍රතිපාදන | මු.රෙ. 66 මාරු කිරීම් | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව | 2016.12.31 දිනට වියදම | ප්‍රතිපාදන ඉතිරිවීම් | ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | **124,650,000** | **51,574,500** | **(1,862,000)** | **174,362,500** | **166,308,927** | **8,053,573** | **95** |
| 1001 | වැටුප් හා දීමනා | 34,500,000 | 4,247,000 | (2,956,000) | 35,791,000 | 35,720,351 | 70,649 | 100 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 5,750,000 | 0 | (800,000) | 4,950,000 | 4,483,943 | 466,057 | 91 |
| 1003 | වෙනත් දීමනා | 31,800,000 | 2,112,000 | (3,075,015) | 30,836,985 | 29,320,271 | 1,516,714 | 95 |
| 1101 | දේශීය ගමන් වියදම් | 2,000,000 | 0 | (244,500) | 1,755,500 | 1,676,276 | 79,224 | 95 |
| 1102 | විදේශීය ගමන් වියදම් | 2,000,000 | 0 | 1,006,000 | 3,006,000 | 2,831,659 | 174,341 | 94 |
| 1201 | ලිපි ද්‍රව්‍ය | 3,500,000 | 0 | 342,000 | 3,842,000 | 3,832,110 | 9,890 | 100 |
| 1202 | ඉන්ධන | 11,000,000 | 550,500 | 1,549,000 | 13,099,500 | 11,373,115 | 1,726,385 | 87 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 350,000 | 0 | 800,000 | 1,150,000 | 980,956 | 169,044 | 85 |
| 1205 | වෙනත් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 1301 | වාහන | 5,500,000 | 2,000,000 | 2,564,000 | 10,064,000 | 9,960,734 | 103,266 | 99 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,100,000 | 150,000 | 103,500 | 1,353,500 | 1,339,875 | 13,625 | 99 |
| 1303 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | 1,200,000 | 0 | (885,000) | 315,000 | 286,201 | 28,799 | 91 |
| 1401 | ප්‍රවාහන | 2,800,000 | 0 | 2,900,000 | 5,700,000 | 4,696,433 | 1,003,567 | 82 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 3,600,000 | 465,000 | (645,000) | 3,420,000 | 3,417,122 | 2,878 | 100 |
| 1403 | විදුලිය හා ජලය | 2,900,000 | 0 | (2,730,000) | 170,000 | 154,668 | 15,332 | 91 |
| 1404 | කුලී හා දේශීය බදු | 12,000,000 | 42,050,000 | 0 | 54,050,000 | 51,407,303 | 2,642,697 | 95 |
| 1405 | වෙනත් | 4,500,000 | 0 | 34,000 | 4,534,000 | 4,502,899 | 31,101 | 99 |
| 1506 | රජයේ නිලධාරීන්ගේ | 150,000 | 0 | 175,015 | 325,015 | 325,012 | 3 | 100 |
| | එකතුව | **16,350,000** | **81,963,000** | **1,862,000** | **100,175,000** | **57,109,699** | **43,065,301** | **57** |
| 2001 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | 1,200,000 | 0 | 162,000 | 1,362,000 | 1,361,350 | 651 | 100 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 850,000 | 0 | 0 | 850,000 | 472,236 | 377,764 | 56 |
| 2003 | වාහන | 4,500,000 | 763,000 | 600,000 | 5,863,000 | 5,453,648 | 409,352 | 93 |
| 2101 | වාහන | 0 | 70,000,000 | 0 | 70,000,000 | 31,386,502 | 38,613,498 | 45 |
| 2102 | ලී බඩු හා කාර්යාල උපකරණ | 2,000,000 | 0 | 511,000 | 2,511,000 | 2,508,963 | 2,037 | 100 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,800,000 | 0 | (300,000) | 1,500,000 | 1,429,810 | 70,190 | 95 |
| 2104 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2401 | කාර්යය මණ්ඩල පුහුණු | 1,000,000 | 0 | (111,000) | 889,000 | 836,650 | 52,350 | 94 |
| 2502 | ආයෝජන | 5,000,000 | 11,200,000 | 1,000,000 | 17,200,000 | 13,660,540 | 3,539,460 | 79 |
| | එකතුව | **141,000,000** | **133,537,500** | **0** | **274,537,500** | **223,418,626** | **51,118,874** | **81** |

*අයවැය චක්‍රලේඛ 07/2015 අනුව,වැය විෂය 1202 යටතේ ඉන්ධන සඳහා 15%ක් ද වැය විෂය 1401 යටතේ ප්‍රවාහනය වෙනුවෙන් 10% ක් ද ඉතිරියක් සිදුකර තිබේ.

# අභ්‍යන්තර විගණන අංශය

## හැඳින්වීම

මුදල් රෙගුලාසි 133 හි දැක්වෙන අභ්‍යන්තර විගණන පරමාර්ථ ඉටුවන පරිදි ස්ථාපිත කර ඇති අභ්‍යන්තර විගණන අංශය අමාත්‍යාංශයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පිළිබඳව ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රම වල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඇගයීම සඳහා නිරන්තර සෝදිසි පරීක්ෂණ සිදු කරනු ලැබේ. වාර්ෂික විගණන සැලැස්ම පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු හා විශේෂ විමර්ශන කටයුතු ඉටුකරන අතරම අමාත්‍යාංශය යටතට ගැනෙන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙනුවෙන් විශේෂ පරීක්ෂණ කටයුතු මෙහෙය වීමද සිදුකරනු ලැබේ.

## කාර්යභාරය

- අමාත්‍යාංශයේ මුදල් කටයුතු පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමය පරීක්ෂා කර වැරදි හා වංචා වැළැක්වීම සඳහා අමාත්‍යාංශ තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය නිරන්තර සමීක්ෂණය කිරීම ස්වාධීන ඇගයීමක් පවත්වා ගෙන යාම.

- ගිණුම් සහ වෙනත් වාර්තා වල විශ්වාසනීයභාවය නිශ්චය කිරීම සහ යොදා ගෙන ඇති ගිණුම් පිළිවෙත මඟින් නිවැරදි මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.

- කාර්යය මණ්ඩලයට පවරා දී ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්යය සාධනයෙහි ගුණාත්මකභාවය ඇගයීම.

- අමාත්‍යාංශයේ වත්කම් , සියලුම ආකාරයේ අලාභ හානිවලින් කොතරම් දුරට ආරක්ෂා කර ඇත්දැයි සොයාබැලීම.

- රජයේ ආයතන සංග්‍රහය , රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ විසින් සහ භාණ්ඩාගාර විසින් වරින්වර නිකුත් කර ඇති වෙනත් පරිපූරක උපදෙස්ද පිලිපැද තිබේදැයි සොයා බැලීම.

- නාස්තිය සහ පමණ ඉක්මවා කෙරෙන වියදම් වැළැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට තෝරා ගනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.

- අමාත්‍යාංශයේ ගිණුම් පටිපාටිය සහ කිසියම් මුදල් වැය වීමකට තුඩුදෙන එකී මෙහෙයුම් පරීක්ෂා කිරීම සහ අමාත්‍යාංශයේ දේපල හා වත්කම් ආරක්ෂාකාරී ලෙස අරපිරිමැස්මෙන් යුතුව විධිමත් ලෙස පරිහරණය කරන්නේ දැයි සොයා බැලීම.

- අමාත්‍යාංශය සඳහා විගණන කළමනාකරණ කමිටු පැවැත්වීම.

- අවශ්‍ය අවස්ථා වලදී විශේෂ විමර්ෂණ පැවැත්වීම.

## 2016.12.31 දිනට ප්‍රගතිය

### අභ්‍යන්තර විගණන විමසුම්

1.තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය - 07
2.ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - 04

### මූලික විමර්ශන

| කාර්තුව | ආයතනය | ඉටු කල කාර්යය |
|---|---|---|
| පළමුවන | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව භාරයේ සිටි අලියකු නවසීලන්තයේ ඕක්ලන්ඩ් සත්වෝද්‍යානයට ලබාදීම පිළිබඳව පරීක්ෂා කිරීම. |
| දෙවන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | යාල ජාතික උද්‍යානයේ ප්‍රවේශ පත්‍ර නිකුත් කරන කාර්යාලයට සොරුන් ඇතුලුවීම සහ භාණ්ඩ සොරා ගෙනයාම සම්බන්ධව පරීක්ෂා කිරීම. |

### විශේෂ පරීක්ෂණ

| කාර්තුව | ආයතනය | ඉටු කල කාර්යය |
|---|---|---|
| පළමුවන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ඒකපුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු. |
| දෙවන | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආපන ශාලාව හා වෙළඳ කුටි බදු දීම පිළිබඳව පරීක්ෂා කිරීම. |
| තුන්වන | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | හම්බන්තොට වියලි කලාපීය උද්භිද උද්‍යානය සම්බන්ධ පරීක්ෂා කිරීම. |

### පරීක්ෂණ

| කාර්තුව | ආයතනය | ඉටු කල කාර්යය |
|---|---|---|
| තුන්වන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | දක්ෂිණ අධිවේගී මාර්ගයට පස් හා බොරළු සැපයීමට අදාල නිර්දේශ ලබාගැනීමේදී අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ නිලධාරීන් කිහිපදෙනෙකු විසින් අවශ්‍ය නිර්දේශ හිතාමතාම ලබානොදීම හේතුවෙන් සිදුවූ අසාධාරණයට එරෙහිව කරනු ලැබූ අභියාචනය පිළිබඳව පරීක්ෂා කිරීම. |
| තුන්වන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | පෞද්ගලික ඉඩමේ රබර් වගාව සඳහා අවහිර වන නැදුන් ගස් කපා ඉවත් කිරීමට ලැබී ඇති අවසරය ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදීම සම්බන්ධව පරීක්ෂා කිරීම. |
| හතරවන | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | හම්බන්තොට සෆාරි උද්‍යානයේ ආසියානු කලාපයේ පාර, බොරළු දමා බෝක්කු සහ සපත්තු පාලම් යොදා සැකසීම සම්බන්ධයෙන් මු.රෙ.115 යටතේ අනුමැතිය ලබාදීම පරීක්ෂාව. |

### විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

රැස්වීම් -04 (2016 මාර්තු, ජූලි, සැප්තැම්බර්, සහ දෙසැම්බර් යන මාස වල පවත්වන ලදී.)

# නීති අංශය

## කාර්යභාරය

- තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සම්බන්ධව අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු නීති කටයුතු ඉටු කිරීම.

- 1937 අංක 02 දරණ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත (469 වන අධිකාරිය),1982 අංක 41 දරණ ජාතික සත්වෝද්‍යාන පනත හා 1928 අංක 31 දරණ ජාතික උද්භිද උද්‍යාන පනත යන පනත් සඳහා අවශ්‍ය වන්නා වූ රෙගුලාසි, නියෝග සහ සංශෝධන සකස් කිරීම සඳහා සහය ලබා දීම සහ එම සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් පවත්නා නඩු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කටයුතු කිරීම, නීතිපති දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන උපදේශනාත්මක සාකච්ඡාවට සහභාගී වීම සහ අවශ්‍ය නිරීක්ෂණ සකස්කර ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු වල ප්‍රමාද වී පවත්නා නීති කටයුතු කඩිනමින් නිම කිරීමට සහය ලබා දීම.

- එමෙන්ම අමාත්‍යාංශයට එරෙහිව හා අමාත්‍යාංශය වෙනුවෙන්ද අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු තුනෙහි නඩු, ගිවිසුම්, අධිකරණ කටයුතු වලට අදාල අනෙකුත් සියලු නඩු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව



## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවට ඉතා විශාල ජෛව විවිධත්වයක් උරුම වී තිබෙන ශාක සහ සත්ත්ව ප්‍රජාවන්ගෙන් ගහණ වූ පරිසර පද්ධතීන් ආරක්ෂා කරගැනීමෙහි මූලික වගකීම පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වේ. 1949 වර්ෂයේ දී ආරම්භ කරන ලද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි මූලික කාර්යයභාරය වන්නේ ශ්‍රී ලංකාව තුළ වනජීවී සම්පත් සංරක්ෂණය කිරීමයි. ඒ අනුව ශ්‍රී ලංකාවෙහි සියලුම ප්‍රධාන ගංගාවන්ගේ මූලාශ්‍රයන් මෙන්ම කෘෂිකර්මාන්තය හා විදුලිය ජනනය සඳහා ජලය සපයන මහා පරිමාණ ජලාශයන් ඇතුළු ජලාශ 40 ක පෝෂක ප්‍රදේශයන් ආරක්ෂාව ලබන්නේ වනජීවී රක්ෂිත ජාලය තුළ ය. දිවයිනෙහි මුලු බිම් ප්‍රමාණයෙන් 13%ක් ඉක්මවන එම වනජීවී රක්ෂිත ජාලය කළමනාකරණය කිරීමෙහි වගකීම දරන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි.එම වනජීවී රක්ෂිත ජාලය විවිධ සංරක්ෂණ මට්ටම් යටතේ ප්‍රකාශයට පත් කරන ලද වනජීවී රක්ෂිත වලින් සමන්විතය.

## 1.1. දැක්ම

වර්තමාන හා ඉදිරි පරම්පරාවන් උදෙසා වනජීවී සම්පත් දිගුකාලීනව සංරක්‍ෂණය කිරීම වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ දැක්ම වෙයි.

## 1.2. මෙහෙවර

සියල්ලන් හා එක්ව වෘත්තීමය කළමනාකරණයක් මඟින් වනජීවී සම්පත්වල සංරක්‍ෂණය සහතික කිරීම වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත මෙහෙවර වන්නේය.

## 1.3. කාර්යභාරය

ඉහත සඳහන් මෙහෙවර ඉටු කිරීම සඳහා වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව සතු පැවරුම් බලය පහත ආකාරයෙන් දැක්විය හැකිය.

- සියලුම භූගෝලීය, දේශගුණික හා ජෛව කලාප තුළ වනජීවී සම්පත්වල ප්‍රමාණවත් නියැදි ආවරණය වන පරිදි ශ්‍රී ලංකාවේ වනජීවී රක්‍ෂිත ජාලය ස්ථාපිත කිරීම මඟින් ඒවායේ දිගුකාලීන පැවැත්ම තහවුරු කිරීම.
- කෘෂිකර්මාන්තය හා ජල විදුලිය නිපදවීම සඳහා ජලය සපයන මහා පරිමාණ ජලාශයන්ගේ ජලපෝෂක ප්‍රදේශ ආරක්‍ෂා කර ගැනීම, ආගමික හා සංස්කෘතික උරුමයන් ආරක්‍ෂා කරගැනීම, ආවේණික හා දුලබ වනජීවී විශේෂයන් ආරක්‍ෂාකර ගැනීම, සුවිශේෂී පරිසර පද්ධතීන් ආරක්‍ෂා කරගැනීම වැනි විශේෂිත අරමුණු ඇති වනජීවී රක්‍ෂිත ප්‍රකාශයට පත් කර වනජීවී රක්‍ෂිත ජාලය තුළ නිසි ලෙස කළමනාකරණය කිරීම.
- අලින් වැනි වඳවීමේ තර්ජනයට ලක්ව සිටින දේශීය වනජීවී විශේෂයන් සංරක්‍ෂණය සඳහා සුදුසු ක්‍රමවේදයන් භාවිත කරමින් විශේෂ ව්‍යාපෘතීන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම මඟින් එම විශේෂයන් ගේ දිගු කාලීන පැවැත්ම සහතික කිරීම.
- වනජීවී රක්‍ෂිතවලින් බැහැර ප්‍රදේශවල ආරක්‍ෂිත වනජීවී විශේෂයන් ගේ ආරක්‍ෂාව තහවුරු කිරීම.
- තත්කාලීනව බලපවත්නා ජාතික වනජීවී ප්‍රතිපත්තිය හා නීතිය ඵලදායීව ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා රජය විසින් අත්සන් තබා ඇති වනජීවී සංරක්‍ෂණය හා අදාල වඳවීමේ තර්ජනයට ලක් වූ විශේෂයන්ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES), ජාත්‍යන්තර වැදගත්කමක් ඇති තෙත් බිම් පිළිබඳ සම්මුතිය (Ramsar) හා සංක්‍රමණික වනසත්ත්ව විශේෂයන් ගේ සංරක්‍ෂණය පිළිබඳ සම්මුතිය (CMS - Bonn) යන ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ලත් අධිකාරි බලය අනුව කටයුතු කිරීම.

- වනජීවී රක්ෂිත ආශ්‍රිතව පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය මඟින් ජාතික ආර්ථිකයට එයින් ලබාදෙන දායකත්වය ප්‍රශස්ථ තලයක පවත්වා ගැනීම.
- වනජීවී සම්පත්වල සංරක්ෂණය හා විද්‍යාත්මක කළමනාකරණයක් සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු රැස්කර ගැනීමට පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය.
- ස්වභාව සම්පත් සංරක්ෂණය පරමාර්ථය කොටගත් වෙනත් ආයතන සමඟ අන්‍යෝන්‍ය අවබෝධය හා සහයෝගය වර්ධනය කර ගනිමින් සංරක්ෂණ ක්‍රියාදාමය ශක්තිමත් කර ගැනීම.
- සාමාන්‍ය මහජනතාව, රාජ්‍ය නිලධාරීන් හා වෙනත් කණ්ඩායම් අතර වනජීවී සංරක්ෂණය ව්‍යාප්ත කිරීමෙන් ඔවුන්ගේ දායකත්වය ඊට නොඅඩුව ලබා ගැනීම ඉලක්ක කර ගත් වනජීවී සංරක්ෂණ අධ්‍යාපනික වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම.
- වනජීවී රක්ෂිත තුළ ස්වභාව සම්පත් මත ඒ අවට පදිංචි ජනතාව ගේ යැපීම අවම කර ගැනිම ඉලක්ක කොටගත් සමාජ ආර්ථික සංවර්ධන වැඩ සටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.












## 2. ජාතික උද්‍යාන සඳහා සංචාරක පැමිණීම සහ ආදායම 2016


### 2.1. සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම - 2016

| මාසය | පැමිණීම | | | ආදායම (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | වෙනත් | එකතුව |
| ජනවාරි | 92,318 | 64,316 | 156,634 | 4.43 | 130.73 | 51.69 | **186.85** |
| පෙබරවාරි | 106,412 | 86,381 | 192,793 | 4.98 | 157.80 | 62.31 | **225.09** |
| මාර්තු | 104,542 | 72,659 | 177,201 | 4.46 | 134.09 | 50.94 | **189.49** |
| අප්‍රේල් | 138,102 | 56,578 | 194,680 | 6.67 | 106.14 | 15.42 | **128.23** |
| මැයි | 52,971 | 25,405 | 78,376 | 2.53 | 47.94 | 24.72 | **75.19** |
| ජූනි | 52,735 | 24,030 | 76,765 | 9.27 | 44.32 | 29.90 | **83.49** |
| ජූලි | 110,901 | 87,712 | 198,613 | 5.51 | 162.78 | 74.34 | **242.63** |
| අගෝස්තු | 211,409 | 117,156 | 328,565 | 10.45 | 210.67 | 88.01 | **309.13** |
| සැප්තැම්බර් | 88,514 | 57,699 | 146,213 | 5.92 | 102.86 | 45.44 | **154.22** |
| ඔක්තෝම්බර් | 167,637 | 54,074 | 221,711 | 4.17 | 96.41 | 42.87 | **143.45** |
| නොවැම්බර් | 73,669 | 59,353 | 133,022 | 3.70 | 109.95 | 54.61 | **168.26** |
| දෙසැම්බර් | 206,903 | 77,840 | 284,743 | 7.91 | 142.23 | 79.54 | **229.68** |
| එකතුව | **1,406,113** | **783,203** | **2,189,316** | **70.00** | **1445.92** | **619.76** | **2135.71** |

### 2.2. ප්‍රස්ථාර සටහන - 2016 වසරේ සංචාරකයින්ගේ පැමිණීම




### 2.3. ප්‍රස්ථාර සටහන - 2016 වසරේ සංචාරකයින්ගෙන් ලද ආදායම



## 2.4. ජාතික උද්‍යාන සඳහා සංචාරක පැමිණීම සහ ආදායම


| ජාතික උද්‍යානය | සංචාරක පැමිණීම | | | ආදායම (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | වෙනත් | එකතුව |
| යාල | 385,442 | 272,835 | **658,277** | 15.80 | 570.47 | 198.41 | **784.68** |
| හෝටන් තැන්න | 319,999 | 131,670 | **451,669** | 19.77 | 267.82 | 116.08 | **403.68** |
| උඩවලව | 153,086 | 127,791 | **280,877** | 8.93 | 259.33 | 103.99 | **372.25** |
| වස්ගමුව | 27,532 | 1,253 | **28,785** | 1.03 | 1.70 | 5.39 | **8.13** |
| මින්නේරිය | 83,319 | 76,629 | **159,948** | 11.64 | 159.08 | 56.27 | **226.99** |
| බුන්දල | 9,975 | 9,853 | **19,828** | 0.40 | 13.07 | 7.03 | **20.50** |
| හොරගොල්ල | 5,613 | 16 | **5,629** | 0.18 | 0.02 | 0.05 | **0.25** |
| කවුඩුල්ල | 39,401 | 37,004 | **76,405** | 1.54 | 47.28 | 30.55 | **79.37** |
| ලුණුගම්වෙහෙර | 17,763 | 13,824 | **31,587** | 0.71 | 16.73 | 12.95 | **30.39** |
| ගල්ඔය | 10,835 | 2,072 | **12,907** | 0.37 | 1.00 | 6.27 | **7.64** |
| කුමන | 27,790 | 6,431 | **34,221** | 1.03 | 8.76 | 9.32 | **19.12** |
| අංගම්මැඩිල්ල | 3,290 | 1 | **3,291** | 0.14 | 0.00 | 0.44 | **0.58** |
| ගැල්වේස්ලෑන්ඩ් | 3,345 | 198 | **3,543** | 0.12 | 0.27 | 0.05 | **0.45** |
| විල්පත්තු | 38,663 | 16,578 | **55,241** | 2.03 | 33.67 | 50.14 | **85.84** |
| මදුරුඔය | 866 | 119 | **985** | 0.04 | 0.16 | 0.69 | **0.89** |
| ලාහුගල | 499 | 22 | **521** | 0.02 | 0.03 | 0.06 | **0.11** |
| පරෙවි දූපත් | 76,288 | 25,862 | **102,150** | 3.02 | 35.21 | 17.74 | **55.97** |
| හික්කඩුව | 25,922 | 3,020 | **28,942** | 0.12 | 0.09 | 0.00 | **0.22** |
| උඩවලව ඇත් අතුරු සෙවන | 161,111 | 52,594 | **213,705** | 2.81 | 25.70 | 1.88 | **30.39** |
| වැලිපර අභයභූමිය | 15,370 | 5,431 | **20,801** | 0.30 | 5.56 | 1.24 | **7.11** |
| කලාවැව | 4 | 0 | **4** | 0.00 | 0.00 | 0.17 | **0.17** |
| කතරගම කාර්යය මණ්ඩල සංචාරක නිවාසය | | | | | | 0.06 | **0.06** |
| වුණ්ඩිකුලම් සංචාරක නිවාසය | | | | | | 0.39 | **0.39** |
| මහකනදරාව සංචාරක නිවාසය | | | | | | 0.21 | **0.21** |
| මිහින්තලේ සංචාරක නිවාසය | | | | | | 0.03 | **0.03** |
| රිටිගල දැඩි රක්ෂිතය | | | | | | 0.03 | **0.03** |
| ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය | | | | | | 0.27 | **0.27** |
| **එකතුව** | **1,406,113** | **783,203** | **2,189,316** | **70.02** | **1,445.96** | **619.73** | **2,135.71** |


## 2.5. 2015 සහ 2016 අතර සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම

| මාසය | පැමිණීම | | ආදායම (රු.මි.) | |
|---|---|---|---|---|
| | **2015** | **2016** | **2015** | **2016** |
| ජනවාරි | 101,406 | 156,634 | 127.36 | 186.85 |
| පෙබරවාරි | 157,839 | 192,793 | 166.29 | 225.09 |
| මාර්තු | 127,808 | 177,201 | 132.70 | 189.49 |
| අප්‍රේල් | 159,387 | 194,680 | 104.32 | 128.23 |
| මැයි | 96,044 | 78,376 | 60.00 | 75.20 |
| ජුනි | 88,009 | 76,765 | 67.90 | 83.49 |
| ජූලි | 169,617 | 198,613 | 181.52 | 242.63 |
| අගෝස්තු | 267,273 | 328,565 | 231.77 | 309.13 |
| සැප්තැම්බර් | 143,291 | 146,213 | 125.68 | 154.22 |
| ඔක්තෝම්බර් | 113,742 | 221711 | 109.2 | 143.45 |
| නොවැම්බර් | 99,130 | 133022 | 125.33 | 168.26 |
| දෙසැම්බර් | 208,062 | 284743 | 153.10 | 229.68 |
| **එකතුව** | **1,731,608** | **2,189,316** | **1,585.17** | **2,135.71** |

## 2.6. 2010 වසරේ සිට 2016 වසර දක්වා සංචාරක පැමිණීම (දේශීය /විදේශීය) සහ ආදායම

| වර්ෂය | පැමිණීම | ආදායම (රු.මි.) |
|---|---|---|
| **2010** | 758,783 | 406.85 |
| **2011** | 955,170 | 545.63 |
| **2012** | 1,033,763 | 708.06 |
| **2013** | 1,185,884 | 915.93 |
| **2014** | 1,402,834 | 1,235.47 |
| **2015** | 1,731,608 | 1,585.04 |
| **2016** | 2,189,316 | 2,135.71 |



## 3. සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

### 3.1. රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපනය කිරීම


මින්නේරිය ජාතික උද්‍යානය

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 1.00
- රු.මි. 0.57*

වියදම - රු.මි. 0.57

**භෞතික ප්‍රගතිය**

- රක්ෂිත ප්‍රදේශවල මැනුම් කටයුතු වෙනුවෙන් මායිම් පිළිබඳ ගැටළු විසඳීම සඳහා විවිධ ගෙවීම් කර ඇත.


යාල ජාතික උද්‍යානය

### 3.2. පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 8.00
- රු.මි. 11.31*

වියදම - රු.මි. 11.30

**භෞතික ප්‍රගතිය**

- යාල සහ හෝටන්තැන්න ජාතික උද්‍යානවල පරිගණක ජාල ගත ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය වැඩි දියුණු කරන ලදී.
- මින්නේරිය ජාතික උද්‍යානයේ රඹවිල නැරඹුම් ස්ථානය අළුත්වැඩියා කිරීම, සංචාරකයින්ට ගිමන් හැරීමේ ස්ථානයක් සැකසීම සහ මින්නේරිය ජාතික උද්‍යානයේ ප්‍රවේශ පත්‍ර පරීක්ෂා කරන ස්ථානයේ අලුත්වැඩියාව සම්පූර්ණ කරන ලදී.
- විල්පත්තුව ජාතික උද්‍යානයේ සංචාරක බංගලාවල සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කිරීම සහ කඳවුරු බිමක් ඉදි කිරීම කරන ලදී.
- රන්දෙණිගල වනජීවී සංචාරක නිවාසය, ගල්ඔය ජා.උ. සංචාරක නිවාස 02 ක් සහ යාල ජාතික උද්‍යානයේ සංචාරක නිවාස 03 ක අළුත්වැඩියාවන් සාර්ථකව සිදු කරන ලදී.
- කුමන ජාතික උද්‍යානයේ උද්‍යාන මූලස්ථානය අසල සංචාරකයින්ට ගිමන් හැරීමේ ස්ථානයක් සකස් කිරීම සහ කුමණ ජාතික උද්‍යානයේ ප්‍රධාන මාර්ගයේ දිශාවන් දක්වන පුවරු 12 සවි කිරීම සාර්ථකව සිදු කරන ලදී.
- විල්පත්තුව ජාතික උද්‍යානයේ සංචාරක නිවාස සඳහා සන්නිවේදන පහසුකම් සැපයීමේ කටයුතු සිදු කරන ලදී.

### 3.3. ජනවිඥුම්කරණ කටයුතු සංවර්ධනය

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 4.00
- රු.මි. 3.08 *

වියදම - රු. මි. 3.08

**භෞතික ප්‍රගතිය**

- සමණල අඩවිය බුන්දල සහ ගැල්වේස්ලැන්ඩ් ජාතික උද්‍යාන අවට ජනතාවගේ සහභාගිත්වයෙන් ශ්‍රමදාන වැඩසටහන් 08 ක් පවත්වන ලදී.
- වනජීවී රක්ෂිත අවට ප්‍රජා මූල සංවිධානයන්හී ප්‍රගති සමාලෝචනය, ක්ෂුද්‍ර සැලසුම් සකස් කිරීම සහ ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන් ඇතුළුව වනජීවී සංරක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 22 ක් පවත්වන ලදී.
- රක්ෂිතය අවට ජනතාව සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු සහ කුසලතා සංවර්ධන වැඩසටහන් 19 ක් (මී මැසි පාලනය සහ අත්කම් පහුණුව) සාර්ථකව පවත්වන ලදී.
- වස්ගමුව ජාතික උද්‍යානය සහ සමනල අඩවිය අවට දෙහි පැල /කිතුල් සහ ගොරකා පැල යොදා ගෙන ජීව වැට කි.මී. 7 ක් දීර්ඝ කිරීම සිදු කර ඇත.

*ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

## 3.4. තර්ජනයට ලක් වූ විශේෂ සංරක්ෂණය

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි.3.00
- රු.මි.5.43*

වියදම - රු.මි.5.43

**භෞතික ප්‍රගතිය**



වනජීවින්ට ප්‍රතිකාර කිරිම

- සතුන්ට ප්‍රතිකාර සහ සායන කටයුතු සඳහා කැප්චර් ගන් 05, ඩෑන් ඉන්ජෙක්ටර් සහ ජබ් ස්ටික් 10 ක් මිල දී ගන්නා ලදී.
- පණ්ඩුලගම පශු වෛද්‍ය ඒකකය සඳහා අලි පැටවුන් රඳවා තබා ගැනීම ආරක්ෂිත රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදි කර ඇත.



උඩවලව ඇත් අතුරු සෙවන

## 3.5. තොරතුරු සන්නිවේදන පද්ධති වැඩිදියුණු කිරීම

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 6.00
- රු. මි. 7.87*

වියදම - රු. මි. 7.87

**භෞතික ප්‍රගතිය**

- ප්‍රධාන කාර්යාලය සහ ක්ෂේත්‍ර කාර්යාවල ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියේ සහ පරිගණක ගත තොරතුරු සන්නිවේදන පද්ධතිවල නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවති.
- WILD LANKA පර්යේෂණ සඟරාවේ පළවෙනි සහ දෙවනි කලාප මුද්‍රණය කරන ලද අතර ඒ සඳහා පර්යේෂණ සමුළුවක් සාර්ථකව පවත්වන ලදී.
- ගමන් කථන යන්ත්‍ර සඳහා බැටරි 30 ක්, යගී ඇන්ටනා 22 ක් සහ චාජර් 20 ක් මිල දී ගන්නා ලදී.
- යාල ජාතික උද්‍යානයේ පරිගණක ගත ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා කියොස් යන්ත්‍ර 03 ක් මිල දී ගන්නා ලදී.
- වනදිවි තෙත්බිම් අත්පත්‍රිකාවේ පිටපත් 1000ක් මුද්‍රණය කරන ලදී
- පරිගණක 125 ක් සඳහා UPS 125 ක් මිල දී ගැනීම මල්ටිමීඩියා 01 ක් සහ යාල ජාතික උද්‍යානය සඳහා CCTV කැමරා පද්ධතියක් මිල දී ගන්නා ලදී.



ගුවන් විදුලි සන්නිවේදන ජාලය නඩත්තු කිරිම

## 3.6. රක්ෂිත ප්‍රදේශවල ජල ප්‍රභවයන් වැඩිදියුණු කිරීම

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 1.00
- රු.මි. 0.71 *

වියදම - රු.මි. 0.71

**භෞතික ප්‍රගතිය**

- උඩවලව ජාතික උද්‍යානයේ සීනුග්ගල වැව් ප්‍රතිසංස්කරණය සිදු කරන ලදී.

*ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

## 3.7. ගොඩනැගිලි ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 29.27
- රු.මි. 33.00*

වියදම - රු. මි. 21.11

**භෞතික ප්‍රගතිය**

- රක්ෂිත ප්‍රදේශවල නිලධාරීන්ගේ පරිපාලන කටයුතු පහසුකිරීම සඳහා පරිපාලන ගොඩනැගිලි 20 ක් නිල නිවාස 06 ක් ප්‍රතිසංස්කරණය කිරීම අවසන් කර ඇත.
- විදුලි සම්බන්ධතා 09 ක් සහ ජල සැපයුම් පද්ධති 02 ක් වැඩි දියුණු කරන ලදී.
- වැසිකිළි පද්ධති 02 ක් වැඩි දියුණු කරන ලදී.
- ලුණුගම්වෙහෙර පශුවෛද්‍ය නිල නිවස හා කාර්යාලය ඉදි කිරීම සම්පූර්ණ කරන ලදී.

## 3.8. ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු. මි.4.80
- රු. මි.9.60*

වියදම - රු. මි.9.31

**භෞතික ප්‍රගතිය**

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට, කලාප කාර්යාලවලට කාර්යාලයීය උපකරණ සහ වනජීවී සංචාරක බංගලා සඳහා ගෘහ භාණ්ඩ මිල දී ගැනීම සිදු කර අවසන් කර ඇත. අනෙකුත් කාර්යාලීය උපකරණ මිල දී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.



වනජීවී සංචාරක නිවාසය සඳහා මිල දී ගත් ගෘහ භාණ්ඩ

## 3.9. යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 2.80
- රු. මි.4.00*

වියදම - රු.මි. 3.56

**භෞතික ප්‍රගතිය**

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාලවලට ජෙනරේටර් 02 ක් මිළදී ගන්නා ලදී.
- වනජීවී ක්ෂේත්‍ර කාර්යාල සඳහා වතුර මෝටර් 16 ක් යාන්ත්‍රික කියත් 06 ක් මිල දී ගන්නා ලදී.
- මීට අමතරව යන්ත්‍රෝපකරණවල අළුත්වැඩියාවන් සිදු කරමින් පවතී.

*ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

## 3.10. වාහන අළුත්වැඩියාව

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 7
වියදම - රු.මි.5.58

**භෞතික ප්‍රගතිය**

- දෙපාර්තමේන්තුවේ සහ ක්ෂේත්‍ර කාර්යාලවල වාහන 08 අළුත්වැඩියා කර ඇති අතර අනෙකුත් අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී.

## 3.11. පුහුණු හා පර්යේෂණ කටයුතු

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි.1.50
- රු.මි.0.62*
වියදම - රු.මි. 0.62

**භෞතික ප්‍රගතිය**

- පර්යේෂණ කමිටු 02 ක් පවත්වා ඇති අතර එහිදි කමිටු සාමාජිකයන් විසින් නිර්දේශ කර බාහිර පර්යේෂකයන්ගේ පර්යේෂණ ව්‍යපෘති සඳහා අනුමැතිය මේ වනවිට ලබා දී ඇත.
- දෙපාර්තමේන්තු පර්යේෂණ සම්මන්ත්‍රණ 01 ක් පවත්වන ලදී.
- දෙපාර්තමේන්තු පර්යේෂණ 08 ක් සිදු කරන ලදී.
- පක්ෂීන්ට මුදු පැළඳවීමේ ජාතික වැඩසටහනේ සැසි 04 ක් බුන්දල ජාතික උද්‍යානයේ දී පවත්වා අවසන් කර ඇත.



වනජීවී නිලධාරීන් පර්යේෂණවල නියැලෙමින්

## 3.12 සංරක්ෂණ අධ්‍යයනය හා විවරණ හා පුහුණු කටයුතු

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 5.89
- රු.මි. 7.18 *
වියදම - රු.මි. 7.14

**භෞතික ප්‍රගතිය**

- ලෝක පරිසර දිනය, ජෛව විවිධත්ව දිනය, තෙත් බිම් දින සැමරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 21 ක් වනජීවී කලාප 12 ක් ආවරණය වන පරිදි පැවත්වීය.
- පොසොන් සහ ඇසළ උත්සව වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් වනජීවී කලාප 03 ක් ආවරණය වන පරිදි පැවත්වීය.

*ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

- පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 31 ක් රාජ්‍ය නිලධාරීන් ඇතුළුව මහජනතාව දැනුවත් කිරිමේ වැඩසටහන් 20 ක් පවත්වා අවසන් කර ඇත.
- සියළු වනජීවී කලාප ආවරණය වන පරිදි ප්‍රදර්ශන වැඩසටහන් 10 ක් පැවත්වීය.
- දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරීන් සඳහා කළමනාකරණ පුහුණුව (නිලධාරීන් 45 ක්), පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන ( නිලධාරින් 40 ක්), කම්කරුවන් සඳහා කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන (නිලධාරීන් 26 ක්), දෙමල භාෂා පුහුණු වැඩසටහන් 2 ක් (නිලධාරීන් 87 ක්), ආකල්ප හා කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන ( නිලධාරීන් 15 ක්), ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ගිණි අවි පුහුණුව (නිලධාරීන් 30 ක්), සහ දෙපාර්තමේන්තු සංවර්ධන නිලධාරීන් (නිලධාරීන් 21 ක්) සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඇත. මීට අමතරව විවිධ පුහුණු වැඩසටහන් 03 ක් සඳහා නිලධාරීන් සහභාගි කරවා ඇත.
- වනන්තරේ කතන්දරේ වැඩසටහන් 01 ක් ශුවන් විදුලි සංස්ථාව මඟින් ප්‍රචාරය කරන ලද අතර දිණමිණ පුවත්පතේ අතිරේක කලාපයක් ලෙස පලවන වනදිවිය නම් පුවත්පතේ කලාප 06 ක් මුද්‍රණය කර නිකුත් කරන ලදී. මීට අමතරව දෙපාර්තමේන්තු පුවත්පත වන “අපේ විත්ති” කාණ්ඩ 02 ක් එළි දක්වන ලදී.
- වනජීවී සඟරාවේ පිටපත් 2500 ක් මුද්‍රණය කරන ලද අතර වීඩියෝ වැඩසටහන් 01 ක් නිෂ්පාදනය කරන ලදී.

## 3.13. ආරක්ෂාව සහ නීතිය ක්‍රියාත්මක කිරීම

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| ඇස්තමේන්තුගත මුදල | - රු. මි. 5.00 |
| | - රු. මි. 4.78* |
| වියදම | - රු. මි. 4.75 |



වනජීවී නිලධාරින් මුර සංචාරයක් අතර මග

**භෞතික ප්‍රගතිය**

- ගිණි අවි සඳහා පතොරම් 3,225 ක් මිලදී ගෙන ඇත.
- ගිණි අවි පිළිබඳ පුහුණු වැඩසටහන් 01 ක් සහ උසාවි කාර්යය පටිපාටිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත් වන ලදී.
- නියං සමයේ රක්ෂිත ප්‍රදේශ තුල අනවසර වනජීවී අපරාධ මැඩලීම සඳහා මුර සංචාර සිදු කරන ලදී.
- වනජීවී කලාප සඳහා ගිනි අවි රඳවන 08 ක් ස්ථාපිත කරමින් පවතී.
- වනජීවී නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු කාර්යය සංග්‍රහය පිටපත් 1,300ක් මුද්‍රණය කරන ලදී.



ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය -ගිරිතලේ

*ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

### 3.14. ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය පවත්වාගෙන යාම

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 8.50
- රු. මි. 7.42 *
වියදම - රු. මි. 7.42

**භෞතික ප්‍රගතිය**

- දෙපාර්තමේන්තුවේ වනජීවී නියාමක නිලධාරීන් සඳහා වනජීවී කළමනාකරණය පිළිබඳ කණිෂ්ඨ සහතික පත්‍ර පාඨමාලා 02 ක් ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රයේදී පවත්වන ලදී.
- දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා විවිධ කෙටි කාලීන පුහුණු වැඩමුළු 14 ක් පවත්වන ලදී.

## 4. 2016 වසරේ ක්‍රියාත්මක ප්‍රධාන ව්‍යාපෘතීන්

### 4.1. රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය කිරීම

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 100.00
- රු. මි. 94.00 *
වියදම - රු. මි. 92.57

**භෞතික ප්‍රගතිය**

- රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය යටතේ හෙක්ටාර් 450 ක ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම, හෙක්ටාර් 270 ක තෘණ භූමි කළමනාකරණය සහ යටි පඳුරු ඉවත් කිරීම සිදු කර ඇත.
- රක්ෂිත ප්‍රදේශ තුළ නියං සමය තුළ ගිනි ගැනීම් පැතිරීම වැළක්වීම සඳහා කි.මී 58 ක් දිග ගිනි පටි නඩත්තු කිරීම සිදු කර ඇත.
- රක්ෂිත ප්‍රදේශ තුළ පිහිටි පිහිටි වැව් 10 ක අළුත්වැඩියා කටයුතු සහ දිය වලවල් 31 ක් ඉදි කිරීම අවසන් කර ඇත.
- සූර්ය බලයෙන් ක්‍රියා කරන ජල සම්පාදන පද්ධති 03 ක් මිලදී ගෙන ජාතික උද්‍යානවල ස්ථාපිත කරන ලදී.





යාල ජාතික උද්‍යානයේ ප්‍රතිසංස්කරණය කරන ලද වැව්

*ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

## 4.2. රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරිම





මාර්ග ප්‍රතිසංස්කරණය ලහුගල සහ කුමන ජාතික උද්‍යාන

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 24.00
- රු. මි. 21.75 *
වියදම - රු. මි. 19.24

### භෞතික ප්‍රගතිය

- ජාතික උද්‍යානවල මාර්ග සංවර්ධනය කිරීම යටතේ සපත්තු පාලම් 22 ක් අවසන් කර ඇත.
- ජාතික උද්‍යානවල මාර්ග සංවර්ධනය කිරීම යටතේ කි.මී. 131 ක් සංවර්ධනය කර ඇත.

## 4.3. රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරීම




මායිම් කණු

### මූල්‍ය ප්‍රගතිය

ඇස්තමේන්තුගත මුදල - රු. මි. 25.00
වියදම - රු. මි. 21.15

### භෞතික ප්‍රගතිය

රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරීම යටතේ 2016 වසරේ පහත සඳහන් ක්‍රියාකාරකම් දැනට සිදු කර ඇත.

- වනජීවී රක්ෂිත පිළිබඳව සහ ඒවායේ සංරක්ෂණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දැන්වීම් පුවරු 365 ක් සාදා අවසන් කර ඇත.
- කි.මී. 230 ක් දිග රක්ෂිත මායිම් සළකුණු කිරීම සිදු කර අවසන් කර ඇත.
- රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරීම සඳහා නව මායිම් කණු 1425 ක් මිල දී ගන්නා ලදී.
- රක්ෂිත ප්‍රදේශවල දත්ත විශ්ලේෂණය පහසු කිරීම සඳහා ArcGIS 10.4 මෘදුකාංගයේ බලපත්‍ර 02ක් වැඩි දියුණු කරන ලදී.

*ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

## 4.4. විදුලි වැටවල් ඉදි කිරීම

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි. 250.00
වියදම - රු.මි. 239.50

**භෞතික ප්‍රගතිය**



මෙම වැඩසටහන සඳහා 2016 වසරේදී ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන යටතේ ආරම්භ කරනු ලැබීය.

**අරමුණු**

1. අලි-මිනිස් ගැටුම අවම කිරීම.
2. අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා ක්‍රමෝපායන් සංවර්ධනය සහ හැකියා වර්ධනය.



### 2016 වසරේ ලබාගත් ප්‍රගතිය

- කි.මි. 310 ක් දිග විදුලි වැටවල් ඉදි කිරීම අවසන් කර ඇත.
- කි.මි. 276 ක් දිග විදුලි වැටවල් ඉදි කිරීම සඳහා උපකරණ මිලදී ගැනීම අවසන් කර ඇත.
- තවත් කි.මි. 3,308 ක් දිග විදුලි වැටවල් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට භාර දී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

## 4.5. වනඅලි-මිනිස් ගැටුම අවම කිරීම - 2016 අයවැය යෝජනා

**මූල්‍ය ප්‍රගතිය**

ඇස්තමේන්තුගත මුදල - රු.මි.109.77
- රු.මි.647.57*
වියදම - රු.මි.329.23

**අරමුණු**

1. විශේෂ වනඅලි සංරක්ෂිත කලාප ස්ථාපිත කිරීම.
2. වනඅලි සංචරණය සඳහා පිවිසුම් මාර්ග ජාලයක් ස්ථාපිත කිරීම.
3. වනඅලි වාසස්ථාන හඳුනාගැනීම හා සංවර්ධනය කිරීම.
4. වනඅලි රක්ෂිත තත්ත්වය වර්ධනය කිරීම.
5. ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම.
6. විදුලි වැටවල් සැකසීම හා නඩත්තුව.
7. මහජනතාව දැනුවත් කිරීම හා සවිබල ගැන්වීම
8. වනඅලි රැඳවුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
9. වනඅලි පිළිබඳ විද්‍යාත්මක තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම.
10. අලි මිනිස් ගැටුම වලක්වාලීම සඳහා විශේෂ කාර්යය බලකායක් ස්ථාපනය කිරීම.
11. වනඅලි සංරක්ෂණය සඳහා අරමුදලක් ස්ථාපනය කිරීම.
12. වෙනත් වනසත්ත්ව හා මිනිස් ගැටුම අවම කිරීම.

*ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

**භෞතික ප්‍රගතිය**

2016 වසරේ අවසානය වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 647.57 ක මුදලක් ලැබී ඇති අතර එම මුදල් වලින් පහත සඳහන් කාර්යයන් සිදු කිරීමට කටයුතු කර ඇත.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් දැනට ඉදි කර ඇති විදුලි වැටවල් නඩත්තු කරමින් පවතී.
- කි.මී. 800 ක් දිග විදුලි වැට සඳහා උපකරණ මිල දී ගැනීම සිදු කර ඇත.
- වනඅලි-මිනිස් ගැටුම අවම කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් 184 ක් පවත්වා ඇත.
- වනඅලි පාලන ඒකක 05 ක් පිහිටුවීම සිදු කරමින් පවතී.
- වනඅලින් නිර්වින්දන කටයුතු සඳහා නිර්වින්දන උපකරණ මිලදී ගැනීම සිදු කර ඇත.
- වාසස්ථාන සුපෝෂණ කටයුතු යටතේ උඩවලව සහ ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානවල හෙක්ටයාර් 450 ක ආක්‍රමණශීලී ශාක ඉවත්කරන ලදී.
- රිපීටර් තුවක්කු 50 ක් මිල දී ගැනීම සිදු කරන ලදී.
- කි.මී. 400 ක් දිග විදුලි වැට සඳහා දැව කණු මිලදී ගැනීම සිදු කරන ලදී.
- අලි ඇල්ලීමේ කටයුතු සඳහා අවශ්‍ය මැනිලා කඹ මිලදී ගැනීම,
- රූපවාහිණී සංස්ථාව මඟින් "සොබාදහරා" රූපවාහිණී වැඩසටහන් 10 ක් සාර්ථකව නිෂ්පාදනය කරන ලදී.
- වනඅලි පාලන ඒකක ශක්තිමත් කිරීම හා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය සඳහා මල්ටිමීඩියා 16 ක් , ෆොටෝකොපි යන්ත්‍ර 01 ක් සහ ස්කෑනර් 16 ක් මිල දී ගැනීම සිදු කරන ලදී.
- වනඅලින් මංකඩවල දැනුවත් කිරීමේ දැන්වීම් පුවරු 18ක් පිලියෙල කර සවි කරන ලදී.

## 4.6. මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ සිදුකරන වනජීවී සංරක්ෂණ කටයුතු

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| ඇස්තමේන්තුගත මුදල | -රු. මි. 43.88 |
| | - රු. මි. 66.23* |
| වියදම | -රු. මි. 48.10 |

**අරමුණු**

1. කළුගඟ හා යෝජිත මොරගහකන්ද ජලාශය ආශ්‍රිතව ප්‍රේරක කලාපයක් ප්‍රකාශයට පත් කිරීම සහ එහි මිනිස් ක්‍රියාකාරකම් අවම කිරීම.
2. ඉහත ප්‍රදේශයේ වනජීවී මිනිස් ගැටුම අවම කිරීම සඳහා වනජීවී බාධක පිහිටුවීම. (විදුලි වැටවල්, අගල් කැපීම ආදිය)
3. වනජීවී මිනිස් ගැටුම අවම කිරීම සඳහා ව්‍යාපෘතියට යටත් වන ප්‍රදේශයේ වනජීවී වාසස්ථාන දියුණු කිරීම.
4. ව්‍යාපෘති ප්‍රදේශය ආශ්‍රිත වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම.
5. ව්‍යාපෘති ප්‍රදේශය ආශ්‍රිතව වනජීවී රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**භෞතික ප්‍රගතිය**

- වස්ගමුව ජාතික උද්‍යානයේ කිරිඔය පිවිසුම සඳහා මාර්ග බාධකයක් ඉදිකිරීම, විවරණ මධ්‍යස්ථානය සඳහා තිර රෙදි ඇමීම, උද්‍යාන මූලස්ථාන දේශණ ශාලාව අලුත්වැඩියා කිරීම, කිරිඔය අඩවි ආරක්ෂක කාර්යාලයේ ගොඩනැගිලිවල වේයන් මර්ධනය කිරීම සාර්ථකව සිදු කරන ලදී.
- අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයේ විවරණ මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම සහ මාර්ග පද්ධතිය අළුත්වැඩියා කිරීම සිදු කරන ලදී.

*ඇස්තමේන්තු මුදල සංශෝධනය වී ඇත.

- සෝමාවතිය ජාතික උද්‍යානයේ නව බීට්ටු කාර්යාලයක් සහ පුබ්බිලිය අඩවියේ නව බීට්ටු කාර්යාලයක් ඉදි කරන ලදී.
- වස්ගමුව ජාතික උද්‍යානයේ බීට්ටු කාර්යාල 02 ක්, මාදුරුඔ ජාතික උද්‍යානයේ බීට්ටු කාර්යාල 02 ක්, වික්ටෝරියා රන්දෙනිගල රන්ටැඹේ අභයභූමියේ බීට්ටු කාර්යාල 01 ක්, අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයේ ඉදි කරන ලද බීට්ටු කාර්යාල 01ක් අළුත්වැඩියා කරන ලදී.
- සෝමාවතිය ජාතික උද්‍යානයේ දැන්වීම් පුවරු සකස් කිරීම හා මාර්ග බාධකය ඉදිකිරීම සිදු කරන ලදී.
- විදුලිවැට කි.මී. 73 ක් හා බලශක්ති කුටි 03 ක් ඉදිකිරීම සිදු කරන ලදී
- දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා දෙමළ භාෂා පුහුණු වැඩසටහන් 02 ක්, දෙපාර්තමේන්තු රියදුරන්ට විද්‍යානුකූලව රථවාහන නඩත්තුව හා ධාවනය පිළිබඳ පුහුණු වැඩසටහන් 02 ක් පවත්වන ලදී
- කවුඩුල්ල, මාදුරුඔය ජාතික උද්‍යානවල සහ රන්දෙණිගල කි.මී. 73 ක් දිගට ගිණි පටි නඩත්තු කිරීම සහ හෙක්ටයාර් 73 ක තෘණ භූමි නඩත්තු කිරීම සහ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම සිදු කරන ලදී.
- ගංගාධාර ස්වාභාව රක්ෂිතයේ කි.මී. 12 ක් දිග මායිම් සඳහා මැණුම් කිරීම සිදු කරන ලදී.

## 5. 2016 වසරේ වියදම්

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මිලියන) | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | % |
| 1 | රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපනය කිරීම. | 0.57 | 0.57 | 100 |
| 2 | පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය | 11.31 | 11.30 | 100 |
| 3 | ජනවිඥිදුම්කරණ කටයුතු සංවර්ධනය | 3.08 | 3.08 | 100 |
| 4 | තර්ජනයට ලක් වූ විශේෂ සංරක්ෂණය | 5.43 | 5.43 | 100 |
| 5 | තොරතුරු සන්නිවේදන පද්ධති වැඩිදියුණු කිරීම. | 7.87 | 7.86 | 100 |
| 6 | ගොඩනැගිලි හා ඉදිකිරිම හා ප්‍රතිසංස්කරණය | 29.27 | 21.11 | 72 |
| 7 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම. | 9.60 | 9.30 | 97 |
| 8 | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම. | 4.00 | 3.56 | 89 |
| 9 | වාහන අළුත්වැඩියාව | 7.00 | 5.58 | 80 |
| 10 | රක්ෂිත ප්‍රදේශවල ජල ප්‍රභවයන් වැඩි දියුණු කිරීම. | 0.71 | 0.71 | 100 |
| 11 | රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරීම. | 25.00 | 21.15 | 85 |
| 12 | පුහුණු හා පර්යේෂණ කටයුතු | 0.62 | 0.62 | 100 |
| 13 | සංරක්ෂණ අධ්‍යයනය හා විවරණය | 7.18 | 7.18 | 100 |
| 14 | ආරක්ෂාව සහ නිති ක්‍රියාත්මක කිරීම | 4.78 | 4.75 | 99 |
| 15 | ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය පවත්වාගෙන යාම. | 7.42 | 7.42 | 100 |
| 16 | රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම. | 21.76 | 19.23 | 88 |
| 17 | රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය | 94.00 | 92.57 | 98 |
| 18 | විදුලි වැට ඉදිකිරීම. | 250.00 | 239.50 | 96 |
| 19 | වනඅලි මිනිස් ගැටුම අවම කිරීම. | 647.57 | 329.23 | 51 |
| | **එකතුව** | **1,137.17** | **790.15** | **69** |

## 5.1. වියදම් සාරාංශය 2016- ඒකාබද්ධ අරමුදල

| වියදම් කාණ්ඩය | 2016 ඇස්තමේන්තුව (රු.මි.) | 2016 වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---:|---:|---:|
| මූලධන වියදම් | 1137.18 | 790.14 | 69 |
| පුනරාවර්තන වියදම් | 1054.64 | 1041.89 | 99 |
| එකතුව | **2191.82** | **1832.03** | **84** |

## 5.2. වියදම් සාරාංශය 2016 - වනජීවී සංරක්ෂණ අරමුදල

| වියදම් කාණ්ඩය | 2016 ඇස්තමේන්තුව (රු.මි.) | 2016 වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---:|---:|---:|
| වනජීවී සංරක්ෂණ අරමුදල | 1245.40 | 875.56 | 40 |

## 5.3. 2016 වසරේ වනසත්ත්ව සංරක්ෂණ අරමුදලේ වියදම් සාරාංශය

| වැය විෂයය | විස්තරය | ඇස්තමේන්තුව (රු.මි.) | වියදම (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---:|---:|---:|
| 3000 | ස්වෙච්ඡා මාර්ගෝපදේශක දීමනා | 94.14 | 67.25 | **71** |
| 3001 | තත්කාර්ය කම්කරු දීමනා | 8.00 | 2.79 | **35** |
| 3002 | ගමන් වියදම් | 18.00 | 22.35 | **124** |
| 3003 | ඉන්ධන | 40.00 | 35.94 | **90** |
| 3005 | ප්‍රසාද දීමනා (උසාවි දඩ මුදල් ලැබීම් වලින්) | 12.50 | 12.42 | **99** |
| 3006 | මිය ගිය වනඅලි ඉවත් කිරීම/වළ දැවීම/පිළිස්සීම | 1.00 | 1.30 | **130** |
| 3007 | මහජනයාට, සතුන්ගෙන් වන හානි සඳහා වන්දි ගෙවීම | 5.00 | 12.17 | **243** |
| 3008 | අලි වෙඩි මිල දී ගැනීම | 80.00 | 86.70 | **108** |
| 3009 | අලි පලවා හැරීම | 16.00 | 9.69 | **61** |
| 3010 | සතුන් සඳහා ආහාර වියදම් | 42.00 | 49.68 | **118** |
| 3011 | සේවා ගාස්තු | 160.00 | 183.17 | **114** |
| 3012 | වාහන අළුත්වැඩියාව | 15.00 | 34.01 | **227** |
| 3013 | විදුලිය හා ජලය | 6.00 | 7.98 | **133** |
| 3014 | තුවක්කු බලපත්‍ර ගෙවීම | 0.18 | 0.19 | **106** |
| 3015 | වඳවීමේ තර්ජනයට ලක්වී ඇති වනජීවීන් සංරක්ෂණය | 13.00 | 3.21 | **25** |
| 3016 | ගුවන් විදුලි පණිවිඩ පහසුකම් වෙනුවෙන් ගෙවීම් | 7.50 | 7.13 | **95** |
| 3017 | බංගලාවල රෙදි පිරිසුදු කිරීම | 0.70 | 0.91 | **130** |
| 3018 | නීතිඥ ගාස්තු | 0.30 | 0.07 | **24** |
| 3019 | විවිධ වියදම් | 10.00 | 13.91 | **139** |
| 3020 | යන්ත්‍ර උපකරණ, විදුලි උපකරණ, ගොඩනැගිලි නඩත්තු වියදම් (රක්ෂිත ප්‍රදේශවල පිහිටි පරිපාලන ගොඩනැගිලි 48ක් නිල නිවාස 32ක් වැසිකිළි පද්ධති 06ක් වනජීවී සංචාරක බංගලා 17ක් විදුලි සැපයුම් පද්ධති 07ක් වාහන ගාල් කිරීම සඳහා ගරාජ් 05ක් ජල සැපයුම් පද්ධති 06ක් කඳවුරු බිම් 01ක ) අළුත්වැඩියාවන් අවසන් කර ඇති අතර දැවමය විවරණ පුවරු 100ක් පිළියෙල කර | 140.00 | 72.13 | **52** |
| 3021 | මෙහෙයුම් ද්‍රව්‍ය හා උපාංග (වෛද්‍ය) | 18.00 | 8.60 | **48** |
| 3022 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය වියදම් | 0.80 | 2.44 | **305** |
| 3023 | නිලධාරීන්ගේ රෝහල් සහ වෛද්‍ය ගාස්තු | 1.00 | 0.00 | **0** |
| 3024 | නිලධාරීන්ගේ ජීවිත හා ශාරීරක හානි සඳහා වන්දි | 1.00 | 0.91 | **91** |

| වැය විෂයය | විස්තරය | ඇස්තමේන්තුව (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 3028 | සංචාරකයින්ගේ සහ වනජීවින්ගේ උද්‍යානවල පහසුකම් වැඩි දියුණු කිරීම<br>• උඩවලව ඇත්අතුරු සෙවනේ ස්ථාපිත අලි රැඳවුම් මධ්‍යස්ථානයේ අලි පැටවුන් 22 ට වැටක් ඉදිකිරීම, හට් සහ දියවලවල් ඉදිකිරීම විදුලි, නිරීක්ෂණ මැදිරි 02 ක් ජල විදුලිය සහ අපවහන පද්ධතිය ස්ථාපිත කිරීම සිදු කර ඇත.<br>• රක්ෂිත ප්‍රදේශවල පිහිටි පරිපාලන ගොඩනැගිලි 07 ක් නිල නිවාස 03 ක් සහ සංචාරක නිවාස 05 ක අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.<br>• රක්ෂිත ප්‍රදේශවල පිහිටි කාර්යාලවල වාහන නවතා තැබීම සඳහා වාහන නැවතුම්පලවල් 04 ක් ඉදි කර ඇත<br>• විල්පත්තු, ගල්ඔය සහ යාල ජාතික උද්‍යානයේ වැසිකිළි පද්ධති 04 ක් ක් සථාපිත කරන ලදී.<br>• ලාහුගල ජාතික උද්‍යානයේ සපත්තු පාලම් 05 ක් ඉදි කරන ලදී. යාල සහ විල්පත්තු ජාතික උද්‍යානවල මාර්ග අළුත්වැඩියා කටයුතු (80%) සිදු කර ඇත.<br>• ගොඩනැගිලි 05ක අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී<br>• යලි පුබුදමු යාල වැඩසටහන යටතේ යාල ජාතික උද්‍යානයේ කලාප අංක III, IV හා V හී මාර්ග ඉදි කිරීම , ප්‍රධාන පිවිසුම, පිවිසුම් ගොඩනැගිල්ල, ප්‍රවේශ පත්‍ර කවුළුව ඉදි කිරීම, බීට්ටු කාර්යාල 01ක් ඉදි කිරීමේ කටයුතු සිදු කරන | 474.00 | 147.85 | **31** |
| 3029 | බෝට්ටු, වාහන සහ යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම | 26.50 | 22.26 | **84** |
| 3030 | සංචාරක නිවාස සඳහා අවශ්‍ය ද්‍රව්‍ය | 4.00 | 8.02 | **201** |
| 3034 | සංචාරක බංගලා සහ ජාතික උද්‍යාන නඩත්තු කිරීම | 13.00 | 0.57 | **4** |
| 3036 | බෝට්ටු, වාහන සහ යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම | 60.00 | 53.58 | **89** |
| 3037 | සම්මුති හා සම්මන්ත්‍රණ | 8.00 | 6.73 | **84** |
| 3038 | කෘෂි රක්ෂණ මණ්ඩලයට දායක මුදල් ගෙවීම | 12.00 | | **0** |
| 3039 | ප්‍රධාන කාර්යාලයේ අංශවල පහසුකම් වැඩි දියුණු කිරීම | 15.00 | | **0** |
| 3040 | ජනවිහිදුම්කරණ කටයුතු | 4.00 | 1.58 | **40** |
| | **එකතුව** | **1,307.00** | **876.00** | **67** |

## 2016 වසරේ දී දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද සුවිශේෂ සේවාවන්

- වනජීවී රක්ෂිත ජාලය තුල වන අපරාධ මැඩපැවත්වීම සඳහා වැටලීම් 831 සිදුකර පුද්ගලයින් 486 ට එරෙහිව වනසත්ව හා වෘක්ෂලතා අඥා පනත යටතේ නීතිය ක්‍රියාත්මක කර රු.මි. 34.91 ක දඩ මුදල් අයකරගෙන ඇත.

- නව සංශෝධිත වනඅලි හානි වන්දි ක්‍රමය සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර ඒ යටතේ පහත සඳහන් ලෙස වන්දි ගෙවීම් සංශෝධනය වී ඇත.

| වන්දි වර්ගය | පෙර පැවති වන්දි ක්‍රමය යටතේ වන්දි මුදල (රු.) | නව වන්දි ක්‍රමය යටතේ වන්දි මුදල (රු.) |
|---|---|---|
| ජීවිත හානි | 100,000 | 200,000 |
| ශාරීරික හානි | | |
| පූර්ණ බෙලහීනතාවය | 100,000 | 200,000 |
| අර්ධ බෙලහීනතාවය | 30,000 | 75,000 |
| දේපොළ හානි | 50,000 | 100,000 |

- 2016 වසරේ වනඅලි හානි සිද්ධීන් 1491 ක් සඳහා (මිනිස් මරණ 93 ක්, ශාරීරික හානි 78 ක් හා දේපොළ හානි 1320 ක් සඳහා වන්දි වශයෙන් රු. මි. 32.17 ක් ගෙවා ඇත (මිනිස් මරණ සඳහා රු. මි. 8.8 ක් , ශාරීරික හානි සඳහා රු. මි. 1.08 ක් හා දේපොළ හානි සඳහා 22.22 ක් ).

- 2016.09.30 වනවිට වනඅලි -මිනිස් ගැටුම අවම කිරීම සඳහා පහත සඳහන් ලෙස අලි වෙඩි මිල දී ගෙන වනඅලි තර්ජන සහිත ප්‍රදේශවලට බෙදා හැර ඇත.

| අලිවෙඩි වර්ගය | ප්‍රමාණය | වියදම (රු.මි.) |
|---|---|---|
| ගිගුම් (ලොකු) | 375,500 | 41.38 |
| ගිගුම් (කුඩා) | 156,500 | 13.44 |
| සංඥා දහර | 234,750 | 31.80 |
| **එකතුව** | **766,750** | **86.62** |

NATIONAL ZOO SRI LANKA

# ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව



## 1. හැඳින්වීම

වන සතුන් අල්ලා තබාගෙන පිටරට සත්වෝද්‍යාන වෙත ප්‍රවාහනය කරන තුරු රඳවා තබාගන්නා පුද්ගලික වන සත්ත්ව එකතුවක් ලෙස 1920 දශකයේ පෙර භාගයේ දී දෙහිවල ප්‍රදේශයේ අක්කර 11 ක භූමි භාගයක් තුළ ජර්මන් ජාතික ජෝන් හාගෙන්බර්ග් මහතා විසින් ආරම්භ කරන ලද දෙහිවල සත්වෝද්‍යානය වර්ෂ 1936 ජූලි 01 වන දින රජයට පවරා ගන්නා ලදී.

පසුව මෙම සත්වෝද්‍යානය වර්ෂ 1946 දී ස්වාධීන රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කරන ලදී.පසුව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පාලනය සහ කළමනාකරණය කිරීමේ කටයුතු 1982 අංක 41 දරණ ජාතික සත්ව උද්‍යාන පනතේ විධිවිධාන යටතට පත් කරන ලදී.

මේ වන විට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ දෙහිවල ජාතික සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානයේ ශ්‍රී ලංකානු කලාපය සහ රිදියගම සෆාරි උද්‍යානය යන උද්‍යාන ද ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ ද පාලනය වේ.

### 1.1 දැක්ම

"ලෝකයේ විශිෂ්ටතම සත්වෝද්‍යාන පවත්වා ගෙන යනු ලබන ආයතනයක් බවට පත්වීම."

### 1.2 මෙහෙවර

"නවීන සත්වෝද්‍යාන සංකල්ප යටතේ, ආකර්ෂණීය ශිල්පීය ක්‍රම සහ ප්‍රවීණතාවයන් උපයෝගී කර ගනිමින්, පිළිගත් නීති රීති වලට අනුකූලව උපරිම රැකවරණය යටතේ නිවහන සපයමින්, විවිධත්වයෙන් යුතු සෞඛ්‍ය සම්පන්න සත්ත්ව එකතුවක් ප්‍රදර්ශනය කිරීම."

### 1.3 ප්‍රධාන පරමාර්ථ


- සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය
- සත්ත්ව සුබසාධනය
- අධ්‍යාපනය
- පර්යේෂණය
- ප්‍රදර්ශනය හා විනෝදාස්වාදය

## 2. කාර්යය මණ්ඩල තොරතුරු

2016.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 860 ක් වන අතර එදිනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව 635 කි.

*වගුව 1: සේවක වර්ගීකරණය අනුව 2016.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා එදිනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව*

| සේවක වර්ගීකරණය | | 2016.12.31 දිනට සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | අනුමත | සේවයේ නියුතු |
| 1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 23 |
| 2 | තෘතීය මට්ටම | 02 | 01 |
| 3 | ද්විතීය මට්ටම | 184 | 132 |
| 4 | ප්‍රාථමික මට්ටම | 645 | 479 |
| එකතුව | | **860** | **635** |



අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (පරිපාලන)
අධ්‍යක්ෂ (මෙහෙයුම්)
අධ්‍යක්ෂ (සත්ව හා පෝෂණ)
ප්‍රධාන ගණකාධිකාරී
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පින්නවල)
සහකාර අධ්‍යක්ෂ (පාලන)
සහකාර අධ්‍යක්ෂ (දෙහිවල 01)
සහකාර අධ්‍යක්ෂ (දෙහිවල 02)
සහකාර අධ්‍යක්ෂ (සෆාරි)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
ඉංජිනේරු
සහකාර අධ්‍යක්ෂ (පින්නවල අලි අනාථාගාරය)
සහකාර අධ්‍යක්ෂ (පින්නවල සත්වෝද්‍යානය)
පශු වෛද්‍ය
ගණකාධිකාරී
අභ්‍යන්තර විගණක
පරිපාලන නිලධාරී
සංවර්ධන නිලධාරී
අධ්‍යාපන හා පරි. සහකාර/ සංවර්ධන නිලධාරී
ජ්‍යෙෂ්ඨ පාලක
ප්‍රධාන කළමනාකරණ සහකාර
පාලක
කළමනාකරණ සහකාර
සහකාර පාලක
ප්‍රධාන ආරක්ෂක නිලධාරී
අධීක්ෂණ නිලධාරී
සත්ව භාරකරු/අලි බලන්නා/මත්ස්‍ය:උප: උයන්කරු කම්කරු
ආරක්ෂක නියාමක
සත්ව භාරකරු/අලි බලන්නා උයන්කරු කම්කරු

# 3.මෙහෙයුම් ඒකක

## 3.1. දෙහිවල ජාතික සත්වෝද්‍යානය



වසර 80 කට වැඩි ඉතිහාසයකට හිමිකම් කියන දෙහිවල ජාතික සත්වෝද්‍යානය ජර්මානු ජාතික ජෝන් හාගෙන්බර්ග් මහතා විසින් 1920 දශකයේ මුල භාගයේ දී පුද්ගලික වන සත්ත්ව එකතුවක් ලෙස අක්කර 11ක භූමි භාගයක් සහිතව ආරම්භ කරන ලදී. එය 1936 වර්ෂයේ දී රජයට පවරා ගන්නා ලද අතර මේ වන විට අක්කර 23 ක භූමි භාගයක් පුරා පැතිරී ඇත.

දේශීය හා විදේශීය ක්ෂීරපායී, පක්ෂි, උරග සහ මත්ස්‍ය විශේෂ රාශියකින් සමන්විත අධ්‍යාපනික වටිනාකමකින් යුතු සත්ත්ව එකතුවක් දෙහිවල සත්වෝද්‍යානය සතුව පවතී.

සත්ත්ව අරණ පුළුල් කර සතුන්ගේ සුබසාධනය දියුණු කිරීම සහ මාර්ග පද්ධතිය නවීකරණය කිරීම වැනි මහජනතාව සඳහා ලබාදෙන පහසුකම් පුළුල් කිරීම ආදී කටයුතු දෙහිවල සත්වෝද්‍යාන සංවර්ධන මහා සැලැස්ම යටතේ සිදු කෙරෙමින් පවතී.

## 3.2. පින්නවල අලි අනාථාගාරය



පින්නවල අලි අනාථාගාරය වර්ෂ 1975 දී රඹුක්කන-පින්නවල අක්කර 25 ක භූමි ප්‍රදේශයක් තුළ අනාථ වූ අලින් පස් දෙනෙකුගෙන් යුතුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත කරන ලදී. 1982 දී පින්නවල අලි අනාථාගාරය ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතට පවරා ගන්නා ලදී.

වර්තමානයේදී අලින් දම්වැල් යොදා ගැට ගැසීම අවම කිරීම සඳහා අලින් නිදහසේ සිටින ප්‍රදේශයක් තැනීම, අලින් සඳහා දිය නෑමට ඇති වැව පුළුල් කිරීම, මහජනතාව සඳහා නැරඹුම් මැදිරි සහ ආපනශාලා වැනි අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පිඹුරුපත් සකසමින් පවතී.

### 3.3. පින්නවල සත්වෝද්‍යානය



ශ්‍රී ලංකාවේ ප්‍රථම එළිමහන් සත්වෝද්‍යානය වන මෙහි ශ්‍රී ලංකා කලාපයේ පළමු අදියර (Sri Lankan Zone) 2015 අප්‍රේල් මස 15 දින මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කරන ලදී. ලෝක කලාපයේ (World zone) ඉදිකිරීම් කටයුතු ඉදිරියේදී සිදු කිරීම සඳහා සැලසුම් කර ඇත.

නවීන සත්වෝද්‍යාන සංකල්පය යටතේ ඉදිවුණ මනරම් උද්‍යාන වලින් විශාල සත්ත්ව අරණ වලින් සමන්විත වන මෙම සත්වෝද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින් සඳහා නැවුම් අත්දැකීමක් එක් කිරීමට සමත්වී ඇත.

සමනලයන් සඳහා විවෘත පෙදෙස්, වඳුරන් සඳහා අරණ සහ සියක්කාර අරණ වැනි අංග නුදුරු අනාගතයේදී එක් වීමට නියමිතය.

### 3.4. හම්බන්තොට සෆාරි උද්‍යානය




ශ්‍රී ලාංකිකයින්ට සෆාරි සංචාරක අත්දැකීමක් ලබා දෙමින් පාරිසරික සංචරණය ප්‍රවර්ධනයට දායකවීම, සත්වෝද්‍යාන සත්ත්ව විශේෂ සඳහා අභිජනන වැඩසටහන් පැවැත්වීම යන මූලික පරමාර්ථ සපුරාගනුවස් හම්බන්තොට රිදියගම ප්‍රදේශයේ අක්කර 500 ක භූමියක ඉදි කරන ලද සෆාරි උද්‍යානයේ ප්‍රථම අදියර 2016 මාර්තු මස 28 දින මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කරන ලදී.

මෙහි ප්‍රථම අදියර යටතේ අප්‍රිකානු සිංහ කලාපය, අප්‍රිකානු ශාක භක්ෂක සත්ත්ව කලාපය සහ ආසියානු අලි කලාපයේ දැනට මෙහෙයුම් ක්‍රියාත්මක වන අතර ඉදිරියේ දී බෙංගාල ව්‍යාඝ්‍ර කලාපය, ආසියානු සත්ත්ව කලාපය, ශ්‍රී ලංකා දිවි කලාපය, ශ්‍රී ලංකා වලස් කලාපය, ඕස්ට්‍රේලියානු කලාපය හා සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිතව පවතී.

මීට අමතරව පක්ෂීන්, බළල් පවුලේ කුඩා සතුන්, වඳුරු විශේෂ සහ සමනලයින් සහිත කුඩා සත්ත්ව රාජධානියක් ද අවට ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා වෙළඳ කුටි කිහිපයක් ද ඉදි කිරීමට නියමිතව පවතී.

## 3.5. සත්ත්ව ආහාර සපයන ගෝනපොළ ගොවිපොළ



දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ශාක භක්ෂක සතුන් සඳහා අවශ්‍ය නැවුම් සහ පෝෂ්‍ය ගුණයෙන් යුතු ආහාර වලින් කොටසක් සැපයීම පිණිස මෙම ගොවිපොළ 1997 වර්ෂයේදී හොරණ ගෝනපොළ ප්‍රදේශයේ අක්කර 16 ක භූමියක් තුල ස්ථාපිත කරන ලදී.

ගෝනපොළ ගොවිපොළ සත්වෝද්‍යාන අරමුණු සඳහා වඩාත් ඵලදායකව දායක කර ගනිමින් දෙහිවල සත්වෝද්‍යානයේ සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය හා සත්ත්ව නිරෝධායන පෙදෙස මෙහි ඉදි කිරීමට නියමිතය.

2016 වර්ෂය තුළ රු.මි. 3.403 ක් වටිනා සත්ත්ව ආහාර ද්‍රව්‍ය මෙම ගොවිපොළෙන් දෙහිවල සත්වෝද්‍යානය වෙත සපයන ලදී.

# 4. සත්ත්ව සංරක්ෂණය සහ අභිජනනය

## 4.1 සත්ත්ව එකතුව

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරමාර්ථ ලඟා කර ගැනීම උදෙසා දැනට ලෝකයේ වඳ වී යාමේ තර්ජනයට ලක් වී ඇති සතුන් ආරක්ෂා කර ගනිමින් 2016.12.31 දින වන විට සතුන් 4878 කට නිවහන සපයනු ලැබීය. දෙපාර්තමේන්තුව සතු එක් එක් මෙහෙයුම් ඒකක යටතේ 2016.12.31 දිනට නිවහන සපයනු ලැබූ සත්ත්ව එකතුව පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

*වගුව 2: ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සතු සත්ත්ව එකතුව 2016.12.31 දිනට*

| සත්ත්ව වර්ගීකරණය | | විශේෂ/පවුල් | සත්වයින් ප්‍රමාණය |
|---|---|---|---|
| **දෙහිවල ජාතික සත්වෝද්‍යානය** | | | |
| 1 | ක්ෂීරපායී | 68 | 333 |
| 2 | පක්ෂි | 78 | 584 |
| 3 | උරග | 37 | 215 |
| 4 | මත්ස්‍ය සහ වෙනත් මුහුදු ජීවීන් | 68 | 3151 |
| එකතුව | | **251** | **4283** |
| **පින්නවල අලි අනාථාගාරය** | | | |
| **1** | **ක්ෂීරපායී - ආසියානු අලියා** | 01 | 88 |
| එකතුව | | **01** | **88** |
| **පින්නවල සත්වෝද්‍යානය** | | | |
| 1 | ක්ෂීරපායී | 12 | 115 |
| 2 | පක්ෂි | 08 | 32 |
| 3 | උරග | 03 | 09 |
| එකතුව | | **23** | **156** |
| **හම්බන්තොට සෆාරි උද්‍යානය** | | | |
| 1 | ක්ෂීරපායී | 32 | 225 |
| 2 | පක්ෂි | 09 | 25 |
| 3 | උරග | 02 | 10 |
| එකතුව | | **43** | **260** |
| **ගෝනපොළ ගොවිපොළ** | | | |
| 1 | ක්ෂීරපායී | 01 | 02 |
| 2 | පක්ෂි | 10 | 89 |
| එකතුව | | **11** | **91** |
| **ජා.ස.දෙ. සතු සමස්ත සත්ත්ව එකතුව** | | **323** | **4878** |

## 4.2. සත්ත්ව අභිජනනය

විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව අභිජනන වැඩසටහන් දියත් කරමින් සත්ත්ව ගහනය වැඩි කිරීමට දායකවන ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට 2016 වර්ෂය තුළ දී විවිධ සත්ත්ව විශේෂවලට අයත් සතුන් 251ක් (මත්ස්‍ය විශේෂ හැර) සාර්ථකව බිහි කිරීමට හැකියාව ලැබී ඇත.

*වගුව 3*: ජාතික සත්වෝද්‍යානය දෙපාර්තමේන්තුව තුළ උපත ලද සතුන් (2016.12.31 දිනට)

| සත්වෝද්‍යානය | සත්ත්ව වර්ගීකරණය | | | එකතුව |
|---|---|---|---|---|
| | ක්ෂීරපායී | පක්ෂී | උරග | |
| දෙහිවල ජාතික සත්වෝද්‍යානය | 37 | 12 | 16 | **65** |
| පින්නවල අලි අනාථාගාරය | 2016 වසර තුළ කිසිදු අලි උපතක් වාර්තා වී නැත. | - | - | **-** |
| පින්නවල සත්වෝද්‍යානය | 18 | - | - | **18** |
| හම්බන්තොට සෆාරි උද්‍යානය | 21 | - | - | **21** |
| ගෝනපොළ ගොවිපොළ | - | 147 | - | **147** |
| **එකතුව** | **76** | **159** | **16** | **251** |

# 5. අධ්‍යාපනික, පර්යේෂණ සහ විශේෂ වැඩසටහන්

## 5.1 අධ්‍යාපනික වැඩසටහන්

විතැන් සංරක්ෂණ මධ්‍යස්ථානයක් වශයෙන් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විවිධ අධ්‍යාපනික වැඩසටහන් පවත්වමින් සත්ත්ව සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ සහ සත්ත්ව විශේෂ පිළිබඳ තොරතුරු මහජනතාව වෙත ලබා දෙයි.තවද එක් එක් මෙහෙයුම් ආයතන විසින් 2016 වර්ෂය තුළ දී විවිධ වූ විශේෂාංග පවත්වමින් ද දැයේ දරුවන් සඳහා අධ්‍යාපනික දැනුමක් මෙන්ම විනෝද වීමේ අවස්ථාවද ලබා දෙන ලදී.

2016 වර්ෂය තුළ එක් එක් මෙහෙයුම් ආයතන මඟින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපනික සහ වෙනත් විශේෂ වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### 5.1.1. දෙහිවල ජාතික සත්වෝද්‍යානය

#### 5.1.1.1. අධ්‍යාපනික වැඩසටහන්

*වගුව 4: 2016 වර්ෂයේ අධ්‍යාපනික වැඩසටහන් - දෙහිවල ජාතික සත්වෝද්‍යානය*

| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | දේශන | විශ්ව විද්‍යාල සිසුන් සඳහා දේශන | 15 |
| | | පාසල් ව්‍යාපෘති සඳහා දැනුවත් කිරීම් | 130 |
| | | ක්ෂේත්‍ර චාරිකා | 32 |
| | | පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් | 17 |
| | | සේවකයන් සඳහා දේශන | 12 |
| | | බාහිර ඉල්ලීම් මත කරනු ලබන දේශන | 21 |
| | | දේශන (ආයතනයෙන් බැහැර) | 11 |
| | | බාල දක්ෂ කණ්ඩායම් | 03 |
| 2 | ආයතනික පුහුණුව (Industrial Training) | මොරටුව, රුහුණ, ඌව වෙල්ලස්ස සහ ජයවර්ධනපුර සිසුන් සඳහා පුහුණු වැඩසටහන් | 15 |
| 3 | මාර්ගෝපදේශ වැඩසටහන් | පෙර පාසල්, පාසල් සහ වෙනත් | 18 |
| 4 | ප්‍රකාශන | සත්තු වත්ත සඟරාව | 01 |
| | | සත්වෝද්‍යාන සිතියම | 01 |
| | | අත් පත්‍රිකා (සකසමින් පවතී) | 04 |
| 5 | ජංගම ප්‍රදර්ශන ඒකකය | ප්‍රදර්ශන | 17 |
| 6 | ස්වේච්ඡා සේවක වැඩසටහන | ස්වේච්ඡා සේවක සහභාගී වීම් | 07 |
| 7 | අධ්‍යාපනික පුවරු | නාම පුවරු | 72 |
| | | විස්තරාත්මක පුවරු | 45 |
| 8 | විස්තර ප්‍රකාශ | සත්ත්ව සංදර්ශන පිළිබඳ ප්‍රකාශන | 55 |

#### 5.1.1.2. විශේෂාංග සහ විශේෂ දින සැමරුම්

- සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් අලි ඇතුන් උදෙසා හිස තෙල් ගෑමේ චාරිත්‍රානුකූල උත්සවය පැවැත්වීම.
- 2016 ජුනි 05 ලෝක පරිසර දිනය වෙනුවෙන් පාසල් ළමුන් උදෙසා වැඩමුළුවක් පැවැත්වීම හා රුක් රෝපණ වැඩසටහනක් පැවැත්වීම.
- 2016 ජුනි 03 වන දින දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ 80 වැනි සංවත්සරය වෙනුවෙන් පරිත්‍රාණ ධර්මදේශනයක් හා පසු දින සංඝගත දක්ෂිණාවක් පිරිනැමීම.
- 2016 ඔක්තෝබර් 01 ලෝක ළමා දිනය වෙනුවෙන් ළමුන් සඳහා අධ්‍යාපනික හා විනෝදාත්මක වැඩසටහන් පැවැත්වීම.
- ලෝක සත්ත්ව දිනය සැමරීම උදෙසා විශේෂ වැඩසටහන් පැවැත්වීම.
- දෙහිවල ජාතික සත්වෝද්‍යානය එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සහ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය සමඟ එක්ව එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ දිනමිණ පුවත්පත "වනදිවිය" නමින් කළ චිත්‍ර තරඟයේ ජයග්‍රාහකයන් 80 දෙනෙකු සඳහා ත්‍යාග හා සහතික පත්‍ර බෙදා දීමේ උත්සවය හා සහභාගී වූ ළමුන් සඳහා චිත්‍ර ඇඳීම පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම.

### 5.1.2. පින්නවල අලි අනාථාගාරය

#### 5.1.2.1. අධ්‍යාපනික වැඩසටහන්

2016 වර්ෂය තුළ පින්නවල අලි අනාථාගාරය විසින් විවිධ අධ්‍යාපනික වැඩසටහන් පවත්වමින් අලි ඇතුන් සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ සහ අලි ඇතුන් පිළිබඳ තොරතුරු මහජනතාව වෙත ලබා දෙන ලදී. එම වැඩසටහන් පිළිබඳ තොරතුරු සටහනක් පහත දැක්වේ.

| වගුව 5: 2016 වර්ෂයේ අධ්‍යාපනික වැඩසටහන් - පින්නවල අලි අනාථාගාරය | | | |
|---|---|---|---|
| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
| 1 | දේශන | විශ්ව විද්‍යාල සිසුන් සඳහා දේශන | 14 |
| | | පාසල් ව්‍යාපෘති සඳහා දැනුවත් කිරීම් | 19 |
| | | පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් (ළමුන් 4070 ක් පමණ සහභාගී විය.) | 34 |
| | | පෙර පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් | 193 |
| | | සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 05 |
| | | විදේශිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 17 |
| 2 | වැඩමුළු | සේවකයන් සඳහා වැඩමුළු | 04 |
| 3 | ප්‍රකාශන | හස්ති සඟරාව | 02 |
| 4 | ස්වේච්ඡා සේවක වැඩසටහන | ස්වේච්ඡා සේවක සහභාගී වීම් | 34 |
| 5 | ප්‍රදර්ශන | ප්‍රදර්ශන සඳහා සහභාගී වීම් | 02 |

### 5.1.2.2. විශේෂාංග සහ විශේෂ දින සැමරුම්

- 2016 පෙබරවාරි 16 දින පින්නවල අලි අනාථාගාරයේ 41 වන සංවත්සරය වෙනුවෙන් "කුංචනාදය" නමින් විශේෂ උත්සවයක් පැවැත්වීම.
- 2016 ජුනි 05 ලෝක පරිසර දිනය වෙනුවෙන් පාසල් ළමුන් වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහනක් සහ රුක් රෝපණ වැඩසටහනක් පැවැත්වීම.
- 2016 අගෝස්තු 12 ලෝක අලි දිනය වෙනුවෙන් අලි ඇතුන්ගේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- 2016 ඔක්තෝබර 01 ලෝක ළමා දිනය වෙනුවෙන් ළමුන් සඳහා අධ්‍යාපනික හා විනෝදාත්මක වැඩසටහන් පැවැත්වීම.
- සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් අලි ඇතුන් උදෙසා හිස තෙල් ගෑමේ චාරිත්‍රානුකූල උත්සවය පැවැත්වීම.

## 5.1.3. පින්නවල සත්වෝද්‍යානය

### 5.1.3.1. අධ්‍යාපනික වැඩසටහන්

2016 වර්ෂය තුළ පින්නවල සත්වෝද්‍යානය විසින් විවිධ අධ්‍යාපනික වැඩසටහන් පවත්වමින් සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අරමුණු ලඟාකර ගැනීමට කටයුතු කරයි.

| වගුව 6:2016 වර්ෂයේ අධ්‍යාපනික වැඩසටහන් -පින්නවල සත්වෝද්‍යානය | | | |
|---|---|---|---|
| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
| 1 | දේශන | කෑගල්ල දිස්ත්‍රික්කයේ පෝතක බාල දක්ෂයින් 400 කින් යුත් කණ්ඩායමක් සහභාගී කර ගනිමින් ඔවුන්ගේ දැනුම හා ආකල්ප සංවර්ධනය කිරීම. | 01 |
| | | සත්වෝද්‍යාන කාර්යය මණ්ඩලය සඳහා ඊ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන. | 01 |
| 2 | සේවක පුහුණු වැඩසටහන් | අනියම් සේවකයන් පුහුණු කිරීමේ පාඨමාලාව | 01 |
| 3 | පුවරු | අධ්‍යාපනික පුවරු | 08 |

### 5.1.3.2. විශේෂාංග සහ විශේෂ දින සැමරුම්

- 2016.06.02 ජගත් පරිසර දිනය සැමරීම සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ පෝතක බාල දක්ෂයින් 245 කින් යුත් කණ්ඩායමක් සහභාගී කරවා ගෙන පලතුරු පැළ සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- 2016.10.01 දින ළමයින් 5100 ක් සහභාගී කර ගෙන ලෝක ළමා දිනය සැමරීම.
- 2016.06.30 ජාත්‍යන්තර දුම්වැටි සහ මත්ද්‍රව්‍ය විරෝධී දිනය නිමිති කර ගනිමින් පින්නවල සත්වෝද්‍යානයේ කාර්ය මණ්ඩලය සඳහා දුම්වැටි සහ මත්ද්‍රව්‍ය විරෝධී වැඩසටහනක් පැවැත්වීම.

### 5.1.4. හම්බන්තොට සෆාරි උද්‍යානය

### 5.1.4.1. අධ්‍යාපනික වැඩසටහන්

පාරිසරික සංවරණයේ පළමු දේශීය අත්දැකීම ශ්‍රී ලාංකිකයින්ට ලබා දෙන හම්බන්තොට සෆාරි උද්‍යානය එහි කාර්යභාරය සාර්ථක කර ගැනීමට අවශ්‍ය අධ්‍යාපනික හා පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් 2016 වසර තුළ අවධානය යොමු කරන ලදී.

වගුව 7: 2016 වර්ෂයේ අධ්‍යාපනික වැඩසටහන් -හම්බන්තොට සෆාරි උද්‍යානය

| අනු අංකය | අධ්‍යාපනික වැඩසටහන් වර්ගය | ක්‍රියාකාරකම | ක්‍රියාකාරකම් ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | දේශන | පරිසර දිනය වෙනුවෙන් පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන. | 01 |
| 2 | සේවක පුහුණු වැඩසටහන් | කාර්යය මණ්ඩලය සඳහා ඉංග්‍රීසි භාෂා වැඩසටහන | 01 |
| 3 | වැඩමුළු | දකුණු සහ මධ්‍යම පළාත් වල සංචාරක මාර්ගෝපදේශකයන් සඳහා පාරිසරික සංවරණ ප්‍රවර්ධනය සඳහා වැඩමුළුවක් පැවැත්වීම. | 01 |

### 5.1.4.2. විශේෂාංග සහ විශේෂ දින සැමරුම්

- සෆාරි උද්‍යානය විවෘත කිරීමේ උත්සවය
- පරිසර දිනය වෙනුවෙන් රුක් රෝපණ වැඩසටහනක් පැවැත්වීම.

## 5.2. පර්යේෂණ වැඩසටහන්

සත්ත්ව සංරක්ෂණය, සත්ත්ව සුබසාධනය ඉහල නැංවීම සහ සත්ත්ව අභිජනනය වැඩිදියුණු කිරීමේ පරමාර්ථයෙන් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව පර්යේෂණ කටයුතු සිදු කරනු ලබයි.දෙහිවල සත්වෝද්‍යානය විසින් 2016 වර්ෂයේ දී පර්යේෂණ 09 ක් ක්‍රියාත්මක කර ඇත. එනම්;

- දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ බෙංගාලි ව්‍යාඝ්‍රයින්ගේ (*Panthera tigris tigris*) හැසිරීම් රටා පිළිබඳ පර්යේෂණය.
- දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ නිදහසේ සිටින පක්ෂි විශේෂ පිළිබඳ අධ්‍යයනය.
- දෙහිවල ජාතික සත්වෝද්‍යානය නරඹන්නට පැමිණෙන සංචාරකයින්ට ආයතනය විසින් ලබා දෙන සේවාවන් පිළිබඳ සංචාරක අදහස් පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම.
- දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සමනල උයනේ සාර්ථකව අභිජනනය වන සමනල විශේෂ පිළිබඳ අධ්‍යයනය.
- දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සිටින රත් කන් ඉබ්බන්ගේ (*Trachemys scripta*) ශරිර මිණුම් පිළිබඳ අධ්‍යයනය.
- දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ඕලු මුවන්ගේ (*Muntiacus muntjak*) හැසිරීම් රටා පිළිබඳ පර්යේෂණය.
- දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ගුවානාකෝ සතුන්ගේ Enteritis නැමති රෝගය උග්‍ර ලෙස පැතිරියාම පිළිබඳ පර්යේෂණය.
- වල් දර්ශ ගප්පි මසුන්ගේ පරපෝෂී ආසාදන පිළිබඳ ජෛව විද්‍යාත්මක පර්යේෂණය.
- සර්ප විශේෂයන්හි බාහිර පරපෝශිතයන් පිළිබඳ ජෛව විද්‍යාත්මක පර්යේෂණය.

### 5.2.1. 2016 වර්ෂයේ දෙහිවල ජාතික සත්වෝද්‍යානයේදී බාහිර පාර්ශවයන් විසින් සිදු කරන ලද පර්යේෂණ

- තිත් හොට පැස්තුඩුවන්ගේ (*Pelecanus philippensis*) ගහණය සහ ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක පිළිබඳ පර්යේෂණය. (කැළණි විශ්ව විද්‍යාලයේ සිසුවියන් දෙදෙනෙකු විසිනි.)
- දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ මීමින්නන්ගේ (*Moschiola meminna*) භෝජන රටාව පිළිබඳ පර්යේෂණය. (රුහුණු විශ්ව විද්‍යාලයේ සිසුවියක් විසිනි.)

පින්නවල අලි අනාථාගාරය විසින් 2016 වර්ෂය තුළ දී සිය ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් පර්යේෂණ 03 ක් ක්‍රියාත්මක කර ඇත. එනම්;

- පින්නවල අලි අනාථාගාරයේ අලි ඇතුන්ගේ ශරීර තත්ත්වය පිළිබඳ මිණුම් කිරීම.
- අලි අනාථාගාරයේ අනාගත අලෙවිකරණ හැකියාව සහ එය වැඩි දියුණු කිරීමට ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ පර්යේෂණය.
- පින්නවල අලි අනාථාගරයේ අලි ඇතුන් සංරක්ෂණය පිළිබඳ පාසල් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ අවබෝධය පිළිබඳ පර්යේෂණය.


එම පර්යේෂණ සඳහා දත්ත රැස් කිරීම 2017 වසර තුළ ද ක්‍රියාත්මක වේ.

## 6. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සංචාරක පැමිණීම සහ ආදායම -2016


වගුව 8 : සංචාරක පැමිණීම සහ ආදායම - 2016

| මාසය | පැමිණීම | | | ආදායම (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | වෙනත් | එකතුව |
| ජනවාරි | 115,847 | 44,816 | 160,663 | 10.09 | 92.89 | 2.58 | 105.57 |
| පෙබරවාරි | 138,927 | 47,049 | 185,976 | 11.07 | 104.05 | 1.85 | 116.98 |
| මාර්තු | 182,966 | 42,027 | 224,993 | 12.50 | 90.57 | 1.50 | 104.57 |
| අප්‍රේල් | 192,004 | 26,790 | 218,794 | 17.01 | 56.76 | 2.43 | 76.20 |
| මැයි | 84,503 | 22,895 | 107,398 | 8.51 | 39.93 | 2.06 | 50.49 |
| ජුනි | 108,172 | 18,521 | 126,693 | 9.98 | 37.22 | 1.57 | 48.77 |
| ජූලි | 316,801 | 38,622 | 355,423 | 26.48 | 80.25 | 1.76 | 108.50 |
| අගෝස්තු | 512,411 | 40,481 | 552,892 | 46.13 | 85.66 | 2.57 | 134.36 |
| සැප්තැම්බර් | 294,213 | 29,949 | 324,162 | 27.29 | 60.65 | 3.29 | 91.23 |
| ඔක්තෝබර් | 217,296 | 29,904 | 247,200 | 20.59 | 56.40 | 2.54 | 79.52 |
| නොවැම්බර් | 95,538 | 32,641 | 128,179 | 10.07 | 62.83 | 1.36 | 74.26 |
| දෙසැම්බර් | 285,283 | 42,081 | 327,364 | 30.25 | 73.85 | 3.11 | 107.22 |
| **එකතුව** | **2,543,961** | **415,776** | **2,959,737** | **229.97** | **841.07** | **26.63** | **1097.66** |

## 6.1. ප්‍රස්ථාර සටහන- සංචාරකයින්ගේ පැමිණීම 2016




## 6.2. ප්‍රස්ථාර සටහන - සංචාරකයින්ගෙන් ලද ආදායම 2016




## 6.3. 2015 සහ 2016 අතර සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම සංසන්දනය

වගුව 9 : 2015 සහ 2016 අතර සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම සංසන්දනය

| මාසය | පැමිණීම | | ආදායම (රු.මි.) | |
|---|---|---|---|---|
| | 2015 | 2016 | 2015 | 2016 |
| ජනවාරි | 109,918 | 160,663 | 88.52 | 105.57 |
| පෙබරවාරි | 157,050 | 185,976 | 114.02 | 116.98 |
| මාර්තු | 186,461 | 224,993 | 90.57 | 104.57 |
| අප්‍රේල් | 192,949 | 218,794 | 71.2 | 76.2 |
| මැයි | 248,562 | 107,398 | 59.19 | 50.49 |
| ජූනි | 206,851 | 126,693 | 55.7 | 48.77 |
| ජූලි | 344,612 | 355,423 | 100.05 | 108.5 |
| අගෝස්තු | 472,627 | 552,892 | 124.1 | 134.36 |
| සැප්තැම්බර් | 275,496 | 324,162 | 85.71 | 91.23 |
| ඔක්තෝබර් | 210,071 | 247,200 | 77.2 | 79.52 |
| නොවැම්බර් | 116,442 | 128,179 | 72.19 | 74.26 |
| දෙසැම්බර් | 260,341 | 327,364 | 96.41 | 107.22 |
| **එකතුව** | **2,781,380** | **2,959,737** | **1,035.86** | **1,097.66** |

## 6.4. ජාතික සත්වෝද්‍යාන සඳහා සංචාරක පැමිණීම සහ ආදායම -2016


**වගුව 10:** උද්‍යාන සඳහා සංචාරක පැමිණීම සහ ආදායම - 2016


| උද්‍යානය | පැමිණීම | | | ආදායම (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය ප්‍රවේශ පත්‍ර | විදේශීය ප්‍රවේශ පත්‍ර | වෙනත් | එකතුව |
| දෙහිවල සත්වෝද්‍යානය | 1,392,217 | 32,334 | 1,424,551 | 110.52 | 50.32 | 20.65 | 181.49 |
| පින්නවල අලි අනාථාගාරය | 666,881 | 381,105 | 1,047,986 | 49.92 | 788.25 | 5.57 | 843.74 |
| පින්නවල සත්වෝද්‍යානය | 267,656 | 1,838 | 269,494 | 20.97 | 1.51 | 0.37 | 22.85 |
| හම්බන්තොට සෆාරි උද්‍යානය (2016.03.28 සිට) | 217,207 | 499 | 217,706 | 48.56 | 0.99 | 0.03 | 49.59 |
| **එකතුව** | **2,543,961** | **415,776** | **2,959,737** | **229.97** | **841.07** | **26.63** | **1,097.66** |

## 6.5. 2010 වසරේ සිට 2016 වසර දක්වා සංචාරක පැමිණීම සහ ආදායම

වගුව 11 :2010 වසරේ සිට 2016 වසර දක්වා සංචාරක පැමිණීම සහ ආදායම

| **වර්ෂය** | **පැමිණීම** | **ආදායම (රු.මි.)** |
|---|---|---|
| 2010 | 2,324,360 | 587.74 |
| 2011 | 2,438,635 | 651.38 |
| 2012 | 2,196,704 | 645.29 |
| 2013 | 2,172,810 | 719.87 |
| 2014 | 2,042,887 | 906.50 |
| 2015 | 2,781,380 | 1,034.87 |
| 2016 | 2,959,737 | 1,097.66 |



## 7. ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති

### 7.1. දෙහිවල ජාතික සත්වෝද්‍යානය සංවර්ධනය

සත්ත්ව සුබසාධනය සහ මහජනතාවට රසාස්වාදයක් ලබා දීම උදෙසා 2016 වර්ෂය තුළ දී දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය කිරීමේ කටයුතු රැසක් සිදු කරන ලදී.

නවීන සත්වෝද්‍යාන සංකල්ප වලට අනුව සත්වයින් සඳහා වැඩි ඉඩකඩ සහිත සත්ත්ව අරණ සහ නරඹන්නන් සඳහා නවීන පහසුකම් සපයමින් 2011 වර්ෂයේ සිට  දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ නවීකරණ කටයුතු ආරම්භ කර ඇත.බළල් පවුලේ සාමාජිකයන් සඳහා අරණ සහ විදේශීය කුරුලු උයන ඉදිකිරීම් කටයුතු 2016 වර්ෂය තුළ දී අවසන් කර ඇත. උරග උයන නවීකරණය, කුණු දවනය අලුත්වැඩියාව, ආදී  තවත් සංවර්ධන ව්‍යාපෘති රැසක් 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක කරමින් සිටියි. 2016 වර්ෂය අවසන් වන විට දෙහිවල සත්වෝද්‍යාන මහා සැලැස්මෙහි සමස්ත නවීකරණ කටයුතු වල 50% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| 2016 ඒකාබද්ධ අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 140.00 |
| 2016 සත්වෝද්‍යාන අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 100.00 |
| ඒකාබද්ධ අරමුදලින් කල වියදම | - රු.මි. 90.314 |
| සත්වෝද්‍යාන අරමුදලින් කල වියදම | - රු.මි. 17.318 |
| මුළු වියදම | - රු.මි. 107.632 |
| 2011 වර්ෂයේ සිට සමුච්චිත වියදම - ඒකාබද්ධ අරමුදල | - රු.මි.427.716 |
| - සත්වෝද්‍යාන අරමුදල | - රු.මි.160.557 |
| මුළු සමුච්චිත වියදම | - රු.මි.588.273 |


වගුව 12: ප්‍රධාන සංවර්ධන කාර්යයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| ප්‍රධාන ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති | 2016 වෙන් කරන ලද මුදල (රු.මි.) | 2016 සමුච්චිත සත්‍ය වියදම (රු.මි.) | 2016 භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| දෙහිවල ජාතික සත්වෝද්‍යාන යේ සංවර්ධන කටයුතු | රජයේ ඒකාබද්ධ අරමුදල | **140** | **90.314** | |
| | සත්ත්ව අභිජනන කූඩු අලුත්වැඩියාව | 1.00 | | ඉදිකිරීම් අවසන්. |
| | බළල් පවුලේ සාමාජිකයන් සඳහා අරණ | 20.51 | | ඉදිකිරීම් අවසන්. |
| | විදේශීය කුරුලු උයන නවීකරණය කිරීම | 12.67 | | ඉදිකිරීම් අවසන්. |
| | වඳුරු කූඩු නවීකරණය | 8.50 | | ඉදිකිරීම් අවසන්. |
| | නිදහස් අලි අරණ පෙදෙස ඉදිකිරීම | 15.00 | | 72 % ක පමණ ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත. |
| | චිම්පන්සි අරණ අදියර - 01 | 17.42 | | 25% ක පමණ ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත. |
| | මාර්ග අංක -06 (අමතර වැඩ ඇතුළත් කරන ලදී) | 11.17 | | |
| | මාර්ග අංක -06 | | | ඉදිකිරීම් අවසන්. |
| | උයන් කුටි(Summer hut) | | | නිර්මාණ කටයුතු අනුමතයි.ඉදිකිරීම් කටයුතු කල් දමන ලදී. |
| | කුණු දවනය අලුත්වැඩියාව | 4.20 | | ඉදිකිරීම් අවසන්. |
| | මින් මැදුර අලුත්වැඩියාව | 3.61 | | 98% ක පමණ ඉදිකිරීම් කටයුතු කර ඇත. |
| | සේවා සපයන මාර්ග සහ කාර්ය මණ්ඩල රථ ගාල සහ වැසිකිළි පද්ධතිය අදියර - 01 | 9.92 | | ඉදිකිරීම් අවසන්. |
| | සේවා සපයන මාර්ග සහ කාර්ය මණ්ඩල රථ ගාල සහ වැසිකිළි පද්ධතිය අදියර - 02 | 4.00 | | ඉදිකිරීම් අවසන්. |
| | මාර්ග අංක 08 සහ ආශ්‍රිත කලාපය සංවර්ධනය කිරීම | 22.00 | | 18 % ක පමණ ඉදිකිරීම් කටයුතු කර ඇත. |
| | මායිම් තාප්පය අලුත්වැඩියාව– 1 කොටස | 5.00 | | ඉදිකිරීම් අවසන්. |

| ප්‍රධාන ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති | **2016 වෙන් කරන ලද මුදල (රු.මි.)** | **2016 සමුච්චිත සත්‍ය වියදම (රු.මි.)** | **2016 භෞතික ප්‍රගතිය** |
|---|---|---|---|---|
| | මායිම් තාප්පය අලුත්වැඩියාව - 2 කොටස | 2.00 | | 15 % ක ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත. |
| | වැසිකිළි පද්ධතිය | 3.00 | | නිර්මාණ කටයුතු අනුමතයි. ඉදිකිරීම් කටයුතු කල් දමන ලදී. |
| | **සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල** | **100.00** | **17.318** | |
| | ඕරං උටං සතුන් සඳහා ඇවිදීමට මාර්ගය | 2.00 | | BOQ සකසමින් පවතී. |
| | උරග උයනේ බිම පිහන් ගඩොල් ඇල්ලීම | 1.50 | | ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. |
| | මුවන් සඳහා පෙදෙස නවීකරණය | 3.00 | | BOQ සකසමින් පවතී. |
| | දිවි අරණ අලුත්වැඩියාව | 1.00 | | අලුත්වැඩියා කටයුතු අවසන්. |
| | සමනළ උයන අලුත්වැඩියාව | 2.00 | | අලුත්වැඩියා කටයුතු අවසන්. |
| | දැනට පවතින සත්ත්ව අරණ සඳහා කුඩා ප්‍රමාණයේ අලුත්වැඩියා කිරීම | 1.00 | | 2016 සඳහා අපේක්ෂිත අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇත. |
| | 7.Bar less කූඩු පෙළ නවීකරණය කිරීම අදියර -I | 35.00 | | 40 % ක ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත. |
| | මුහුදු සිංහ පොකුණ වටා අඩි 03 ක් උස වීදුරු බාධකය | 8.00 | | කල් දමන ලදී. |
| | සත්ත්ව රෝහල අදියර - I | 13.00 | | නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී. |

| ප්‍රධාන ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති | 2016 වෙන් කරන ලද මුදල (රු.මි.) | 2016 සමුච්චිත සත්‍ය වියදම (රු.මි.) | 2016 භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| | කෞතුකාගාරයේ වහල අලුත්වැඩියාව | 1.00 | | අලුත්වැඩියා කටයුතු අවසන්. |
| | ළමා මුළුව අලුත්වැඩියාව අදියර - I | 7.50 | | BOQ සකසමින් පවතී. |
| | භූමි අලංකරණය | 2.00 | | 2016 සඳහා අපේක්ෂිත භූමි අලංකරණ කටයුතු උද්භිද දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ජා.ස.දෙ. සේවකයන් විසින් නිම කර ඇත. |
| | අනෙකුත් කුඩා අලුත්වැඩියා කිරීම් | 3.00 | | 2016 සඳහා අපේක්ෂිත අලුත්වැඩියා කටයුතු අවසන්. |
| | ප්‍රවේශ ගොඩනැගිල්ල ඉදිකිරීම -අදියර -I | 15.00 | | BOQ ඇගයීම් කටයුතු සිදුකරමින් පවතී. |
| | ගෝනපොළ ගොවිපොළ සඳහා වැට සහ කෘෂි ළිඳ | 5.00 | | නිර්මාණ කටයුතු සහ BOQ සකසමින් පවතී. |

## 2016 වසරේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්හි රූපරාමු කිහිපයක්







බළල් පවුලේ සාමාජිකයන් සඳහා ඉදි කළ නව අරණ



නරඹන්නන් සඳහා ඉදි කළ නව ගිමන්හල





නවීකරණ කටයුතු අවසන් කල විදේශීය කුරුලු උයන

## 7.2. පින්නවල අලි අනාථාගාරයේ ප්‍රධාන සංවර්ධන කාර්යයන්

අලි මඩු ඉදිකිරීම, කාර්යාලය අවට මායිම් තාප්පය ඉදිකිරීම, විදේශීය නරඹන්නන් සඳහා නව ප්‍රවේශ ගේට්ටුවක් ඉදිකිරීම, ආබාධිත අලින් සඳහා නාන තටාකයක් ඉදිකිරීම  කිරීම වැනි සංවර්ධන කාර්යයන් 2016 වර්ෂය තුළ ඉටු කරන ලදී.

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| 2016 ඒකාබද්ධ අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 10.00 |
| | - රු.මි. 23.40* |
| 2016 සත්වෝද්‍යාන අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 50.00 |
| ඒකාබද්ධ අරමුදලින් කල වියදම | - රු.මි. 23.36 |
| සත්වෝද්‍යාන අරමුදලින් කල වියදම | - රු.මි. 8.73 |
| මුළු වියදම | - රු.මි. 32.09 |

**2016 වසරේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්හි රූපරාමු කිහිපයක්**





**අලුතින් ඉදි කරන ලද අලි මඩු**



**නව ප්‍රවේශ පත්‍ර අලෙවි හල**



**කාර්යාලය අවට මායිම් තාප්පය**



**ආබාධිත අලින් සඳහා පොකුණ**



**නාරම්බැද්ද ප්‍රදේශයේ විවේක කාමරය**

*සංශෝධිත ඇස්තමේන්තුගත මුදල

*වගුව 13 : 2016 ප්‍රධාන සංවර්ධන කාර්යයන් -පින්නවල අලි අනාථාගාරය*

| ප්‍රධාන ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති | **2016 වෙන් කරන ලද මුදල (රු.මි.)** | **2016 සත්‍ය වියදම (රු.මි.)** | ව්‍යාපෘති භෞතික ප්‍රගතිය- 2016 |
|---|---|---|---|---|
| පින්නවල අලි අනාථාගාරය | **රජයේ ඒකාබද්ධ අරමුදල** | 23.40 | 23.36 | |
| | අලි මඩු ඉදිකිරීම (2016 සඳහා අපේක්ෂිත) | | | ඉදිකිරීම් අවසන්. |
| | සේවා සපයන මාර්ග අලුත්වැඩියා කිරීම | | | 60%ක ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත. |
| | භූමි අලංකරණය | | | 75%ක ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත. |
| | මඳ කිපුණු අලින් සඳහා අරණ | | | 2%ක ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත. |
| | අනෙකුත් සුළු පරිමාණ සංවර්ධන කටයුතු | | | 2016 සඳහා අපේක්ෂිත අලුත්වැඩියා කටයුතු අවසන්. |
| | **සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල** | **50.00** | **8.73** | |
| | උද්‍යාන අංක IV සංවර්ධනය | 2.00 | | 80%ක ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත. |
| | උද්‍යාන අංක VI සංවර්ධනය | 1.50 | | BOQ අනුමැතියට යවා ඇත. |
| | කාර්යාලය අසල මායිම් තාප්පය ඉදිකිරීම. | 4.00 | | ඉදිකිරීම් අවසන්. |
| | විදේශිකයන් සඳහා වූ ප්‍රවේශ ගේට්ටුව | 3.00 | | ඉදිකිරීම් අවසන්. |
| | ප්‍රධාන මාර්ගය අසල මායිම් තාප්පය ඉදිකිරීම. | 10.00 | | 5%ක ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත. |
| | නාරම්බැද්ද ප්‍රදේශයේ විවේක කාමරයක් ඉදිකිරීම. | 3.00 | | 95%ක ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත. |
| | සේවකයක් සඳහා ගරාජය | 1.00 | | BOQ සකසමින් පවතී. |
| | අළුතින් අත්කරගත් ඉඩම වටා තාප්පය සහිත චේන් ලින්ක් වැට. | 4.00 | | පසුවට කල් දමා ඇත. |
| | ගේට්ටුව C ආසන්නයේ ඇති ළිඳ අළුත්වැඩියාව. | 2.00 | | ඉදිකිරීම් අවසන්. |
| | ආබාධිත අලින් සඳහා පොකුණ | 2.00 | | ඉදිකිරීම් අවසන්. |
| | නරඹන්නන් සඳහා කාර්යාලයේ කොටසක් වෙන් කිරීම | 0.50 | | ඉදිකිරීම් අවසන්. |
| | සහකාර අධ්‍යක්ෂ සහ පශු වෛද්‍යවරුන් සඳහා නිලනිවාස | 7.00 | | මූලික ගෙවීම්කර ඇත. (Mobilizations ad-vance) |

## 7.3. පින්නවල නව සත්වෝද්‍යානයේ ඉදිකිරීම් කටයුතු

ශ්‍රී ලංකා දිවි අරණ සහ මිශ්‍ර මුව අරණ යන සත්ත්ව අරණ වල ඉදිකිරීම් කටයුතු අවසන් කර ප්‍රදර්ශන කටයුතු 2015.04.17 දින සිට ආරම්භ කරන ලදී. අලුතින් ඉදි කරන ලද කිඹුල් අරණ සහ වලස් අරණ ද 2016 වසරේ මැද භාගයේ දී නරඹන්නන් සඳහා විවෘත කරන ලදී. 2016 වර්ෂය අවසන් වන විට පින්නවල සත්වෝද්‍යාන මහා සැලසුමෙහි 20% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

| | | |
|---|---|---|
| 2016 ඒකාබද්ධ අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. | 180.00 |
| | - රු.මි. | 98.93* |
| 2016 සත්වෝද්‍යාන අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. | 100.00 |
| ඒකාබද්ධ අරමුදලින් කල වියදම | - රු.මි. | 63.82 |
| සත්වෝද්‍යාන අරමුදලින් කල වියදම | - රු.මි. | 17.73 |
| මුළු වියදම | - රු.මි. | 81.55 |
| 2008 සිට සමුච්චිත වියදම - ඒකාබද්ධ අරමුදල | - රු.මි. | 627.88 |
| - සත්වෝද්‍යාන අරමුදල | - රු.මි | 439.25 |
| මුළු සමුච්චිත වියදම | - රු.මි. | 1067.13 |

**2016 වසරේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්හි රූපරාමු කිහිපයක්**



වලස් අරණ



කිඹුල් අරණ



දර යොදනු ලබන මුළුතැන්ගෙය



මහජන වැසිකිළි පද්ධතිය



මායිම් තාප්පය



වඳුරු දූපත

*සංශෝධිත ඇස්තමේන්තුගත මුදල

*වගුව 14: ප්‍රධාන සංවර්ධන කාර්යයන්;*

| ප්‍රධාන ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති | 2016 වෙන් කරන ලද මුදල (රු.මි.) | 2016 සත්‍ය වියදම (රු.මි.) | 2016 භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු** | **රජයේ ඒකාබද්ධ අරමුදල** | **98.93** | **63.82** | |
| | 1. වලස් අරණ | | | ඉදිකිරීම් අවසන්. |
| | 2. කිඹුල් අරණ | | | ඉදිකිරීම් අවසන්. |
| | 3. සමනළ උයන | | | 2017 දක්වා කල් දමන ලදී. |
| | 4. උරග උයන | | | සැලසුම් අදියරේ පවතී. 2017 දක්වා කල් දමන ලදී. |
| | 5. වඳුරු දූපත | | | 20%ක ඉදිකිරීම් අවසන් කර ඇත. |
| | 6. ජලජ පක්ෂි දූපත | | | 2017 දක්වා කල් දමන ලදී. |
| | 7. නරඹන්නන් සඳහා වැසිකිළි පද්ධතිය | | | 17%ක ඉදිකිරීම් අවසන් කර ඇත. |
| | **සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල** | **100.00** | **17.73** | |
| | 1. දේශීය කුරුලු උයන | | | කල් දමන ලදී. |
| | 2. සුරතල් සතුන්ගේ පෙදෙස | | | කල් දමන ලදී. |
| | 3. භූමි අලංකරණය | | | කල් දමන ලදී. |
| | 4. මායිම් තාප්පය | | | ඉදිකිරීම් අවසන්. |
| | 5. පශු වෛද්‍ය අංශය සඳහා ගොඩනැගිල්ල | | | 2017 දක්වා කල් දමන ලදී. |
| | 6. සතුන් සඳහා ආහාර සකසන ගොඩනැගිල්ල | | | 14%ක පමණ ඉදිකිරීම් කටයුතු කර ඇත. |
| | 7. අනෙකුත් කුඩා ප්‍රමාණයේ සංවර්ධන කටයුතු | | | 2016 සඳහා අපේක්ෂිත අලුත්වැඩියා කටයුතු අවසන්. |

## 7.4. හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු

හම්බන්තොට සෆාරි උද්‍යානය 2016 වර්ෂය තුළ සිංහ කලාපයේ, අප්‍රිකානු ශාක භක්ෂක සත්ව කලාපයේ, ආසියානු අලි කලාපයේ, මෙහෙයුම් පෙදෙසෙහි සහ නේවාසික පෙදෙසෙහි ඉදිකිරීම් කටයුතු, නරඹන්නන් සඳහා පහසුකම් සහ වෙනත් යටිතල පහසුකම් ඇති කිරීමේ කටයුතු වලද නිරත විය. 2016 වර්ෂය අවසන් වන විට සෆාරි උද්‍යාන ව්‍යාපෘතියෙහි 78%ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| 2016 ඒකාබද්ධ අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 200.00 |
| | - රු.මි. 265.60* |
| 2016 සත්වෝද්‍යාන අරමුදලින් වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 230.00 |
| ඒකාබද්ධ අරමුදලින් කල වියදම | - රු.මි. 265.144 |
| සත්වෝද්‍යාන අරමුදලින් කල වියදම | - රු.මි. 27.27 |
| මුළු වියදම | - රු.මි. 292.415 |
| 2008 සිට සමුච්චිත වියදම - ඒකාබද්ධ අරමුදල | - රු.මි. 1111.73 |
| සත්වෝද්‍යාන අරමුදල | - රු.මි. 818.55 |
| මුළු සමුච්චිත වියදම | - රු.මි. 1930.28 |



අලි නාන පොකුණ



වැව අංක - 01



අච්චාහක නිලධාරීන් සඳහා නිල නිවාස



රියදුරන් සඳහා විවේක කාමර

*සංශෝධිත ඇස්තමේන්තුගත මුදල

*වගුව 15: ප්‍රධාන සංවර්ධන කාර්යයන්;*

| ප්‍රධාන ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති | **2016 වෙන් කරන ලද මුදල (රු.මි.)** | **2016 සත්‍ය වියදම (රු.මි.)** | **2016 භෞතික ප්‍රගතිය** |
|---|---|---|---|---|
| සෆාරි උද්‍යාන ව්‍යාපෘතිය | **රජයේ ඒකාබද්ධ අරමුදල** | **265.60** | **265.144** | |
| | අලි අරණ සහිත ආසියානු කලාපය | | | |
| | අලින් සඳහා ඉදි කරන විවේක පෙදෙස | | | 100% ඉදිකිරීම් අවසන්. |
| | අලි නාන පොකුණ | | | 90%කඉදිකිරීම් අවසන් |
| | වැව -01 | | | 100%ක |
| | වැව-02හි | | | 95%කඉදිකිරීම් අවසන් |
| | අගල | | | 85%කඉදිකිරීම් අවසන් |
| | ජල සැපයුම | | | 20%ඉදිකිරීම් අවසන් |
| | කලාපය වටා 8' චේන්ලින්ක් වැට | | | 35%ක ඉදිකිරීම් අවසන් |
| | මඳ කිපුන අලින් සඳහා අලි මඩුව | | | අදාළ ඉදි කිරීම් ආයතනය වෙත බාරදී ඇත. |
| | අලි අරණ සහිත ආසියානු කලාපයේ බොරළු මාර්ගය | | | නිර්මාණ කටයුතු අනුමත වී ඇත. |
| | ආසියානු කලාපය, සිංහ කලාපය සහ මෙහෙයුම් කලාපයේ අතිරේක ක්‍රියාකාරකම් | | | ඉදිකිරීම් කටයුතු අවසන්. |
| | බෙංගාල කොටි කලාපය | | | |
| | අප්‍රිකානු කලාපයට මායිම් ව ඇති 16' උස චේන්ලින්ක් වැටෙහි | | | 75% ඉදිකිරීම් අවසන් |
| | ආසියානු කලාපයට මායිම් ව ඇති 16' උස චේන්ලින්ක් වැටෙහි | | | 50% ඉදිකිරීම් අවසන් |
| | වලස් කලාපයටසහ බෙංගාල කොටි මායිම් ව ඇති 16' උස චේන්ලින්ක් වැටෙහි | | | 60% ඉදිකිරීම් අවසන් |
| | දිවියන් සහ බෙංගාල කොටි කලාපයට මායිම් ව ඇති 16' උස චේන්ලින්ක් වැටෙහි | | | 65% ඉදිකිරීම් අවසන් |
| | ගුහා සහඅනෙකුත් ව්‍යුහාත්මක ඉදිකිරීම් | | | නිර්මාණ කටයුතු අනුමත වී ඇත. |
| | ප්‍රධාන විදුලි බල පද්ධතිය | | | ඉදිකිරීම් අවසන්. |
| | මෙහෙයුම් කලාපයේ මාර්ග ජාලය | | | ඉදිකිරීම් අවසන්. |
| | ප්‍රවේශ කලාපයේ භූමි අලංකරණය | | | ඉදිකිරීම් අවසන්. |
| | ගරාජය | | | ඉදිකිරීම් අවසන්. |
| | අවිවාහක නිලධාරීන් සඳහා නිල නිවාස | | | ඉදිකිරීම් අවසන්. |
| | රියදුරන් සඳහා විවේක කාමර | | | ඉදිකිරීම් අවසන්. |
| | ජල සැකසුම් ඒකකයේ අතිරේක වැඩ | | | ඉදිකිරීම් අවසන්. |
| | ගෑස් ක්ලෝරිනේටර් | | | ඉදිකිරීම් අවසන්. |
| | මාණ්ඩලික නිලධාරීන් සඳහා නිල නිවාස | | | 20%ඉදිකිරීම් සිදුකර ඇත. |
| | කැලෑ එළි කිරීම් | | | එළි කිරීම් කටයුතු අවසන් වී ඇත. |

| ප්‍රධාන ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති | 2016 වෙන් කරන ලද මුදල (රු.මි.) | 2016 සත්‍ය වියදම (රු.මි.) | 2016 භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| | **සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල** | **230.00** | **27.27** | |
| | 1. සංරක්ෂණ මධ්‍යස්ථානය | | | සැලසුම් නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී. |
| | 2. ඕස්ට්‍රේලියානු කලාපය - අදියර - I | | | කැලෑ එළි කිරීම්, මාර්ග පද්ධතිය සහ වැට ඉදිකිරීම් ඉදි කිරීම් අදාළ ආයතනය වෙත පවරා දී ඇත. |
| | 3. කුඩා සත්ව රාජධානිය | | | සැලසුම් නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී. |
| | 4. අප්‍රිකානු කලාපය - අදියර - II | | | ජිරාෆ් සතුන් සඳහා වූ පෙදෙස වටා විදුලි වැට ඉදිකිරීම අදාළ ඉදි කිරීම් ආයතනය වෙත බාරදීඇත. |
| | 5. සිංහ කලාපය - අංක 03 සිංහ කූඩු පෙළ | | | අදාළ ඉදි කිරීම් ආයතනය වෙත බාරදී ඇත. |
| | 6. මෙහෙයුම් කලාපය | | | චේන්ලින්ක් වැට සහ ගබඩා කාමරය ඉදිකිරීම් අවසන්. |
| | 7. පෙර වර්ෂයේ ඉදිකිරීම් සඳහා ගෙවීම් සඳහා වෙන් කිරීම | | | - |

# 8 මූල්‍ය ප්‍රගතිය

## 8.1. රජයේ ඒකාබද්ධ අරමුදල

2016 වර්ෂය අවසන් වන විට රජයේ ඒකාබද්ධ අරමුදලින් දරණ ලද වියදම රු.මි.797.609 වේ. එය ප්‍රාග්ධන වියදම් ලෙස රු.මි.453.4ක් සහ පුනරාවර්තන වියදම ලෙස රු.මි.344.209ක් ලෙස උපයෝජනය කොට ඇත.

වගුව 16: වියදම් තොරතුරු - රජයේ ඒකාබද්ධ අරමුදල

(රු.000)

| වැය අංකය | වර්ගීකරණය / වැය ශීර්ෂය | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|
| | | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම |
| | **පුනරාවර්තන වියදම** | **299,783** | **299,082** | **345,213** | **344,209** |
| | **පුද්ගල වේතන** | **266,183** | **265,895** | **312,923** | **312,689** |
| 1001 | වැටුප් සහ වේතන | 97,120 | 96,913 | 126,509 | 126,497 |
| 1002 | අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 37,500 | 37,472 | 47,075 | 47,074 |
| 1003 | වෙනත් දීමනා | 131,563 | 131,510 | 139,339 | 139,117 |
| | **ගමන් වියදම්** | **1,180** | **1,156** | **1,640** | **1,621** |
| 1101 | දේශීය | 1,100 | 1,097 | 1,550 | 1,544 |
| 1102 | විදේශීය | 80 | 59 | 90 | 77 |
| | **සැපයුම්** | **17,141** | **17,009** | **13,640** | **13,504** |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 2,000 | 1,983 | 2,920 | 2,916 |
| 1202 | ඉන්ධන | 10,100 | 10,078 | 6,600 | 6,478 |
| 1203 | ආහාර සහ නිල ඇඳුම් | 5,041 | 4,948 | 4,120 | 4,110 |
| 1205 | වෙනත් | - | - | - | - |
| | **නඩත්තු වියදම්** | **4,400** | **4,304** | **5,290** | **5,202** |
| 1301 | වාහන | 2,200 | 2,186 | 3,250 | 3,230 |
| 1302 | යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 1,000 | 982 | 1,040 | 1,033 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,200 | 1,136 | 1,000 | 939 |
| | **සේවා** | **9,179** | **9,057** | **9,840** | **9,330** |
| 1401 | ප්‍රවාහන | - | - | - | - |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 1,900 | 1,876 | 2,000 | 1,879 |
| 1403 | විදුලිය සහ ජලය | 2,434 | 2,347 | 2,540 | 2,529 |
| 1404 | කුලී සහ දේශීය බදු | 25 | 21 | 800 | 785 |
| 1405 | වෙනත් | 4,820 | 4,813 | 4,500 | 4,137 |
| | **පැවරුම්** | **1,700** | **1,661** | **1,880** | **1,864** |
| 1506 | දේපළ ණය පොළිය | 1,700 | 1,661 | 1,880 | 1,864 |

| වැය අංකය | වර්ගීකරණය / වැය ශීර්ෂය | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|
| | | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම |
| | **ප්‍රාග්ධන වියදම** | **596,650** | **163,310** | **539,700** | **453,400** |
| | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරීම | 125,850 | 52,895 | 145,830 | 95,683 |
| 2001 | **ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | 120,000 | 48,862 | 140,000 | 90,314 |
| 2002 | යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 3,000 | 1,710 | 3,230 | 3,223 |
| 2003 | වාහන | 2,850 | 2,323 | 2,600 | 2,146 |
| | **ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම** | **470,000** | **110,332** | **392,880** | **357,258** |
| 2101 | වාහන | - | - | - | - |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 1,000 | 1,339 | 1,500 | 1,492 |
| 2103 | යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 12,000 | 7,287 | 3,450 | 3,443 |
| 2104 | **ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | **457,000** | **101,686** | **387,930** | **352,322** |
| | අලි අනාථාගාරය | 32,000 | 8,969 | 23,400 | 23,356 |
| | පින්නවල නව සත්වෝද්‍යානය | 91,000 | 31,135 | 98,930 | 63,822 |
| | රිදියගම සෆාරි උද්‍යානය | 332,000 | 56,582 | 265,600 | 265,144 |
| | වෙනත් | 1,000 | 5,000 | - | - |
| | යෝජිත සත්වෝද්‍යානය - පිළියන්දල (මඩපාත) | 1,000 | - | - | - |
| | **මානව සම්පත් සංවර්ධනය** | **300** | **83** | **490** | **459** |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණුව | 300 | 83 | 490 | 459 |
| | **වෙනත් ප්‍රාග්ධන වියදම්** | **500** | **-** | **500** | - |
| 2502 | වෙනත් ආයෝජන | 500 | - | 500 | - |
| | **මුළු වියදම** | **896,433** | **383,301** | **884,913** | **797,609** |

## 8.2. සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල

1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනතේ විධි විධාන වලට අනුව සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල පිහිටුවා ඇත. සත්වෝද්‍යාන නිෂ්පාදන විකිණීමෙන් ලැබෙන සියලු මුදල්, පරිත්‍යාග, දඩ මුදල් හෝ ආදායමක් වශයෙන් කවර ප්‍රභවයකින් හෝ ලැබූ මුදල් මෙම අරමුදලට බැර කරනු ලැබේ.

2016 වර්ෂය අවසන් වන විට සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධන අරමුදලේ වියදම රු.මි.586.526ක් වේ. එය ප්‍රාග්ධන වියදම් ලෙස රු.මි.113.210ක් සහ පුනරාවර්තන වියදම ලෙස රු.මි.473.316ක් ලෙස උපයෝජනය කොට ඇත.

වගුව 17 :වියදම් තොරතුරු - සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල. (රු.000)

| වැය අංකය | වර්ගීකරණය / වැය ශීර්ෂය | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|
| | | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම |
| | පුනරාවර්තන වියදම | | | | |
| 1.Re.10 | සත්ත්ව ආහාර | 236,000 | 234,546 | 265,000 | 264,242 |
| 2.Re.10 | ප්‍රවේශ පත්‍ර මුද්‍රණය | 5,000 | 3,511 | 6,000 | 5,842 |
| 3.Re.10 | දිරි දීමනා ගෙවීම | 23,000 | 22,051 | 25,000 | 24,546 |
| 4.Re.10 | පාරිභෝජන සේවා | 45,000 | 34,479 | 40,000 | 35,612 |
| 5.Re.10 | වෛද්‍ය සැපයීම් | 10,000 | 4,638 | 10,000 | 8,042 |
| 6.Re.10 | බදු ගෙවීම | 40,000 | 38,570 | 80,000 | 73,482 |
| 7.Re.10 | සමරු භාණ්ඩ තොග වෙනස් වීම | 2,000 | 440 | 1,000 | 130 |
| 8.Re.11 | අලෙවි ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය | 1,000 | - | 1,000 | - |
| 10.Re.13 | විවිධ වියදම් | 31,000 | 29,659 | 53,000 | 45,375 |
| 12.Re.15 | විදේශීය පුහුණු වීම් | 5,000 | 2,434 | 1,500 | 828 |
| 13.Re.16 | දේශීය පුහුණු වීම් | 1,000 | 10 | - | - |
| 14.Re.17 | වාහන නඩත්තුව | 4,500 | 3,536 | - | - |
| 15.Re.18 | අධ්‍යාපනය සහ පර්යේෂණ | 1,500 | - | 1,500 | - |
| 16.Re.19 | සේවක සුබසාධනය | 2,500 | 451 | 2,500 | 52 |
| 17.Re.20 | සත්ත්ව හුවමාරු වැඩසටහන සහ සත්ත්ව අභිජනනය | 4,000 | 910 | 4,000 | 2,557 |
| | සෆාරි උද්‍යානයේ ප්‍රවාහන වියදම් | - | - | 20,000 | 12,608 |
| | මුළු පුනරාවර්තන වියදම | 411,500 | 375,235 | 510,500 | 473,316 |
| | ප්‍රාග්ධන වියදම | | | | |
| 15.C.18 | දෙහිවල සත්වෝද්‍යානයේ නව ඉදිකිරීම් | 100,000 | 18,272 | 100,000 | 17,318 |
| 16.C.19 | රිදියගම සෆාරි උද්‍යානය | 220,000 | 154,692 | 230,000 | 27,270 |
| 17.C.20 | පින්නවල නව සත්වෝද්‍යානය | 140,000 | 47,554 | 100,000 | 17,733 |
| 19.C.21 | අලි අනාථාගාරය | 35,000 | 4,344 | 50,000 | 8,731 |
| 20.C.22 | නව ඉදිකිරීම් සඳහා උපකරණ අත්පත් කර ගැනීම | 5,000 | 2,866 | 30,000 | 112 |
| 20.C.23 | වාහන අත්පත් කරගැනීම | 30,000 | 18,143 | 50,000 | 42,046 |
| 20.C.24 | යෝජිත සත්වෝද්‍යානය - පිළියන්දල (මඩපාත) | 35,000 | 549 | - | - |
| | මුළු ප්‍රාග්ධන වියදම | **565,000** | **246,420** | **560,000** | **113,210** |
| | මුළු වියදම | **976,500** | **621,655** | **1,070** | **586,526** |

## 8.3. වියදම් තොරතුරු සාරාංශය 2016

වගුව:18

| අරමුදල් මූලාශ්‍රය | ප්‍රාග්ධන වියදම (රු.මි) | | පුනරාවර්තන වියදම (රු.මි) | | මුළු වියදම (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|---|
| | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම | ඇස්තමේන්තුව (රු.මි) | සත්‍ය වියදම (රු.මි) | ප්‍රගතිය % |
| රජයේ ඒකාබද්ධ අරමුදල | 539.700 | 453.400 | 345.213 | 344.209 | 884.913 | 797.609 | 90 |
| සත්වෝද්‍යාන සංවර්ධන හා සුබසාධන අරමුදල | 560.000 | 113.210 | 510.500 | 473.316 | 1070.500 | 586.526 | 55 |
| **එකතුව** | **1099.7** | **566.61** | **855.713** | **817.525** | **1955.413** | **1384.135** | **71** |

## 8.4. 2016 වර්ෂයේ සත්ත්ව හුවමාරු වැඩසටහන

සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට සතුන් ලබා ගැනීමේ ප්‍රධානතම මාර්ගය විදේශීය සත්වෝද්‍යාන සමග සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. මෙමගින් දෙපාර්තමේන්තුවේ සත්ව විශේෂ සංඛ්‍යාව ඉහල නැංවීම, නව ජාන එකතු කිරීම තුලින් අභිජනන වැඩසටහන් විධිමත් කර නිරෝගී සත්ත්ව පරම්පරාවක් ඇති කිරීම අරමුණු කරනු ලබයි.

2016 වර්ෂයේ දී ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් සත්ත්ව හුවමාරු වැඩසටහන යටතේ ආනයනය කරන ලද සතුන් පිළිබඳව සටහනක් පහත වගුවේ දැක්වේ.

2016 වර්ෂය අවසන් වන තුරු සත්ත්ව හුවමාරු වැඩසටහන යටතේ සතුන් අපනයනය කිරීමක් සිදුකර නොමැත.

*වගුව 19: 2016 සත්ත්ව හුවමාරු වැඩසටහන*

| ආනයනය කරන ලද සතුන් | | | | |
|---|---|---|---|---|
| සත්ත්ව වර්ගය | ප්‍රමාණය | | ආනයන දිනය | සත්වෝද්‍යානය සහ රට |
| | ගැහැණු | පිරිමි | | |
| නිල් කහ මැකෝ *(Ara ara-rauna)* | 01 | 01 | 2016.02.04 | සත්ත්ව උද්‍යානය, චෙක් රිපබ්ලික් |
| ස්කාලට් මැකෝ *(Ara ma-cao)* | 01 | 01 | 2016.02.04 | සත්ව උද්‍යානය, චෙක් රිපබ්ලික් |
| අප්‍රිකානු අළු ගිරවා*(Eclectus raratus)* | 01 | 01 | 2016.02.04 | සත්ත්ව උද්‍යානය, චෙක් රිපබ්ලික් |
| සුදු හංසයා (*Cygnus olor*) | 05 | 05 | 2016.02.04 | සත්ත්ව උද්‍යානය, චෙක් රිපබ්ලික් |
| රතු කැන්ගරු (*Macropus rufus*) | 01 | 03 | 2016.10.13 | තමා සත්වෝද්‍යානය, ජපානය *(පරිත්‍යාගයක් ලෙස ලබා දෙන* |

## 8.5. 2016 සංවර්ධන අරමුදල සහ රජයේ ඇස්තමේන්තුවේ ආදායම් හා වියදම් විශ්ලේෂණය

| ***වගුව 20 :සංවර්ධන අමුදල සහ රජයේ ඇස්තමේන්තුවේ ආදායම් හා වියදම් විශ්ලේෂණය - 2016*** | | |
|---|---|---|
| විස්තරය | වටිනාකම (රු) | |
| සංවර්ධන අරමුදලේ මුළු ආදායම | | 1,097,662,030 |
| භාණ්ඩාගාරයෙන් ලැබූ මුළු අක්මුදල් | 361,748,000 | |
| භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් ලද අක් මුදල් | (66,807,000) | |
| (+) පුනරාවර්තන වියදම් වෙනුවෙන් ලද අක් මුදල් | | 294,941,000 |
| (-) භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද අක්මුදල් | | |
| සංවර්ධන අරමුදල මඟින් | 100,000,000 | |
| | | |
| සංවර්ධන අරමුදල මඟින් 2016/12/31 | 6,444,969 | |
| රජයේ ඇස්තමේන්තුව 2016/12/31 | 26,961 | (106,471,930) |
| ශුද්ධ ලැබීම් | | 1,286,131,100 |
| සංවර්ධන අරමුදලේ පුනරාවර්තන වියදම් | 473,316,348 | |
| රජයේ ඇස්තමේන්තුවේ පුනරාවර්තන වියදම් | 344,209,180 | |
| | | |
| (-) මුළු පුනරාවර්තන වියදම් | | (817,525,528) |
| ලාභය | | 468,605,572 |
| සංවර්ධන අරමුදලේ ප්‍රාග්ධන වියදම් | 113,210,305 | |
| රජයේ ඇස්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් | 453,400,223 | |
| මුළු ප්‍රාග්ධන වියදම් | | 566,610,528 |

# ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව



## 1.හැඳින්වීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධව ශ්‍රී ලංකාවේ පුරෝගාමී ආයතනය වේ. එම දෙපාර්තමේන්තුව ශාක විතැන් සංරක්ෂණය, ශාක පිළිබඳ අධ්‍යයන කටයුතු, ශ්‍රී ලංකාවේ උද්‍යාන අලංකරණ විද්‍යාව ප්‍රවර්ධනය සඳහා පර්යේෂණාත්මක සහ තාක්ෂණික වැඩසටහන්, මල්වගා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදෙන අතර දෙස් විදෙස් සංචාරකයින් සඳහා ආකර්ශනීය ස්ථානයක් ද වේ.

ප්‍රධාන උද්භිද උද්‍යාන වන පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය (1876) සහ ගනේවත්ත වන ඖෂධ පැළෑටි උද්‍යානයට අමතරව පිළිවෙලින් 2013 සහ 2015 වර්ෂයන් හි හම්බන්තොට මිරිජ්ජවිල වියළි කළාපීය උද්භිද උද්‍යානය සහ අවිස්සාවේල්ල සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය මහජනතාවට විවෘත කරන ලදී.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු වන උද්භිද උද්‍යාන තුල ශාක විශේෂ 4500 කට අධික ප්‍රමාණයක් සංරක්ෂණය වී ඇති අතර දුර්ලභ ශාක, වනාන්තර තුලින් වඳ වී ගොස් ඇති ශාක, ශ්‍රී ලංකාවට පමණක් ආවේනික ශාක, වඳ වීමේ තර්ජනයට ලක් වී ඇති ශාක විශේෂ රාශියක් සංරක්ෂණය කර ඇත. මෙම උද්භිද උද්‍යානවලට අමතරව ගනේවත්ත ඖෂධ පැළෑටි උද්‍යානය ශ්‍රී ලංකාවේ ඖෂධ ශාක සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම පිණිස දායක වේ.

උද්භිද විද්‍යාත්මක සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් මෙන්ම ශාක පිළිබඳ විවිධ නිගමනයන් වල සත්‍යබව තහවුරු කිරීමේ කාර්යය සිදුකරනු ලබන්නේ ජාතික ශාකාගාරයෙනි. මල්වගා සංවර්ධන සහ පර්යේෂණ අංශය, මල්වගා පර්යේෂණ කටයුතු සහ විවිධ වැඩසටහන් මඟින් මල් වගා සංවර්ධන කටයුතු සිදුකරමින් ඒ හරහා රට තුල මල්වගා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සිදුකරනු ලබයි. අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානය මඟින් කෙටිකාලීන පුහුණු පාඨමාලා, එක් අවුරුදු සහ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන් සහ අනෙකුත් අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් සිදුකරනු ලබයි.

මහජනතාවට විනෝදාස්වාදය ලබා දීම, ලොව පුරා ශාක වල විවිධත්වය සහ ශාක රාජධානියේ අලංකාරීත්වය රස විඳීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම, ශාක පිළිබඳ දැනුම ලබා දීම හරහා ශාක ප්‍රජාව වෙත ඔවුන් සමීප කරවීම ද ජාතික උද්භිද උද්‍යාන තුලින් සිදුවන මහඟු කාර්යයකි.

### 1.1.දැක්ම

උද්භිද විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක කටයුතු උසස් මට්ටමකින් පවත්වාගනිමින් නිවර්තන කලාපීය හොඳම උද්භිද උද්‍යාන බවට පත් වීම.


### 1.2. මෙහෙවර

ස්වාභාවික සහ නිර්මිත පරිසරයන් තුල ඇති ශාක සම්පත් අධ්‍යයනය, තිරසාර සංරක්ෂණය, අගය කිරීම තුලින් ශාක සම්පත ජනතාවට සමීප කරවීම.

### 1.3. ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමෙහිලා පරිබාහිර සංරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සැළසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
2. අධ්‍යාපන හා සන්නිවේදන ක්‍රමවේද උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත පිළිබඳව හා ශාක සම්පත සමඟ බැඳී පවත්නා විවිධ වූ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ නිවැරදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබා දීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
3. ශ්‍රී ලංකාවේ මල්වගා ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ විවිධ පර්යේෂණ හා තාක්ෂණ ක්‍රමවේද අත් හදා බැලීම හා ක්‍රියාවට නැංවීම.
4. ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වා ගෙන යාම.
5. සුදුසු ස්ථාන වල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍ය වන්නා වූ සංවර්ධන වැඩසටහන් සැළසුම් කිරීම.
6. අලංකරණ උද්‍යාන විද්‍යාව(Amenity Horticulture) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම
7. ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමකින් යුත් වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
8. අනුරාධපුර ජයසිරි මහබෝධින් වහන්සේගේ සෞඛ්‍ය ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම.

## 1.4 කාර්ය මණ්ඩල විස්තර




*
රා.උ.උ. - රාජකීය උද්භිද උද්‍යානය
තෙ.ක.උ.උ. - තෙත් කලාපීය උද්භිද උද්‍යානය
වි.ක.උ.උ. - වියළි කලාපීය උද්භිද උද්‍යානය

**
නි.අධ්‍යක්ෂ - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අධ්‍යක්ෂ - සහකාර අධ්‍යක්ෂ

දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 775 ක් වන අතර, 2016.12.31 දින වන විට 648 දෙනෙකු සේවයේ යෙදී සිටි අතර ඒ පිළිබඳව සාරාංශයක් පහත දැක්වේ.

### 1.4.1 2016.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාවන් පිළිබඳ තොරතුරු

| සේවක ගණය | වැටුප් ක්‍රමය | සේවය/ තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | SL – 3<br>SL- 1 | ශ්‍රී.ලං.වි.සේ<br>ශ්‍රී.ලං.පරි.සේ<br>ශ්‍රී.ලං.ගණ.සේ<br>ශ්‍රී.ලං.ඉං.සේ<br>ශ්‍රී.ලං.වා.වි.සේ | 33 | 14 |
| තෘතීය මට්ටම | MN – 7<br>MN – 6 | පරිපාලන නිලධාරි<br>ශ්‍රී.ලං.තා.සේ/විශේෂ ශ්‍රේණිය<br>භාෂා පරිවර්තක | 10 | 05 |
| ද්විතීය මට්ටම | MN – 4<br>MN – 3<br>MN – 2<br>MN – 1<br>MT – 1 | වැඩසටහන් සහකාර<br>කෘෂි මෙහෙයුම් නිලධාරි<br>සංවර්ධන නිලධාරි<br>කෘෂි උපදේශක<br>උද්‍යාන සංවර්ධන සහකාර<br>පර්යේෂණ සහකාර<br>ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර<br>කාර්මික නිලධාරි<br>රාජ්‍ය කළමනාකරණ සේවය<br>ශාස්ත්‍ර අයකිරීමේ සහකාර<br>තොරතුරු තාක්ෂණ සහකාර<br>උද්‍යාන වැඩමුලික | 186 | 135 |
| ප්‍රාථමික මට්ටම | PL – 3<br>PL – 2<br>PL – 1 | ශිල්පීය<br>අර්ධ ශිල්පීය<br>ශිල්පීය නොවන | 556 | 494 |
| **එකතුව** | | | **775** | **648** |

## 1.5. දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන සහ ඒකක

### පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය වර්ෂ 1821 දි ස්ථාපිත කරන ලද අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරිසරික සංවර්ධනය සඳහා දායකත්වය ලබා දෙමින් ශාක පිළිබඳ අධ්‍යාපනයට හා පැළෑටි සංරක්ෂණයට දායකත්වයක් ලබා දෙයි.

මහනුවර නගරය සමීපයෙහි පිහිටා ඇති මෙම උද්‍යානය හෙක්ටයාර 61.25ක් පුරා පැතිර ඇති අතර, අධ්‍යාපනය, උද්භිද විද්‍යාත්මක පර්යේෂණ, පරිසර විද්‍යාත්මක සහ උද්‍යාන බෝග වගාව මෙන්ම විනෝදාස්වාදය ලබා දෙන ස්ථානයක් ලෙස ප්‍රචලිත ය.

### ජාතික ශාකාගාරය

ජාතික ශාකාගාරය ශ්‍රී ලංකාවේ ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක් රැස් කර ඇති ස්ථානයකි. වෙනත් බොහෝ විදේශික ශාක සහ අනෙකුත් වගා කරන ශාකවල නිදර්ශක ක්‍රමානුකූල අධ්‍යයනය සඳහා ආරක්ෂා ද කර ඇත. 160,000 ආසන්න ශාකාගාර නිදර්ශක යෝග්‍ය තත්ත්වයන් යටතේ සංරක්ෂණය කරමින් විමර්ශන කාර්යය සඳහා තබා ඇත. 3,500 පමණ ග්‍රන්ථ සහ සෙසු ශාක හා සම්බන්ධවූ පොත් පත්, සඟරා ද ශාකාගාරයේදී සොයාගත හැක.

ශාකාගාරයේ තැන්පත් කර ඇති නිදර්ශක, ශාක වර්ගීකරණ පර්යේෂණ සඳහා මෙන්ම ජෛව විවිධත්ව දත්ත බැංකුවක් ලෙස ශාක හඳුනා ගැනීමේ කාර්යයන් සඳහා ද යොදා ගනී.

### හක්ගල උද්භිද උද්‍යානය

හක්ගල උද්භිද උද්‍යානය වර්ෂ 1861 දි ආරම්භ කළ අතර, ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම උද්භිද උද්‍යානයයි. උද්‍යානයට අයත් බොහෝ ශාක සෞම්‍ය කලාපීය ශාක වේ.මෙම ශාක එකතුව ආවේණික ශාකවල නියෝජනයක් මෙන්ම වෙනත් රටවලින් හඳුන්වාදුන් කඳුකර ශාක වල එකතුවකි. මේවා උද්‍යානයේ විවිධ අංශවල ක්‍රමානුකූලව පැළ කර ඇත.

### හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

ශ්‍රී ලංකාවේ රබර් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 1876 දී ස්ථාපිත කරන ලදී. ඉතා පැරණි ඉතිහාසයක් ඇති එය උද්භිද විද්‍යාත්මකව හා උද්‍යාන විද්‍යාත්මක වශයෙන් ආකර්ෂණීය ස්ථානයකි. එය ගම්පහ පිහිටා ඇති අතර, වපසරිය හෙක්ටයාර 17.4 කි. ශ්‍රී ලංකාවේ සහ සෙසු රටවල ශාක විශේෂයන් 2000 පමණ සංකලනයකින් මෙම උද්‍යානය සමන්විත වේ.

**මල්වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය, පේරාදෙණිය**

මල්වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකය, මල්වගා කේෂ්ත්‍රය සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සහ ශ්‍රී ලංකාවේ මල්වගා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා කැපවී සිටී. වගාකරුවන් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍රයේ උපදේශන සේවා, ක්ෂේත්‍රයේ ආයෝජන අවස්ථා පිළිබඳව තොරතුරු සැපයීම, උපකරණ සහ තත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා අවශ්‍ය සහාය දීම සඳහා ඒකකය ක්‍රියාකාරීව දායක වේ.

**ගනේවත්ත වන ඖෂධ පැළෑටි උද්‍යානය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත වන ඖෂධ පැළෑටි උද්‍යානය පිහිටා ඇත. උද්‍යානය හෙක්ටයාර 21.04 ක වපසරියකින් යුක්ත වන අතර, ඖෂධ පැළෑටි සංකලනයක් විශාල පරාසයක පැතිරී ඇත.

ගනේවත්ත වන ඖෂධ පැළෑටි උද්‍යානය පහසුවෙන් සොයා ගත නොහැකි දුර්ලභ පැළෑටි වර්ග සංරක්ෂණය කිරීම, ඖෂධ පැළෑටි පිළිබඳ ක්‍රමවත් වගා කිරීම සහ පැළෑටි එකතු කිරීමේ ක්‍රම පිළිබඳව හා දුර්ලභ ඖෂධීය ශාක වර්ග පිළිබඳව පර්යේෂණ කිරීමෙහි නිරත වෙයි.

**මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය**

දේශීය විශේෂඥයින් විසින් අවුරුදු 130 ක් පුරාවට සැලසුම් කොට බිහි වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය වනුයේ මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයයි. මෙම උද්‍යානය දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර, සංවර්ධන වැඩ කටයුතු 2006 වර්ෂයේ ආරම්භ වී ඇත.

වියළි සහ ශුෂ්ක කලාපීය ශාකවල විතැන් සංරක්ෂණ සහ දේශිය ආර්ථිකය සංවර්ධනය මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වේ.

**සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය**

අවිස්සාවේල්ල ප්‍රදේශය සමීපයෙහි මෙම උද්‍යානය පිහිටා ඇති අතර, සංවර්ධන කටයුතු 2008 වසරේදී ආරම්භ කරන ලදී. උද්භිද උද්‍යානය හෙක්ටයාර 42.49 වපසරියකින් යුක්ත ය.

පහතරට තෙත් කලාපීය ශාකවල විතැන් සංරක්ෂණය කිරීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වී ඇත.

**සුවහස් මල් සෙවන, කොළඹ**

දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි “ සුවහස් මල්” මල්වගා කරුවන්ගේ සංගම්වල මල්වගා නිෂ්පාදන අලෙවිය දෙපාර්තමේන්තුවේ ඒකකයක් වන නාරාහේන්පිට පිහිටි “ සුවහස් මල් ” ඒකකයෙන් සිදු කරනු ලබයි.

### අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස උද්‍යාන

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ, මහනුවර, නුවරඑළිය, අනුරාධපුර පිහිටි නිල නිවාස උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ කොළඹ සහ නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි නිල නිවාස වල නඩත්තු කටයුතු ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

### පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්

පළමු සහ දෙවන ලෝක යුද්ධයේදී මිය ගිය පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ හමුදා සේවයට අයත් නිලධාරීන් සිහිවීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමල ප්‍රදේශයේ පවත්වා ගෙන යයි. දෙපාර්තමේන්තුව මගින් යුධ සොහොන් ඒකක උද්‍යානවල කළමනාකරණ කටයුතු සිදු කරයි.

### හරිත පියස, මීගලෑව

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කි.මී. 96.56 දුරකින් මීගලෑව හරිත පියස පිහිටා ඇත. හරිත පියසෙහි වර්තමාන වපසරිය හෙක්ටයාර 2.43 කි. එය සංවර්ධනය වෙමින් පවති. මල් වගාව පිළිබඳව අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට සහ දේශිය ජනතාව උදෙසා පුහුණු පාඨමාලා පවත්වාගෙන යන ශාක ප්‍රචාරණය පිළිබඳ මධ්‍යස්ථානයක් ද ලෙස ඉදිරියේදී කටයුතු කරනු ඇත.

## 2. කාර්ය මණ්ඩල පුහුණුව සහ හැකියා වර්ධනය

### 2.1. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් (විදේශීය)

| අංකය | වැඩසටහන | රට | කාල සීමාව | විදේශගත වූ නිලධාරීන් |
|---|---|---|---|---|
| 1 | සංයුක්ත ශාක වර්ගීකරණය හා හඳුනාගැනීම සහ ක්ෂේත්‍ර ගවේෂණ නිපුණතා පිළිබඳ පාඨමාලාව | එංගලන්තය | 2016 වර්ෂයේ සැප්තැම්බර් 12-23 | නදීකා ගුණවර්ධන මිය කාර්ය භාර නිලධාරි ජාතික ශාකාගාරය |
| 2 | උද්භිද උද්‍යාන සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | චීනය | 2016 වර්ෂයේ සැප්තැම්බර් 08 - ඔක්තෝබර් 07 | අචලා අත්තනායක මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය හා එම්.එම්.ඩී.ජේ. සේනාරත්න මහතා සහකාර අධ්‍යක්ෂ ගම්පහ උද්භිද උද්‍යානය |
| 3 | ගෝලීය භූ විද්‍යාත්මක වැදගත් වූ ප්‍රදේශ /උද්‍යාන කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | මැලේසියාව | 2016 වර්ෂයේ මැයි 16 -21 | එම්.සී.වික්‍රමසිංහ මහත්මිය සහකාර අධ්‍යක්ෂ ගම්පහ උද්භිද උද්‍යානය |

### 2.2. කාර්ය මණ්ඩල සඳහා පැවැත්වූ දෙපාර්තමේන්තුමය පුහුණු වැඩසටහන් (දේශීය)

| අංකය | වැඩසටහන | දිනය | පැවැත්වූ ස්ථානය | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|---|---|
| 1 | ආකල්ප වර්ධන පුහුණු වැඩසටහන | 2016.01.25 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | උද්‍යාන කණිෂ්ඨ සේවක මහත්ම මහත්මීන් |
| 2 | කළමනාකරණ දක්ෂතා වර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 2016.09.26 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | රා.ක.ස.නිලධාරීන් හා ඒකක ප්‍රධානීන් |
| 3 | සුළු පරිපාලක නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 2016.10.11 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | සුළු පරිපාලක නිලධාරීන් 12 |
| 4 | කාර්යාලයීය කළමනාකරණ පුහුණු වැඩසටහන | 2016.11.24 2016.11.25 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | රා.ක.ස.නිලධාරීන් හා ඒකක ප්‍රධානීන් |
| 5 | සංගීත රසාස්වාදන වැඩසටහන | 2016.11.25 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | සියලුම නිලධාරී මහත්ම මහත්මීන් |
| 6 | රියදුරු පුහුණු වැඩසටහන | 2016.12.09 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | රියදුරු මහතුන් |

### 2.3. කාර්ය මණ්ඩල නිලධාරීන් බාහිර ආයතන වෙතින් ලද පුහුණු (දේශීය)

| අංකය | වැඩසටහන | දිනය | සහභාගී වූ ගණන | සේවා ගණය |
|---|---|---|---|---|
| 1 | ආකල්ප හා හැකියා වර්ධන පුහුණු වැඩසටහන | 2016.02.03 | 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවය |
| 2 | රාජ්‍ය ලේඛන කළමනාකරණ සහ සංරක්ෂණය පිළිබඳ එක්දින වැඩමුළුව | 2016.03.17 | 01 | සංවර්ධන නිලධාරි |
| 3 | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්ය භාරය | 2016.05.16 | 01 | කළමනාකරණ සහකාර සේවය |
| 4 | ව්‍යාපෘති සම්පාදනය හා සැලසුම් කිරීම | 2016.06.16<br>2016.06.17<br>2016.06.20 | 02 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය |
| 5 | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2016.07.04 | 02 | කළමනාකරණ සේවය |

## 3. 2016 වසරේ උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි නරඹන්නන් පිළිබඳ තොරතුරු

### 3.1 නරඹන්නන්ගේ පැමිණීම සහ ආදායම

2016 වසරේදී ද ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සියලුම ඒකක ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යන ලදී.

මෙම වසරේ උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි මුළු සංචාරකයන් සංඛ්‍යාව 3,058,657 ක් වේ. මෙම සංචාරකයන්ගෙන් 2,593,252 ක් දේශීය සංචාරකයන් වන අතර 465,405 ක් විදේශීය සංචාරකයන් වේ.


2016 වසරේ උද්භිද උද්‍යාන කරා දේශීය සංචාරකයන් ගේ පැමිණීම පසුගිය අවුරුද්දට සාපේක්ෂව 17 % කින් ද විදේශීය සංචාරකයන් ගේ පැමිණීම 14 % කින් ද ඉහළ ගොස් ඇත.

2016 වර්ෂයේ ඇතුල්වීමේ ගාස්තු, පැළ අලෙවිය යනාදියෙන් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ලබාගත් සම්පූර්ණ ආදායම රුපියල් මිලියන 784.4 කි (නරඹන්නන් ගෙන් රුපියල් මිලියන 709.7 ක් ද පැළ අලෙවියෙන් හා අනෙකුත් ක්‍රම හරහා රුපියල් මිලියන 74.7 ක් ද වශයෙනි). එය පසුගිය අවුරුද්දේ ඉහත කාල පරිච්ඡේදයට සාපේක්ෂව 36% ක වැඩිවීමකි.


### 3.2. උද්භිද උද්‍යාන කරා පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ආදායම පිළිබඳ තොරතුරු - 2016

| මාසය | පැමිණීම | | | ආදායම (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | එකතුව |
| ජනවාරි | 143,419 | 52,009 | **195,428** | 6.51 | 55.95 | **62.46** |
| පෙබරවාරි | 195,107 | 57,444 | **252,551** | 7.65 | 61.72 | **69.37** |
| මාර්තු | 271,276 | 49,809 | **321,085** | 8.86 | 53.8 | **62.67** |
| අප්‍රේල් | 300,242 | 29,494 | **329,736** | 11.95 | 31.75 | **43.7** |
| මැයි | 127,969 | 21,146 | **149,115** | 5.17 | 22.7 | **27.87** |
| ජූනි | 122,040 | 16,221 | **138,261** | 5.62 | 23.62 | **29.24** |
| ජූලි | 228,992 | 43,921 | **272,913** | 10.1 | 61.49 | **71.59** |
| අගෝස්තු | 329,641 | 52,745 | **382,386** | 16.03 | 74.23 | **90.26** |
| සැප්තැම්බර් | 252,545 | 32,889 | **285,434** | 12.42 | 48.2 | **60.61** |
| ඔක්තෝම්බර් | 217,339 | 30,643 | **247,982** | 10.32 | 44.97 | **55.29** |
| නොවැම්බර් | 116,695 | 38,327 | **155,022** | 6.17 | 56.69 | **62.86** |
| දෙසැම්බර් | 287,987 | 40,757 | **328,744** | 14.6 | 59.18 | **73.78** |
| **එකතුව** | **2,593,252** | **465,405** | **3,058,657** | **115.41** | **594.30** | **709.70** |

### 3.3. ප්‍රස්ථාර සටහන - 2016 වසරේ සංචාරකයින්ගේ පැමිණීම



### 3.4. ප්‍රස්ථාර සටහන - 2016 වසරේ සංචාරකයින්ගෙන් ලද ආදායම




### 3.5. 2015 සහ 2016 අතර සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම සංසන්දනය

| මාසය | පැමිණීම | | ආදායම (රු.මි.) | |
|---|---|---|---|---|
| | 2015 | 2016 | 2015 | 2016 |
| ජනවාරි | 133,193 | 195,428 | 47.32 | **62.46** |
| පෙබරවාරි | 190,443 | 252,551 | 58.05 | **69.37** |
| මාර්තු | 243,244 | 321,085 | 50.21 | **62.67** |
| අප්‍රේල් | 269,686 | 329,736 | 36.41 | **43.7** |
| මැයි | 221,762 | 149,115 | 28.50 | **27.87** |
| ජූනි | 196,996 | 138,261 | 23.29 | **29.24** |
| ජූලි | 252,879 | 272,913 | 48.42 | **71.59** |
| අගෝස්තු | 340,428 | 382,386 | 61.87 | **90.26** |
| සැප්තැම්බර් | 226,152 | 285,434 | 42.01 | **60.61** |
| ඔක්තෝම්බර් | 167,698 | 247,982 | 36.19 | **55.29** |
| නොවැම්බර් | 131,302 | 155,022 | 42.04 | **62.86** |
| දෙසැම්බර් | 249,472 | 328,744 | 49.20 | **73.78** |
| එකතුව | **2,623,255** | **3,058,657** | **524.00** | **709.70** |

### 3.6. එක් එක් ජාතික උද්භිද උද්‍යාන සඳහා සංචාරක පැමිණීම හා ආදායම - 2016


| උද්‍යානය | පැමිණීම | | | ආදායම (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | එකතුව |
| රාජකීය උද්භිද උද්‍යානය | 1,206,233 | 435,577 | 1,641,810 | 52.70 | 556.51 | 609.21 |
| හක්ගල උද්භිද උද්‍යානය | 956,815 | 29,192 | 986,007 | 41.92 | 36.97 | 78.89 |
| ගම්පහ උද්භිද උද්‍යානය | 214,831 | 365 | 215,196 | 11.10 | 0.46 | 11.56 |
| නෙත් කලාපීය උද්භිද උද්‍යානය | 152,882 | 133 | 153,015 | 7.33 | 0.18 | 7.51 |
| වියළි කලාපීය උද්භිද උද්‍යානය | 62,491 | 138 | 62,629 | 2.36 | 0.17 | 2.53 |
| එකතුව | **2,593,252** | **465,405** | **3,058,657** | **115.41** | **594.29** | **709.70** |


### 3.7. 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය තෙක් උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගේ තොරතුරු

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | **2012** | **2013** | **2014** | **2015** | **2016** |
| දේශීය නරඹන්නන් සංඛ්‍යාව | 1,931,914 | 1,783,069 | 1,893,522 | 2,215,702 | 2,593,252 |
| විදේශීය නරඹන්නන් සංඛ්‍යාව | 259,545 | 293,454 | 345,468 | 407,553 | 465,405 |
| **එකතුව** | **2,191,459** | **2,076,523** | **2,238,990** | **2,623,255** | **3,058,657** |

### 3.8. 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට නරඹන්නන්ගේ පැමිණීමෙන් පමණක් ලැබුණු මුළු ආදායම

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | **2012** | **2013** | **2014** | **2015** | **2016** |
| දේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි) | 77.6 | 73.0 | 75.9 | 88.5 | 115.4 |
| විදේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි) | 279.0 | 314.9 | 369.8 | 435.1 | 594.3 |
| **එකතුව (රු.මි)** | **356.6** | **387.9** | **445.7** | **523.6** | **709.7** |



## 4. 2016 වර්ෂයේ උද්භිද උද්‍යානයන් හි සිදු වූ සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

සියළුම උද්‍යානයන් හි භූමි අලංකරණ කටයුතු නිසි පරිදි සිදුකිරීම තුලින් ද නව සංවර්ධිත ප්‍රදේශ, අඩි පාරවල්, වීදි, උද්‍යාන කාර්යක්ෂමව නඩත්තු කිරීම තුලින්ද, උද්‍යානයන් හි අලංකාරය හා තත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

### 4.1 රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය

**මූල්‍ය ප්‍රගතිය**

අනුමත ප්‍රතිපාදන - ඒකාබද්ධ අරමුදලින් රු. මි. 7.175 ක් සහ උද්භිද උද්‍යාන භාරකාර අරමුදල රු.මි. 46.0

2016 වර්ෂයේ වියදම - රු.මි 53.016

**භෞතික ප්‍රගතිය**

- ශාක ප්‍රදර්ශනය සඳහා ශාක සංරක්ෂණාගාරයක් ස්ථාපනය කිරීමේ කටයුතු අරම්භ කර වැඩ අවසන් කරන ලදී.එහි පැළෑටි ස්ථාපිත කිරීමේ කටයුතු සහ අභ්‍යන්තර සැලසුම නිර්මාණය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර 2017 වර්ෂයේ දී මහජනතාවට විවෘත කිරීමට බලාපොරොත්තු වේ.
- උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය සහ බෝක්කු හා ජලාපවහන පද්ධති වැඩි දියුණු කිරීම සිදු කරන ලද අතර ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම මඟින් උද්‍යානයට නව පෙනුමක් ද ලබා දීමට කටයුතු කරන ලදී. උද්‍යානයේ නිලධාරීන්ගේ නිල නිවාස ද අලුත්වැඩියා කරන ලදී.
- උද්‍යානයේ ප්‍රධාන මාර්ග වල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා කාපට් ඇතිරීම සිදුකරන ලදී.
- උද්‍යානයේ සංචාරක බංගලාවේ තත්ත්වය උසස් කිරීම සඳහා නවීන උපකරණ සහ ආම්පන්න සවි කරමින් නවීකරණය කර අළුත්වැඩියා කරන ලදී.
- උද්‍යානයේ කැෆටේරියා ආපනශාලාවේ වහළ අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.
- ගන්නෝරුව පෙදෙසෙහි පිහිටි ප්‍රවේශ පත්‍ර කවුළුව විවෘත කරන ලදී.
- උද්‍යානයේ ගිම්හාන කුටි 03 ක් අළුතින් ඉදි කරන ලදී.
- අළුතින් නිල නිවාසයක ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදි. එහි පළමු අදියර නිම කර ඇති අතර දෙවන අදියර 2017 වසරේ නිම කිරීමට අපේක්ෂිතය.



ස්ථාපිත ශාක සංරක්ෂණාගාරය



මාර්ග සඳහා කාපට් අතුරා තත්වය වැඩිදියුණු කර ඇති අයුරු



අළුතින් විවෘත කරන ලද ගන්නොරුව පෙදෙසෙහි පිහිටි ටිකට් කවුන්ටරය

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන අතර පැළ 125,803 ක් නිපදවන ලදී.
- ශාක නාම පුවරු සහ උද්‍යානය තුල මාර්ග සංඥා පුවරු සවි කිරීමට කටයුතු කරන ලදී. උද්‍යානය තුල දැකිය හැකි කුරුල්ලන් ඇතුළු අනෙකුත් වන සතුන් පිළිබඳ පුවරු 3ක් ස්ථාපනය කරන ලදී.
- උද්‍යානයේ ශාක අංශ 2 ක ප්‍රතිශෝධන කටයුතු සිදුකරන ලදී.
- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සිදු කරන ලදී.
- CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කරන ලදී.


අලුතින් ඉදිවුනු නිල නිවස


ඉදි කෙරුණු ගිම්හාන කුටියක්

## 4.2. හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය, ගම්පහ

### මූල්‍ය ප්‍රගතිය

අනුමත ප්‍රතිපාදන - ඒකාබද්ධ අරමුදලින් රු. මි. 15.55 ක් සහ

උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 3.00

2016 වර්ෂයේ වියදම - රු.මි. 17.331

### භෞතික ප්‍රගතිය

- ගොඩනැගිලි, නිල නිවාස, පැල ගෘහය, උද්‍යානය වටා තාප්පය, ගිම්හාන කුටි, සෙවන ගෘහය, බෝට්ටු අංගනයන් හි අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදී.
- අළුතින් බෝට්ටු 03 ක් උද්‍යානයේ ස්ථාපිත වැවෙහි බෝට්ටු සංචාර සඳහා යොදවන ලදී.
- රථගාල ආශ්‍රිත පෙදෙස ඉන්ටලොක් අතුරා පිලිසකර කිරීම් සිදුකරන ලදී.
- ප්‍රවේශ පත්‍ර කවුළුව සහ ඒ අසල ඇති මුර කුටි අළුත්වැඩියා කරන ලදී.
- නව වැසිකිලි පද්ධතියක ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත.
- අළුතින් නිල නිවාසයක් ඉදි කරන ලදී.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 55,663 ක පැළ ප්‍රමාණයක් නිපදවන ලදී. උද්‍යානයේ ශාක එකතුවට අදාල ශාක නාම පුවරු ද සවි කිරීම සිදුකරන ලදී.


අලුතින් ඉදි වූ නිල නිවස


අලුතින් ඉදිවුනු නව වැසිකිළි


ඉදි කෙරෙන ඕකිඩ් ශාක ගෘහය

- තොරතුරු ලබා ගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඇතුලත් පත්‍රිකා, පුවරු සකස් කරන ලදී.තව ද නරඹන්නන් සඳහා බංකු 25 ක් ඉදි කරන ලදී.

- ඕකිඩ් ශාක ගෘහයක් ඉදිකිරීම අරඹන ලද අතර 20% ක වැඩ දැනට අවසන් වී ඇත. මෙයට අමතරව බොන්සායි ශාක එකතුවක් ද මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට කටයුතු කරමින් පවතී.



ඉදි කෙරෙන බොන්සායි ගෘහය

## 4.3 හක්ගල උද්භිද උද්‍යානය

### මූල්‍ය ප්‍රගතිය

අනුමත ප්‍රතිපාදන -ඒකාබද්ධ අරමුදල් වලින් රු. මි. 0.425 ක්

උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 32.00

2016 වර්ෂයේ වියදම - රු.මි.32.774

### භෞතික ප්‍රගතිය

- උද්‍යානයේ පිහිටි ගොඩනැගිලි, නිලනිවාස, පැල ගෘහ, ගිම්හාන කුටි, සංචාරක බංගලාවේ තීන්ත ආලේප කර අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදී.



කාර්යාල පරිශ්‍රයෙහි විශාල කිරීම් කටයුතු සිදු කර ඇති අයුරු

- දැනට භාවිතාවන කාර්යාල පරිශ්‍රයේ කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති බැවින් කාර්යාල පරිශ්‍රයෙහි විශාල කිරීම් කටයුතු සිදුකර අවසන් වී ඇත.

- නව ඇතුළුවීමේ සංකීර්ණයක ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින අතර 2017 දී විවෘත කිරීමට අපේක්ෂිතය.

- දැනට පවතින කාර්ය මණ්ඩල නිල නිවාස වලට අමතරව අලුතින් නිල නිවාසයක ඉදි කිරීම් කටයුතු සිදුකර නිම කරන ලදී.



නව ඇතුලුවීමේ සංකීර්ණය

- නව වැසිකිළි පද්ධතියක ඉදිකිරීම් කටයුතු සිදු කරන ලද අතර කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් එහි වැඩකටයුතු අතරමග නැවතිනි.2016 වසර අවසන් වන විට එහි 25% ක වැඩ අවසන් වී තිබූ අතර 2017 වසරේදී ඉතිරි වැඩ සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමකින් පසු ඉදි කිරීම් කටයුතු අවසන් කිරීමට නියමිතය.

- නරඹන්නන් ගේ භාවිතය සඳහා නව භෝජනාගාරයක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කරන ලදී.



ස්ථාපිත නව භෝජනාගාරය

- උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 139,600 ක පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.

- තොරතුරු ලබා ගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සිදු කර ඇත.

- මාර්ග වල තත්වය වැඩිදියුණු කිරීම සඳහා ගල් ඇතිරීමේ කටයුතු සිදුකරන ලදී.



අලුතින් ඉදිවුන නිල නිවාසය

## 4.4. ගන්නේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | - ඒකාබද්ධ අරමුදල් වලින් රු. මි. 10.95 ක් |
| | උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 3 ක් |
| 2016 වසරේ වියදම | - රු.මි. 13.759 |

### භෞතික ප්‍රගතිය



අලුතින් ඉදිවුනු ගිම්හාන කුටිය

- ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහයන් හි නඩත්තු කටයුතු සිදු කිරීම මඟින් උද්‍යානය උසස් තත්වයකින් පවත්වා ගැනීමට කටයුතු සිදුකරන ලදී.
- ප්‍රදේශයේ මල්වගාව ප්‍රචලිත කිරීමේ අරමුණින් ඇන්තූරියම් හා ඕකිඩ් වගා අංශ ස්ථාපිත කිරීමේ කටයුතු සිදුකර අවසන් කර ප්‍රදේශයේ මල් වගාව ව්‍යාප්ත කිරීමට කටයුතු ආරම්භ කරන ලදී.



ඇන්තූරියම් හා ඕකිඩ් වගා අංශ

- රෝපණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 48,000 කට අධික ප්‍රමාණයක් නිපදවන ලදී. මීට අමතරව මව් ශාක එකතුවක් ස්ථාපනයට කටයුතු සිදුවෙමින් පවතී.
- තොරතුරු ලබා ගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කර ඇත.
- උද්‍යානයේ ගිම්හාන කුටියක් අලුතින් ඉදි කෙරිණි.
- උද්‍යානයේ වාහන රථගාල අලුත්වැඩියා කරන ලද අතර ශාකාගාර කොටස නවීකරණය කරන ලදී.



ශාක එකතුව වැඩි දියුණු කිරීම් කටයුතු

- දේශීය ඖෂධීය අගයන්ගෙන් යුත් ආහාර පාන අලෙවිය සඳහා ආපනශාලාවක් ඉදි කිරීමේ කටයුතු අවසන් කෙරිණි. ඒ අසල නව වැසිකිළි 02 ක ඉදි කිරීම් කටයුතු සැලසුම් කරන ලදී.
- උද්‍යානය තුළ පානීය ජල පද්ධතියක් ස්ථාපනය ආරම්භ කරන ලද අතර ඒ සඳහා ළිඳක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කරන ලදී.
- ඖෂධ ශාක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ පුද්ගලයින් 2,273 දෙනෙකු ඖෂධ ශාක භාවිතය, ඒවායෙහි වටිනාකම සහ සංරක්ෂණය පිළිබඳ දේශන පවත්වා දැනුවත් කරන ලදී.



උද්‍යානයේ අලුතින් ස්ථාපිත ආපනශාලාව


## 4.5 ශාකාගාරය සහ ශාක වර්ගීකරණ හා ශාක හඳුනාගැනීමේ පර්යේෂණ

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | - උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 5 ක් |
| 2016 වසරේ වියදම | - රු.මි. 4.714 |

### භෞතික ප්‍රගතිය

- පාසල් සිසුන් 316 ක්, විශ්වවිද්‍යාල සිසුන් 589 ක් ද, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නිලධාරීන් 199 ක් සඳහා ජෛව විවිධත්වය සංරක්ෂණය, ශාකාගාර තාක්ෂණික ක්‍රම හා කළමනාකරණය පිළිබඳ වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 34 ක් පවත්වන ලදී.




ප්‍රකාශයට පත් කල ජෛව විවිධත්වය සම්බන්ධ පෝස්ටරයක්

- මහනුවර, කෑගල්ල හා මාතලේ දිස්ත්‍රික්කයන්හි උසස් පෙළ පාසල් ළමුන් 291 සඳහා ජෛව විවිධත්වය සහ ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රමවේද පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන් ද ඇතුළත්ව එක්දින වැඩමුළු 06 ක් පවත්වන ලදී.
- උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන් වියළි සහ තෙත් කලාපීය තර්ජනයට ලක්වූ ශාක ඉලක්ක කරගනිමින් ශාක ගවේෂණ කටයුතු මෙම වසරේ දී ද සිදු කරන ලදී. මීට අමතරව ඉහල කඳුකර ප්‍රදේශයේ ශාක ගවේෂණ කටයුතු ශ්‍රී පාද කඳු පන්තිය අශ්‍රිතව ද සිදු කරන ලදී.
- උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ 21 ක් සිදු කරන ලද අතර සජීවී සපුෂ්ප ශාක නිදර්ශක 810 ක්, මීවන ශාක නිදර්ශක 54 ක් සහ පාසි ශාක නිදර්ශක 195 ක් එකතු කෙරිණි.



ශාකාගාර තාක්ෂණික ක්‍රම හා කළමනාකරණය පිළිබඳ පවත්වන ලද වැඩමුළුවක්

- ශාක විතැන් සංරක්ෂණ ක්‍රමවේද යොදා ගනිමින් අවශ්‍ය අවස්ථා වලදී ශාක සංරක්ෂණ කටයුතු ද සිදු කරන ලද අතර රැස් කර ගන්නා ලද නිදර්ශක ජාතික ශාකාගාරයේ අනාගත විමර්ශනය සඳහා තබා ගන්නා ලදී.
- මෙම උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු සිදු කිරීමේ දී සොයා ගත්, වඳ වී ගොස් ඇති ශාකයක් ලෙස 2012 රතු දත්ත පොතෙහි සඳහන් *Rinorea decora* ශාකය අවුරුදු 128 කට පසු මීමුරේ ප්‍රදේශයෙන් සොයා ගැණින.
- විශ්වවිද්‍යාල පර්යේෂණ, ආයුර්වේද පර්යේෂණ, වාණිජ කර්මාන්ත, අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සඳහා සහ ශාකාගාරයේ තැන්පත් කිරීම සඳහා සපුෂ්ප ශාක නිදර්ශක 1812 ක්, මීවන ශාක නිදර්ශක 218 ක් සහ පාසි ශාක නිදර්ශක 130 ක් හඳුනා ගන්නා ලදී.



අවුරුදු 128කට පසු මීමුරේ ප්‍රදේශයෙන් සොයා ගත් වඳ වී ගොස් ඇති ශාකයක් ලෙස 2012 රතු දත්ත පොතෙහි සඳහන් *Rinorea decora*

- “Wild Flowers of Sri Lanka” යන ග්‍රන්ථ සංග්‍රහය ප්‍රකාශයට පත් කරන ලදී. මෙහි ඡායරූප සහිත නිදර්ශක 250ක විද්‍යාත්මක තොරතුරු/ පොදු නාම, සංරක්ෂණ තත්ත්වයන්, වාසස්ථාන අඩංගුය.
- Common Wayside Trees of Sri Lanka” යන ග්‍රන්ථ සංග්‍රහයෙහි සංස්කරණ කටයුතු සිදු කරමින් පවතී.

- ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක්වූ ශාක, ආක්‍රමණික ශාක, ජෛව විවිධත්වය, ශ්‍රී ලංකාවේ වන මල්, ශ්‍රී ලංකාවේ විසිතුරු ඕකිඩ් පිළිබඳ අත් පත්‍රිකා හා පෝස්ටර් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලදී.

- ජාතික ශාකාගාරයේ තැන්පත් රූප සටහන් සහ නිදර්ශක සංඛ්‍යාව නිර්ණයට සහ අධ්‍යයනය පහසු කිරීමේ අරමුණින් එම නිදර්ශක වලට ප්‍රවේශ අංකයන් (Accession number) ලබා දී ඒවා දත්ත පද්ධතියකට ඇතුළත් කිරීමේ කටයුතු සිදු කෙරිණි.

- ජාතික ශාකාගාරයේ නවීකරණ කටයුතු සිදුකළ අතර පරීක්ෂණාගාර නවීකරණය, පැරණි ශාකාගාර ගොඩනැගිල්ලේ ජලය අපවහන වන නල අලුත්වැඩියාව, නව ශාකාගාරයේ තැන්පත් කර ඇති නිදර්ශකවල තත්ත්වය ආරක්ෂාකර ගැනීමට නිදර්ශක තැන්පත් කර ඇති ප්‍රදේශයෙහි වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම සිදුකරන ලදී.

### 4.6 ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | - උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 23.00 |
| 2016 වසරේ වියදම | - රු.මි. 23.336 |

**භෞතික ප්‍රගතිය**



මල් වගා කරුවන්ගේ පැළ තවාන් වලට ගොස් ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස්

- පහළ සහ මධ්‍යම ප්‍රමාණයේ මල්වගාකරුවන් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ ආර්ථික තත්වය නඟා සිටුවීමට මල්වගා සංවර්ධන වැඩසටහන මෙම වසරේදී ද ක්‍රියාත්මක කරන ලදි.
- දිවයින පුරා මල්වගා ව්‍යාප්තිය සඳහා මල්වගා ගොවි සංගම් ප්‍රමාණය 173 දක්වා වැඩි කරමින් මෙම වර්ෂයේදී නව ගොවි සංගම් 11 ක් පිහිටුවන ලදි. ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, ජර්බෙරා, කැපූ පත්‍ර සහ පටක රෝපණය පිළිබඳ පුද්ගලයින් 24,972 ක් පුහුණු කර ඇත. මීට අමතරව පාසල් සිසුන්ගේ මල්වගාව සම්බන්ධ ව්‍යාපෘති 67 ක් සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලබා දී ඇත.
- මල්වගාකරුවන්ගේ කාර්මික සහ සෙසු නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු 19 ක් පවත්වන ලද අතර වගාකරුවන් 966 ක් පුහුණු කරන ලදී.

- මල්වගාකරුවන්ගේ මල්වගාවන් අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා සුළු පරිමාණ ප්‍රදර්ශන 387 ක් සහ දිස්ත්‍රික් මට්ටමේ විශාල ප්‍රදර්ශණ 03 ක් පවත්වන ලදි. මල්වගාකරුවන්ගේ පැළ තවාන් 1471 කට ගොස් සහ මල්වගා සමිති රැස්වීම් 538 කට සහභාගී වී ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ලබාදෙන ලදී.

- ක්ෂේත්‍රයේ දී සහ රසායනාගාර පහසුකම් යටතේ ඕකිඩ් දෙමුහුන් වර්ග සහ ඇන්තූරියම් වර්ග කිහිපයක් සකසනු ලැබිණි.
- නාරාහේන්පිට පිහිටි සහකාර අධ්‍යක්ෂ කාර්යාලය, මල්වගා කිරීම සහ ශාක සම්බන්ධ තොරතුරු කොළඹ ප්‍රදේශයේ ජනතාවට ලබාදීම සඳහා වූ තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුකෙරුනු අතර, ඒ සඳහා ශ්‍රවණාගාරයක් ස්ථාපිත කරන ලදී. එහි දී මල්වගා ක්ෂේත්‍රය හා ශාක සම්බන්ධ උපදේශන කටයුතු සිදුකිරීම, පුහුණු පන්ති පැවැත්වීම වැනි මල්වගා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට සහ සංවර්ධනයට කටයුතු සිදු කරනු ලබයි.



මල්වගා අලෙවිකරණය ඉහළ නැංවීමට පවත්වන ලද සුළු පරිමාණ ප්‍රදර්ශනයක්

## 4.7. අධ්‍යාපනය සහ පුහුණුව

### මූල්‍ය ප්‍රගතිය

අනුමත ප්‍රතිපාදන - ඒකාබද්ධ අරමුදල් වලින් රු.මි. 0.2 ක් හා

උද්භිද උද්‍යාන භාර අරමුදලෙන් රු.මි. 01

2016 වර්ෂයේ වියදම - රු.මි. 1.105

### භෞතික ප්‍රගතිය

- පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කරන ලදී.
- තරුණයින් 52 ක් නවීන මල් වගා ක්‍රමවේද සහ භූ අලංකරණ ක්‍රමවේද පිලිබඳව ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව හරහා පුහුණු කරන ලදී.
- භූ දර්ශන සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 4 වන මට්ටම (NVQ- level 4) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම් සිදුකරන ලද අතර මේ වන විට සිසුන් 19 දෙනෙකු ලියාපදිංචි වී පාඨමාලාව හදාරයි.



**NVQ- level 4** පාඨමාලාව හදාරන සිසුන් පිරිසක්

- රෝස වගාව, තවාන් කළමණාකරණය, ශාක හඳුනාගැනීම, ශාක ශල්‍යකර්මයන්, මල් සැකසුම්, පශ්චාත් අස්වනු තාක්ෂණය, භූමි අලංකරණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව පුද්ගලයින් 13,394 ක් පුහුණු කරන ලදී.මීට අමතරව ජෛව විවිධත්වය හා එහි සංරක්ෂණය පිළිබඳ පාසල් සිසුන් ඇතුළුව පුද්ගලයින් 1,292 ක් දැනුවත් කරන ලදී.

## 4.8. මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය

### මූල්‍ය ප්‍රගතිය

අනුමත ප්‍රතිපාදන - ඒකාබද්ධ අරමුදල් වලින් රු.මි. 5
2016 වර්ෂයේ වියදම - රු.මි. 4.996

### භෞතික ප්‍රගතිය

- ක්ෂේත්‍ර කාර්යාල ගොඩනැගිල්ල අංක. 04 හි අළුත්වැඩියා කටයුතු සිදුකිරීම වයඹ ඉංජිනේරු කාර්යාලය මඟින් සිදු කෙරිණ. පලමු අදියර නිමකර ඇති අතර 2 වන අදියරෙහි අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට නියමිතය.
- පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර පැළ 38,316 ක ප්‍රමාණයක් නිපදවන ලදී.
- මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානයෙහි පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය කාර්යාලීය උපකරණ හා උද්‍යාන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා යන්ත්‍රෝපකරණ මිළදී ගන්නා ලදී.

## 4.9. මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට

### මූල්‍ය ප්‍රගතිය

2016 ප්‍රතිපාදන -ඒකාබද්ධ අරමුදලින් රු.මි. 98.5
උද්භිද උද්‍යාන අරමුදලින් රු.මි.2

2016 වර්ෂයේ වියදම - රු.මි. 100.257

### භෞතික ප්‍රගතිය

- මහජනතාව තුල විශේෂයෙන් වියළි කලාපීය ශාක පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් සෙවණලැදි ශාක සහ දුර්ලභ ශාක මහජන ප්‍රදර්ශනය සඳහා පැල සංරක්ෂණාගාරයක් ස්ථාපනය කරන ලදී.



උද්‍යානයේ ස්ථාපිත නව ශාක සංරක්ෂණාගාරය

- පතොක් ශාකවල විවිධත්වය ප්‍රදර්ශනය සහ පතොක් ශාක පිළිබඳ නරඹන්නන් ගේ දැනුම වර්ධනය සඳහා එලිමහන් පතොක් ශාක සංරක්ෂණාගාරයක් ඉදි කරන ලදී.

- කාර්ය මණ්ඩල උපයෝගිතා ගොඩනැගිල්ලක් සියළුම පහසුකම් සහිතව ඉදි කරන ලදී.

- දැනට පවතින කාර්ය මණ්ඩල නිල නිවාස 02 ට අමතරව අළුතින් නිල නිවාස 02 ක ඉදිකිරීම් කටයුතු අවසන් වී ඇත.



උද්‍යානයේ ස්ථාපිත නව පතොක් ශාක සංරක්ෂණාගාරය

- උද්‍යානයේ සහ ප්‍රදේශයේ මල්වගා සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීමට මල්වගා කටයුතු පිළිබඳ පරීක්ෂණාගාරයක් ඉදිකරන ලදී. ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ මෙවලම් ද මිළදී ගන්නා ලද අතර පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතී.

- නරඹන්නන්ගේ භාවිතය සඳහා නව භෝජනාගාරයක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර ඉදි කිරීම් කටයුතු වලින් 35 % ක වැඩ දැනට අවසන් වී ඇත.



ඉදි කරමින් පවතින කාර්ය මණ්ඩලය උපයෝගිතා ගොඩනැගිල්ල

- උද්‍යානයේ ඇතැම් කොටස් වල බාහිර පෙනුම සහ මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉන්ටර්ලොක් ගල් ඇතිරීමෙන් උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග වැඩිදියුණු කරන ලදී.

- තිස්ස - කතරගම මාර්ගයට මුහුණ ලා නව ප්‍රවේශපත්‍ර කවුළුවක් ඉදි කරන ලද අතර එය මේ වන විට මහජනතාවට විවෘත කර ඇත.

- උද්‍යානය වටා ආරක්ෂිත වැට ස්ථාපනය කිරීම් කටයුතු සිදු කරන ලදී.



නරඹන්නන් ගේ භාවිතය සඳහා උද්‍යානයේ අලුතින් ඉදිවූ නව භෝජනාගාරය

- උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, අඩිපාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංග වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී.

- උද්‍යානයේ මල්වගා සංවර්ධන කටයුතු වැඩිදියුණු කර ඇත. උද්‍යානයේ සජීවී ශාක එකතුව වැඩිදියුණු කර ඇති අතර, මල්වගා ව්‍යාප්ති කාර්යාලයේ පහසුකම් ද වැඩිදියුණු කර ඇත. ප්‍රදේශයේ මල්වගාකරුවන් දිරිගැන්වීම සහ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම, වැඩමුළු හා පුහුණු සැසි ද පවත්වන ලදී.



නරඹන්නන් ගේ භාවිතය සඳහා උද්‍යානයේ අළුතින් ඉදිවන නව භෝජනාගාරය

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 30,850 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.

- දැනට උද්‍යානය තුළ උද්‍යානය නැරඹීමේ පහසුව සඳහා නරඹන්නන් වෙනුවෙන් යොදවා ඇති බැටරි බලයෙන් ක්‍රියාත්මක වන රථ 4 ට අමතරව තව එක් රථයක් මිළදී ගෙන සේවයේ යොදවන ලදී.



තිස්ස - කතරගම මාර්ගයට මුහුණ ලා ඉදි වූ නව ප්‍රවේශපත්‍ර දොරටුව

## 4.10. සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල

### මූල්‍ය ප්‍රගතිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | - ඒකාබද්ධ අරමුදලින් රු. මි. 25 ක් සහ උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 5 |
| 2016 වර්ෂයේ වියදම | - රු.මි. 29.68 |

### භෞතික ප්‍රගතිය

- උද්‍යානයේ නරඹන්නන් සඳහා පහසුකම් වැඩි කිරීම සිදු කරන ලදී.
- උද්‍යානයේ සුන්දර වටපිටාව මැදින් උද්‍යානයේ ඉහළ ප්‍රදේශය නැරඹීමට යන අතරමඟ නැරඹුම් ස්ථානයක් ඉදිකර නිම කර ඇත.
- උද්‍යානයට අලුතින් අත්පත් කරගත් ප්‍රදේශයෙහි ස්ථාපිත පැරණි ගොඩනැගිලි 02 ක් නිල නිවාස ලෙස සංවර්ධනය කිරීමේ කටයුතු සිදුකරන ලදී.



උද්‍යානයේ ඉදිකර ඇති නැරඹුම් වේදිකාව

- උද්‍යානයේ මාර්ග වල තත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉන්ටර්ලොක් ඇතිරීමේ කටයුතු සිදුකරන ලදී.

- උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා ජපන් උයනක් ස්ථාපිත කරන ලද අතර, ගිම්හාන කුටි 02 ක් ඉදිකිරීමේ කටයුතු සිදුකරමින් පවතී.ඉදි කිරීම් කටයුතු වලින් 95 % ක වැඩ දැනට අවසන් වී ඇත. 2017 වසරේ දී සියලු ඉදි කිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂිතය.



ඉදි වෙමින් පවතින ගිම්හාන කුටියක්

- නරඹන්නන් ගේ භාවිතය සඳහා නව භෝජනාගාරයක් ඉදිකරන ලදී.

- උද්‍යානය තුල පානීය ජල පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු සිදුකල අතර ජල ටැංකියක් ද ස්ථාපනය කර ඇත.

- උද්‍යානය වටා ආරක්ෂිත වැටක් ස්ථාපනය කරන ලදී .
- අලංකාර ශාක සහිත මල් උයන්, අඩිපාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංශ වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී.



නරඹන්නන් ගේ භාවිතය සඳහා ස්ථාපිත භෝජනාගාරය

- ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදුකරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදුකරන ලද අතර 71,085 ක පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.
- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඇතුලත් පත්‍රිකා, පුවරු සකසමින් පවතී.



උද්‍යානය තුල ස්ථාපිත තොරතුරු මධ්‍යස්ථානය

- උද්‍යානයන්හි කාර්යක්ෂම කළමනාකරණය සඳහා අවශ්‍ය නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදීගත් අතර පවතින යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුලින් උද්‍යාන අලංකාරය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

## 5. දෙපාර්තමේන්තුව යටතේ සෙසු ඒකකවල කළමනාකරණය

### 5.1. අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ 01 පිහිටි ජනාධිපති මන්දිරය, මහනුවර, නුවරඑළිය, අනුරාධපුරයේ සහ ගරු අගමැතිතුමාගේ කොළඹ අරලියගහ මන්දිරය සහ නුවරඑළියේ පිහිටි නිල නිවාසබද උද්‍යාන උසස් ලෙස නඩත්තු කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාසබද උද්‍යානවල අලංකරණය සහ සැලසුම් කළ පරිදි තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන කටයුතු දියත් කෙරිණි.

### 5.2 අනුරාධපුර ශ්‍රී මහා බෝධිය

ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්ත්වය සොයා බැලීමේ කටයුතු සඳහා පියවර ගැනිම මෙන්ම බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්ත්වය පවත්වාගෙන යාමේ කටයුතු සඳහා මෙම වසරේදී පියවර ගන්නා ලදී.

### 5.3. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක

මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමලය යන ස්ථානයන් හි පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක වල නඩත්තු කටයුතු හා කළමනාකරණ කටයුතු ඉහළ මට්ටමක පවත්වාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු සිදුකරන ලදී.

## 6. 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ

### 6.1. Agronomy (වගා තාක්ෂණය) හා හෝර්මෝන,පොහොර අනුපාතයන්

- මාස 04 ක් 08ක් වයස ඇති ඩෙන්ඩ්‍රෝබියම් ඕකිඩ් වල වර්ධනය පොහොර හා හෝමෝන වල අනුපාතයන්ගේ බලපෑම පිළිබඳ පර්යේෂණ කරගෙන යනු ලැබීය.
- වැඩි වටිනාකමක් සහිත ඩ්‍රැසීනා,සැන්ඩ්‍රියානා අතු කොටස් ලබා ගැනීම සඳහා ඔක්සීන්, ගිබරලික් ඇසිඩ් හා ආලෝකයේ බලපෑම පිළිබඳ පර්යේෂණය අවසන් කරන ලදී.
- ජර්බෙරා මල් වල උසස් තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා සිලිකන් වල බලපෑම අධ්‍යයනය කරගෙන යනු ලැබිණි.
- බයෝෆිල්ම්- බයෝෆර්ටිලයිසර්/ Biofilm- BioFertilizer මල්වගාව සඳහා සුදුසු දැයි පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදී.
- අලින්ගේ අපද්‍රව්‍ය (අලිබෙටි) හා කොළ දිරා යෑම ඉක්මන් කිරීම සඳහා (Biofilm- BioFertilizer මගින්) වූ පරීක්ෂණය අවසන් කරන ලදී.
- ඇන්තූරියම් හා විසිතුරු පත්‍රික ශාක වර්ධන සඳහා අලින්ගේ පොහොර යෙදීමේ සුදුසුභාවය පිළිබඳව මූලික අධ්‍යනයක් කරන ලදී.

### 6.2. Physiology (ශාක කායික විද්‍යාව)

- අග ඉවත් කරන ලද පිලෝඩෙන්ඩ්‍රන් ශාක වල අලුතින් අතු හට ගැනීම සඳහා හෝමෝන භාවිතය පිළිබඳව පර්යේෂණය අවසන් කරන ලදී.
- අග ඉවත් කරන ලද කොර්ඩිලයින් ශාක වල අතු බෙදීම හා දික්වීම සඳහා හෝමෝන වල බලපෑම පිළිබඳ පර්යේෂණ අවසන් කරන ලදී.

### 6.3. පටක රෝපණය

- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් අලුතින් නිපදවා ඇති ඇන්තූරියම් වර්ග සඳහා නිවැරදි පටක රෝපණ ක්‍රම පිළිබඳ පර්යේෂණ කරගෙන යන ලදී.
- විවිධ මාධ්‍ය (Gelling agent) ඩෙන්ඩ්‍රෝබිම් හා වැන්ඩා යන ඕකිඩ් වර්ග වලට සිදුවන බලපෑම අධ්‍යයනය කරන ලදී.
- විවිධ මාධ්‍ය (Gelling agent) හා (Media additives) මගින් ජර්බෙරා වර්ග දෙකකට වන බලපෑම අධ්‍යයනය කරන ලදී.
- ඩෙන්ඩ්‍රෝබිම්, ඕකිඩ් හා ජර්බෙරා වර්ග 02ක් සඳහා වර්ධන මාධ්‍යයට භාවිතා කරන ද්‍රව්‍ය වල යෙදවුම් පිළිබඳ අධ්‍යයනය කිරීම කරන ලදී.
- සංරක්ෂණ කටයුතු හා මල්වගාව සඳහා යොදා ගත හැකි ශාක (*Chirita sp*, *Hopea modesta*, *Tabebia serratifolia*) වර්ධනය සඳහා පටක රෝපණ තාක්ෂණය භාවිතා කිරීමේ පර්යේෂණ කරගෙන යන ලදී.

### 6.4. පසු අස්වනු තාක්ෂණය

- සමන්පිච්ච මල් පොහොට්ටු දිගුකාලයක් තුල ප්‍රවාහනයට සුදුසු ඇසුරුම් සොයාගැනීමේ පරීක්ෂණ කර අවසන් කරන ලදී.
- සමන්පිච්ච මල් සුවඳ ආරක්ෂා වන පරිදි වියලීම සඳහා අදාල පර්යේෂණ ආරම්භ කරන ලදී.
- මල්වල වර්ණය වෙනස් නොවන ලෙස මල් වියළීමේ පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලදී.

## 7. උද්භිද උද්‍යාන භාර අරමුදල

උද්භිද උද්‍යාන සංවර්ධනය සහ සුභසාධනය සඳහා වූ උද්භිද උද්‍යානභාර අරමුදල 1996 පෙබරවාරි 07 දින කැබිනට් අනුමැතියෙන් ආරම්භ කරන ලද්දේ 1995 දෙසැම්බර් 15 වැනි දින කෘෂිකර්ම, ඉඩම් සහ වන සම්පත් ඇමති වෙත ඉදිරිපත් කරන ලද කැබිනට් සටහන් පත්‍රිකාව සැලකිල්ලට ගනිමිනි.

උද්භිද උද්‍යානවල වාර්ෂික ආදායමෙන් 25% උද්භිද උද්‍යානය වැඩිදියුණු කිරීම සහ එහි සුභසාධනය සඳහා උද්‍යාන භාරකාර අරමුදල වෙත වෙන් කිරීමක් වන අතර මෙය මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ. උද්භිද උද්‍යානවල සංවර්ධන කටයුතු සඳහා මූල්‍යමය ආධාර සැපයීම මෙම අරමුදලේ ප්‍රධාන අරමුණ වන අතර අනෙකුත් අරමුණු පහත පරිදි වේ.

- උද්භිද උද්‍යාන ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශ රටවල ද ප්‍රවර්ධනය කිරීම.
- අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ පැළෑටි සංරක්ෂණය කිරීම.
- උද්‍යානයන්හි පහසුකම් වැඩිදියුණු කිරීම සහ උපකරණ මිළදී ගැනිම සඳහා මූල්‍යමය ආධාර සැපයිම.
- උද්භිද උද්‍යානවල සංවර්ධනය මෙන්ම තාක්ෂණික, අධ්‍යාපනික සහ පුහුණු ක්‍රියාදාමයන් වැඩිදියුණු කිරීම සඳහා මූල්‍යමය ආධාර සැපයීම.
- උද්භිද උද්‍යානයට පැමිණෙන විද්‍යාඥයින් සහ විශේෂ නියෝජිතයින් සඳහා පහසුකම් සැපයීම සඳහා කඩිනම් ඉදිකිරීම් හෝ නඩත්තු කටයුතු සිදු කිරීම.
- සැලසුම් කරන ලද විශේෂ වූ වැඩසටහනකට අවශ්‍ය පුනරාවර්තන වැය ආවරණය කිරීම.

උද්‍යාන භාරකාර අරමුදලේ මූල්‍යමය සහාය යටතේ 2016 වර්ෂයේදී උද්‍යානවල සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලද අතර එය උද්‍යානවල තත්ත්වය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට විශාල දායකත්වයක් සපයන ලදී .

2016 වර්ෂය සඳහා උද්‍යාන භාරකාර අරමුදලේ වාර්ෂික ප්‍රාග්ධන වෙන්කිරීම් රුපියල් මිලියන 140 ක් වූ අතර උද්භිද උද්‍යාන සංවර්ධනය සඳහා එයින් රුපියල් මිලියන 139.9 (100%) වැය කර ඇත.

## 8. මූල්‍ය ප්‍රගතිය

ප්‍රධාන උද්‍යානයන් හි සහ අනෙකුත් ඒකකවල සංවර්ධන කටයුතු සැලසුම් කළ පරිදි සිදුකල අතර 2016 වර්ෂයේ දී දෙපාර්තමේන්තුවේ මූල්‍යමය ප්‍රගතිය 99.6 % ක් විය.

| විස්තරය | මුළු ප්‍රතිපාදන (රු.මි) | මුළු වියදම (රු.මි.) | % |
|---|---|---|---|
| ප්‍රාග්ධන මූල්‍ය වෙන්වීම් | 302.80 | 300.80 | 99.3 |
| පුනරාවර්තන මූල්‍ය වෙන්වීම් | 349.51 | 348.74 | 99.8 |
| **එකතුව** | **652.31** | **649.544** | **99.6** |

## 8.1. පුනරාවර්තන වැය

| වැය විෂය | අයිතමය/ විස්තරය | 2016 ප්‍රතිපාදන (රු.) | 2016 ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු.) | මුළු වියදම ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|
| | **පුද්ගල පඩිනඩි** | **294,060,000.00** | **293,862,206.58** | **197,793.42** | **100** |
| 1001 | වැටුප් සහ වේතන | 132,166,000.00 | 131,968,945.13 | 197,054.87 | 100 |
| 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 5,450,000.00 | 5,449,323.26 | 676.74 | 100 |
| 1003 | වෙනත් දීමනා | 15,6444,000.00 | 15,6443,939.19 | 61.81 | 100 |
| | **ගමන් වියදම්** | **1,800,000.00** | **1,798,704.71** | **1295.29** | **100** |
| 1101 | දේශීය | 1,435,000.00 | 1,433,825.66 | 1,174.34 | 100 |
| 1102 | විදේශීය | 365,000.00 | 364,879.05 | 120.95 | 100 |
| | **සැපයීම්** | **8,821,530.00** | **8,377,927.18** | **443,602.82** | **95** |
| 1201 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 700,000.00 | 699,515.78 | 484.22 | 100 |
| 1202 | ඉන්ධන | 3,280,25.00 | 2,841,634.15 | 438,990.85 | 87 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 250,000.00 | 249,517.00 | 483.00 | 100 |
| 1205 | වෙනත් | 4,590,905.00 | 4,587,260.25 | 3,644.75 | 100 |
| | **නඩත්තු වියදම්** | **2,850.000.00** | **2,848,652.55** | **1,347.45** | **100** |
| 1301 | වාහන | 2,000,000.00 | 1,999,432.65 | 567.35 | 100 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 550,000.00 | 549,248.60 | 751.40 | 100 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 300,000.00 | 299,971.30 | 28.70 | 100 |
| | **සේවා** | **40,531,810.00** | **40,424,672.18** | **107,137.82** | **100** |
| 1401 | ප්‍රවාහන | 1,000,000.00 | 896,922.00 | 103,078.00 | 90 |
| 1402 | තැපැල් සහ සංන්නිවේදන | 2,354,750.00 | 2,353,821.32 | 928.68 | 100 |
| 1403 | විදුලිය සහ ජලය | 6,159,830.00 | 6,159,828.60 | 1.40 | 100 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 150,000.00 | 148,584.00 | 1,416.00 | 99 |
| 1405 | වෙනත් | 30,867,230.00 | 30,865,516.26 | 1,713.74 | 100 |
| | **මාරුකිරීම්** | **1,452,569.00** | **1,431,869.49** | **20,699.51** | **99** |
| 1506 | දේපළ ණය පොළී | 1,452,569.00 | 1,431,869.49 | 20,699.51 | 99 |
| එකතුව | | 349,515,909.00 | 348,744,032.69 | 771,876.31 | 100 |

## 8.2. මූලධන වැය

| උප ව්‍යාපෘතිය | වැය විෂය | අයිතමය/ විස්තරය | 2016 ප්‍රතිපාදන (රු.) | 2016 ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු. ) | මුළු වියදම ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම** | **4,100,000.00** | **4,087,224.08** | **12,775.92** | **100** |
| 0 | 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 3,000,000.00 | 2,997,976.71 | 2,023.29 | 100 |
| 0 | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 600,000.00 | 591,313.37 | 8,686.63 | 99 |
| 0 | 2003 | වාහන | 500,000.00 | 497,934.00 | 2,066.00 | 100 |
| | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **3,500,000.00** | **3,484,924.44** | **15,075.56** | **100** |
| 0 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 500,000.00 | 498,555.00 | 1,445.00 | 100 |
| 0 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000.00 | 487,291.24 | 12,708.76 | 97 |
| 0 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,500,000.00 | 2,499,078.20 | 921.80 | 100 |
| 0 | 2201 | ප්‍රාග්ධන මාරුකිරීම් රාජ්‍ය ආයතන (භාර අරමුදල) | 140,000,000.00 | 139,952,313.95 | 47,686.05 | 100 |
| 0 | 2401 | හැකියා වර්ධනය හා කාර්ය මණ්ඩල පුහුණු | 200,000.00 | 191,185.00 | 8,815.00 | 96 |
| | | **විශේෂ ව්‍යාපෘති** | | | | |
| | | **ගම්පහ උද්භිද උද්‍යානය හා ගනේවත්ත ඖෂධ උද්‍යානය සංවර්ධන වැඩසටහන** | **26,500,000.00** | **24,917,994.91** | **1,582,005.09** | **94** |
| 1 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 500,000.00 | 495,330.00 | 4,670.00 | 99 |
| 1 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,000,000.00 | 1,980,939.51 | 19,060.49 | 99 |
| 1 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 12,900,000.00 | 11,345,633.65 | 1,554,366.35 | 88 |
| 1 | 2105 | ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම | 11,100,000.00 | 11,096,091.75 | 3,908.25 | 100 |
| | | **වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට** | **98,500,000.00** | **98,365,401.78** | **134,598.22** | **100** |
| 3 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 1,000,000.00 | 966,423.75 | 33,576.25 | 97 |

| උප ව්‍යාපෘතිය | වැය විෂය | අයිතමය/ විස්තරය | **2016 ප්‍රතිපාදන (රු.)** | **2016 ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) (රු.)** | ඉතිරි ප්‍රතිපාදන (රු. ) | මුළු වියදම ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| 3 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 19,000,000.00 | 18,966,612.61 | 33,387.39 | 100 |
| 3 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 44,000,000.00 | 43,945,509.26 | 54,490.74 | 100 |
| 3 | 2105 | ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම | 34,500,000.00 | 34,486,856.16 | 13,143.84 | 100 |
| | | **තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල** | **25,000,000.00** | **24,881,144.52** | **118,855.48** | **100** |
| 4 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 300,000.00 | 299,970.00 | 30.00 | 100 |
| 4 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,000,000.00 | 997,319.35 | 2,680.65 | 100 |
| 4 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 8,550,000.00 | 8,434,452.66 | 115,547.34 | 99 |
| 4 | 2105 | ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම | 15,150,000.00 | 15,149,402.51 | 597.49 | 100 |
| 7 | 2105 | මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය | **5,000,000.00** | **4,996,364.70** | **3,635.30** | **99** |
| එකතුව | | | **302,800,000.00** | **300,876,553.38** | **1,923,446.62** | **99** |

[1] 2016 වසර සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල සඳහා මහා භාණ්ඩාගාරයෙන් වෙන් වූ මුදල රු.මි. 125 කි. එය උද්‍යාන වල සංවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් රු.මි. 125 ට අමතරව තවත් රු.මිලියන 15 ක් උද්භිද උද්‍යාන භාර අරමුදලින් වියදම් කිරීම සඳහා (තැන්පත් ගිණුමෙන්) 2016.05.11 දින පැවති 2016 වසරේ දෙවන භාරකාර මණ්ඩල රැස්වීමේදී අනුමත කර ඇත. ඒ අනුව 2016 වසර සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල සඳහා මුළු ප්‍රතිපාදන රු.මි.140 ක් විය.

## 8.3 සංවර්ධන ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහන | 2016 දී වෙන් වූ රජයේ ඒකාබද්ධ ප්‍රතිපාදන (රු.මි.) | 2016 වියදම (රු.මි.) | 2016 දී උද්භිද උද්‍යාන අරමුදලින් වෙන් වූ ප්‍රතිපාදන (රු.මි.) | 2016 උද්භිද උද්‍යාන අරමුදලින් වියදම් වූ මුදල (රු.මි.) | මුළු වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 7.175 | 7.141 | 46 | 45.875 | 53.016 |
| ගම්පහ උද්භිද උද්‍යානය සංවර්ධනය | 15.550 | 14.170 | 3 | 3.161 | 17.331 |
| හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධනය | 0.425 | 0.426 | 32 | 32.348 | 32.774 |
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය | 10.950 | 10.748 | 3 | 3.011 | 13.759 |
| මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය | 5.0 | 4.996 | 0.0 | 0.0 | 4.996 |
| අධ්‍යාපනය සහ පුහුණු | 0.2 | 0.191 | 1.0 | 0.914 | 1.105 |
| ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ | 0.0 | 0.0 | 5 | 4.714 | 4.714 |
| ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන | 0.0 | 0.0 | 23 | 23.336 | 23.336 |
| සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 25.0 | 24.881 | 5 | 4.799 | 29.680 |
| මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට | 98.50 | 98.365 | 2 | 1.892 | 100.257 |
| ප්‍රධාන කාර්යාලයේ වැඩිදියුණු කිරීම් කටයුතු | 0.0 | 0.0 | 20 | 19.904 | 19.904 |
| **එකතුව** | **162.8** | **160.918** | **140** | **139.954** | **300.872** |

# ශ්‍රී ලංකා වනජීවී භාරය

# ශ්‍රී ලංකා වනජීවී භාරය

## 1. දැක්ම

"ශ්‍රී ලංකාවේ වන සතුන් ආරක්ෂා කිරීම හා සංරක්ෂණය සඳහා දායකවීම."

## 2. මෙහෙවර

'' වනජීවී සම්පත් සංරක්ෂණය උදෙසා ප්‍රජාව දැනුවත් කිරීම.''

## 3. අරමුණු

- ශ්‍රී ලංකාවේ ස්වාභාවික උරුමයන්හි පාරිසරික හා ආර්ථික අගයන් ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම.
- වනජීවී හා පාරිසරික අධ්‍යාපනික කටයුතු ප්‍රචලිත කිරීම.
- ශ්‍රී ලංකාවේ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා සහාය වීම.
- සංරක්ෂිත කලාප ආශ්‍රිතව ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- වනජීවී/ පාරිසරික නීති අවශ්‍ය පරිදි ප්‍රචලිත කිරීම.
- පාරිසරික සංචාරක පහසුකම්, සන්නිවේදන කාර්යභාරයන් පවත්වාගෙන යාම හා සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සංස්කෘතික අගයන් පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර අවබෝධය වැඩිදියුණු කිරීම.

## 4. පරිපාලනය

වනජීවී භාරය පාලනය කරනු ලබන්නේ සාමාජිකයන් 10 දෙනෙකුගෙන් යුත් භාරකාර මණ්ඩලයක් මගිනි. මෙහි සංයුතිය වනුයේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නිල වශයෙන් සභාපති වශයෙන්ද, වනජීවී විෂය භාර අමාත්‍යාංශ ලේකම්තුමා, වන සංරක්ෂණ ජනරාල්, මුදල් අමාත්‍යාංශ නියෝජිත, ලංකා සංචාරක මණ්ඩල නියෝජිත, මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිත, රාජ්‍ය නොවන ආයතන නියෝජිතයන් දෙදෙනෙකු හා පෞද්ගලික ව්‍යාපාරික අංශයෙන් දෙදෙනෙකු වශයෙනි.

## 5.වනජීවී භාරයේ ආදායම් මාර්ග

වනජීවී භාරය සිය සියලු කාර්යයන් සඳහා ආදායම් ඉපයීම කළ යුතු වේ. මේ සඳහා දැනට ප්‍රධාන ආදයම් මාර්ග 4ක් හදුනාගෙන ඇත.

- අරමුදල් ආයෝජනය
- රන්දෙණිගල පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් කුලියට දීම
- පාරිසරික සංචාරක කටයුතු
- අලෙවි කටයුතු (සන්නිවේදන භාණ්ඩ ආදිය)

සංරක්ෂණ සේවාවන් වර්ධනය කිරීම වනජීවී භාරයෙහි වාර්ෂික ආදායම් වර්ධනය සමග බැඳී පවතී.

## 6. වනජීවී භාරයේ වැඩසටහන් හා සේවාවන්

වනජීවී භාරය තම වාර්ෂික ආදායමෙන් 50%ක් පමණ විවිධ වූ සංරක්ෂණ සේවාවන් පවත්වාගෙන යාම සඳහා වැය කරනු ලබයි.

- **ප්‍රජා අධ්‍යාපන වැඩසටහන්**

  මේ යටතේ ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, ගවේෂණ චාරිකා, එක්දින දැනුවත් කිරීමේ වැඩමුළු, තෙදින නේවාසික ගවේෂණ චාරිකා හා සයමාසික වනජීවී සංරක්ෂණ සහතික පත්‍ර පාඨමාලා ආදිය ඇතුළත් වේ. මෙයට අමතරව විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ද වනජීවී භාරය මගින් සංවිධානය කෙරේ.

- **පාසල් අධ්‍යාපනික වැඩසටහන් හා පාරිසරික කටයුතු**

  මෙම වැඩසටහන වනජීවී භාරයෙහි ප්‍රමුඛ වැඩසටහනකි. ඉතා වැදගත් ජෛව විවිධත්ව වටිනාකමකින් යුත් වනජීවී කලාප ආශ්‍රිත පාසල් සඳහා මෙහිදී ප්‍රමුඛත්වය ලබා දී ඇත. වනජීවී කලාප අවට ඇති පාසල්වල ක්‍රියාකාරී ගුරුවරුන් හා සිසුන් කණ්ඩායම් ඒකරාශී කරමින් ඔවුන්ගේ මූලික සහභාගීත්වය හා සැලසුම් කිරීම් යටතේ කෙටිකාලීන ක්‍රියාවන් ඉගෙනීමේ සැලසුම් හරහා මෙම වැඩසටහන් සංවිධානය කරනු ලබයි.

- **ප්‍රජා සංවිධාන ශක්තීන් දියුණු කිරීම**

  වනජීවී ආරක්ෂිත කලාප තුළ හා අවට ප්‍රජාවගේ සංවර්ධන ක්‍රියාවලිය අරමුණු කරගත් සමාජානුයෝජනය දියුණු කිරීම මෙම ක්‍රියාකාරකම් වලට ඇතුළත් වේ.
  දැනට වනජීවී භාරය මගින් තොරතුරු සන්නිවේදනය හා අලෙවි මධ්‍යස්ථාන 7 ක් ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

- **පර්යේෂණ කටයුතු**

මේ යටතේ අදාළ ක්ෂේත්‍රයන් තුළ විවිධ මට්ටමේ පර්යේෂණ කටයුතු සඳහා සහය ලබාදීම. විශේෂයෙන්ම විශ්ව විද්‍යාල මට්ටමේ උපාධි අපේක්ෂක, පශ්චාත් උපාධි අපේක්ෂක, පර්යේෂණ කටයුතු සඳහා සහය වීම හා උසස් පෙළ සිසුන් සඳහා ව්‍යාපෘති කටයුතු වලට සහය වීම සිදු කෙරේ.

- **සන්නිවේදන හා ප්‍රවෘත්ති අංශ ව්‍යාපෘතිය**

වනජීවී භාරයෙහි අලෙවිසැල්හි ප්‍රකාශන කාර්යාංශය, ප්‍රදර්ශන අංශය හා සම්බන්ධ කාර්යයන් මීට ඇතුළත් වේ. දැනට වනජීවී භාරය මගින් තොරතුරු සන්නිවේදනය හා අලෙවි මධ්‍යස්ථාන 7 ක් ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

# 7. ආදායම සහ වියදම - 2016

**ආදායම**

| | | |
|---|---|---|
| ස්ථාවර තැන්පතු පොලී ආදායම | | 1,676,999.70 |
| යාල අලෙවිසැල | | 827,605.00 |
| විල්පත්තු අලෙවිසැල | | 472,940.00 |
| ප්‍රධාන කාර්යාලයේ අලෙවිය | | 55,481.00 |
| හෝර්ටන්තැන්න අලෙවිසැල | | 655,469.00 |
| රන්දෙනිගල පුහුණු කේන්ද්‍රයේ අලෙවිසැල | | 74,340.00 |
| සත්වෝද්‍යානයේ අලෙවිසැල | | 404,670.00 |
| උඩවලව අලෙවිසැල | | 1,748,022.00 |
| රිදියගම අලෙවිසැල | | 774,965.00 |
| රිදියගම ආපනශාලාව | | 1,058,720.00 |
| ආපදාණය පොලිය | | 4,732.00 |
| රන්දෙනිගල පුහුණු කේන්ද්‍රයේ ආදායම | **1** | (470,391.94) |
| හෝර්ටන්තැන්න භෝජනාගාරයේ කුලී ආදායම | | 3,400,000.00 |
| හෝර්ටන්තැන්න භෝජනාගාරයේ කුලී ආදායම | | 175,000.00 |
| කුමන ජාතික වනෝද්‍යානයට භාණ්ඩ අලෙවිය | | 500,000.00 |
| ආරාධනාපත්‍ර මුද්‍රණය කිරීමෙන් ලද ආදායම | | 51,000.00 |
| සුභ පැතුම්පත් විකිණීමෙන් ලද මුදල් | | 68,400.00 |
| ටී ෂර්ට් විකිණීමෙන් ලද මුදල් | | 33,750.00 |
| Racing the Planet Sri Lanka - සේවා ආදායම් | | 725,000.00 |
| යාල භෝජනාගාරයේ කුලී ආදායම | | 187,500.00 |
| දෙහිවල සත්වෝද්‍යානයේ පැවති වැඩමුළුව | | 32,000.00 |
| දේශක දීමනා | | 8,000.00 |
| තැපැල්පත් මුද්‍රණය කිරීමේ ආදායම | | 5,000.00 |
| බැනර් - APSDC in Bankok | | 204,000.00 |
| වෙනස සඟරාව මුද්‍රණය කිරීම - ඉංග්‍රීසි පිටපත | | 90,000.00 |
| වෙනස සඟරාව නැවත මුද්‍රණය කිරීම - ඉංග්‍රීසි පිටපත | | 81,250.00 |
| කෙටි වීඩියෝ පට 10 ක් සකස් කිරීමේ ආදායම | | 88,250.00 |
| සෆාරි උද්‍යානය පිලිබඳ වාර්තා වැඩසටහන | | 35,000.00 |
| සබරගමුව පලාතේ මාර්ගෝපදේශකයන් පුහුණු කිරීමේ වැඩමුළුව | | 670,000.00 |
| වැඩසටහන් පැවැත්වීමෙන් ලද ආදායම් | | 489,000.00 |
| මල්වගා වැඩසටහන | | 20,000.00 |
| ඡායාරූප සංගමයේ ආදායම් | | 489,000.00 |
| පොත් මිලදී ගැනීම වෙනුවෙන් ආධාර | | 20,000.00 |
| CITES වැඩ සටහනේ ආදායම | | 2,041,250.00 |
| ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ ආදායම | | 1,416,671.45 |
| ජාතික සත්වෝද්‍යානය පිළිබඳව වීඩියෝ පට නිෂ්පාදනය | | 281,250.00 |
| **මුළු ආදායම** | | **18,394,873.21** |

**අඩු කිරීම් : වියදම්**

| | | |
|---|---|---|
| වැටුප් -ප්‍රධාන කාර්යාලය | | 3,195,498.73 |
| වැටුප් -අලෙවිසැල් | | 1,981,083.60 |
| තැපැල් වියදම් | | 9,605.00 |
| අතිකාල දීමනා හා ගමන් වියදම් | | 63,358.00 |
| අත්පත්‍රිකා | | 18,750.00 |
| යාල උඩවලව යාම සඳහා ඉන්ධන වියදම | | 48,703.31 |
| දුරකථන ගාස්තු | | 2,730.00 |
| තැපැල් වියදම් | | 11,599.00 |
| කාර්යාලීය ලිපිද්‍රව්‍ය මිලට ගැනීම | | 795,084.00 |
| භාණ්ඩ සැපැයුම්කරුවන්ට අත්තිකාරම් ගෙවීම් | | 11,400.00 |
| අත් යන්ත්‍ර කට්ටලයක් මිලට ගැනීම | | 14,100.00 |
| Racing the Plant වැඩසටහනේ වියදම | | 9,000.00 |
| රිදියගම තොරතුරු හා අලෙවිසැල විවෘත කිරිමේ වියදම | | 9,400.00 |
| යකඩ රාක් මිලදී ගැනීම | | 76,000.00 |
| පුහුණු වැඩමුළු වියදම් | | 192,900.00 |
| වෙනස සඟරාව මුද්‍රණය කිරීමේ වියදම | | 71,600.50 |
| සුළු මුදල් | | 192,900.00 |
| ඉන්ධන | | 71,600.50 |
| ලිපි කවර | | 184,731.70 |
| මුද්දර ගාස්තු | | 2,000.00 |
| ආරාධනා පත්‍ර මුද්‍රණය කිරිමේ වියදම් | | 52,500.00 |
| ලිපි ද්‍රව්‍ය | | 35,145.00 |
| වායුසමීකරණ නඩත්තු | | 27,900.00 |
| සුළු මුදල්- හෝර්ටන් තැන්න | | 2,886.00 |
| කෙටි වීඩියෝ පට 10 ක් සකස් කිරීමේ වියදම | | 68,000.00 |
| සෆාරි උද්‍යානය පිලිබඳ වාර්තා වැඩසටහන | | 55,000.00 |
| පාරිතෝෂිත ගෙවීම | | 133,280.00 |
| සැපැයුම්කරුවන්ට ගෙවීම් | | 2,748,270.84 |
| රිදියගම බීම හල වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීම | | 845,643.51 |
| ටී ෂර්ට් මිලට ගැනීම | | 710,670.00 |
| වාහන අළුත්වැඩියා කරීම - 251-3758 | | 71,017.00 |
| ඡායාරූප සංගමයේ වියදම් | | 320,645.00 |
| විදුලිය ගාස්තු | | 2,320.50 |
| වෙනත් | | 10,873.00 |
| බැංකු ගාස්තු | | 4,324.15 |
| පොත් රාක්ක මිලදී ගැනීම | | 15,000.00 |
| CITES වැඩ සටහනේ වියදම | | 1,330,000.00 |
| ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශණයේ වියදම | | 835,539.75 |
| කාර්යාල නඩත්තු | | 16,490.00 |
| වනඅලි දුම්රිය ගැටුම් වැලැක්වීමේ නියමු ව්‍යාපෘතිය | | 91,620.00 |
| පොත් මුද්‍රණය කිරීමේ වියදම් | | 700,000.00 |
| **මුළු වියදම** | | **15,039,169.09** |
| **ලාභය/ (අලාභය)** | | **3,355,704.12** |

සටහන 01 - රන්දෙණිගල පුහුණු කේන්ද්‍රයේ ආදායම

| ආදායම් | |
|---|---|
| බංගලා වෙන්කිරීමෙන් ලද ආදායම | 2,540,197.50 |
| ආපනශාලාව | 3,641,916.53 |
| දේශනාගාරය | 134,750.00 |
| කුලී ආදායම | 40,000.00 |
| වෙනත් | 30,479.00 |
| **මුළු ආදායම** | **6,387,343.03** |
| **වියදම්** | |
| වැටුප් | 4,667,762.55 |
| අපනශාලා වියදම් | 1,410,862.46 |
| ජල බිල්පත් | 243,090.00 |
| දුරකථන වියදම් | 37,872.07 |
| විදුලිය | 369,925.89 |
| සළු මුදල් | 40,982.00 |
| ඉන්ධන | 33,500.00 |
| වාහන අළුත්වැඩියා | 9,960.00 |
| වායු සමීකරණ අලුත්වැඩියා | 13,900.00 |
| නඩත්තු වියදම් | 29,880.00 |
| **මුළු වියදම** | **6,857,734.97** |
| **ලාභය/(අලාභය)** | **(470,391.94)** |

## 2016.12.31 දිනට ශ්‍රී ලංකා වනජීවී භාරයේ ව්‍යාපෘති

1. රටවල් 53 ක තරඟකරුවන් 103 දෙනෙකුගෙන් යුත් Racing the planet වැඩසටහන පැවැත්වීම.
2. අපනයන සඳහා මල් වැඩසටහනක් සංවිධානය කිරීම දැනුවත් කිරීමේ වැඩසටහන් 05 ක් පැවැත්වීම.
3. අලුතින් අලෙවිසැල් 04 ක් ආරම්භ කිරීම - දෙහිවල, සෆාරි උද්‍යානය රිදීගම (2), ඇත්අතුරු සෙවණ
4. පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පැවැත්වීම.
5. මාර්ගෝපදේශකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් පැවැත්වීම.
6. ඡායාරූප සංගමයක් පිහිටුවීම - සාමාජික සංඛ්‍යාව 92 කි.
7. 2016.09.05 දින පාසල් හා විවෘත ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීම.
8. 2016.09.16 දින සිට 2016.09.25 දින දක්වා ස්වභාව ධර්මය සංරක්ෂණයට අදාළ පොත් ප්‍රදර්ශනය පැවැත්වීම.
9. ස්වභාව ධර්ම සංරක්ෂණයට අදාළ පොත් 06 ක් එළිදැක්වීම. (පිටපත් 6000 - ශ්‍රී ලංකාවේ ක්ෂීරපායි සතුන්, ශ්‍රී ලංකාවේ ආවේණික කුරුල්ලෝ, සංක්‍රමණික කුරුල්ලෝ, ඇමර්සන් වර්ෂා වනාන්තරය, පාෂාණ ජීර්ණය, ගෝලීය උණුසුම)
10. හෝර්ටන්තැන්නේ මල් පිළිබඳ ලියවුණු පොතක බෙදාහැරීමේ නියෝජිතයන් වශයෙන් භාර ගැනීම.
11. වීඩියෝ පට 08 ක් නිෂ්පාදනය කිරීම.
12. CITES 17 සමුළුවේ ප්‍රචාරණ ද්‍රව්‍ය නිෂ්පාදනය.
13. Wild Lanka සඟරාව එළිදැක්වීම (පිටපත් 1000)
14. අන්තර්ජාලයේ වෙබ් පිටුව ආරම්භ කිරීම.
15. ෆේස්බුක් සමාජ ජාල පිටු 03 නිර්මාණය හා පවත්වාගෙන යාම (සාමාජිකයින් 3000)
16. විදුලි වැට වල විදුලිය බිඳ වැටීම් හා වෙනස්වීම් ස්වයංක්‍රීයව නියාමනය කිරීම හා වාර්තා කිරීම උදෙසා පද්ධතියක් සැලසුම් කිරීම හා ප්‍රායෝගික පර්යේෂණ කටයුතු සිදු කිරීම.
17. $Co_2$NegSLව්‍යාපෘතිය - පොදු සේවා හා ආයතනයන් මඟින් කාබන් පිට කිරීම අවම කිරීම හා පිටවන කාබන් උරා ගැනීමට සමානුපාතිකව ගස් සිටවීමේ වැඩසටහන
18. දුම්රිය - අලි ගැටුම් වැළැක්වීම උදෙසා ඉලෙක්ට්‍රොනික පද්ධතියක් නිෂ්පාදනය කර පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කිරීම .
19. දුම්රිය මාර්ගයේ වනඅලි ගැටුම් වැළැක්වීම උදෙසා නිර්මාණය කරන ලද පද්ධතිය මන්නාරම් දුම්රිය මාර්ගයේ සවි කිරීම ආරම්භ කිරීම.
20. සමාජ ජාල හා පරිසර ක්‍රියාකාරීන් මඟින් දඩයම්කරුවන් හඳුනා ගැනීම හා නීතියට කොටු කර දීමේ වැඩසටහන. (NWCPU)
21. ස්වභාව සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ මාධ්‍ය ප්‍රචාරණ.
22. ආදර්ශ තිරසර ගම්මාන 16 ව්‍යාපෘතිය.
23. ප්‍රචාරණ මාධ්‍යක් ලෙස ඩිජිටල් පුවරු 10 සවි කිරීමේ ව්‍යාපෘතිය.
24. රඹුක්කන හිරිවඩුන්න ග්‍රාමයේ පොලිතින් නිදහස් පාසලක් බිහි කිරීම හා සිසු සිසුවියන් ඒ සඳහා දිරිමත් කිරීමට කෑම පෙට්ටි, බෝතල්, පාසල් බෑග්, ලිපි ද්‍රව්‍ය බෙදා දීම ද නිරෝගී සිසු සිසුවියන් උදෙසා හුණු පුවරු වෙනුවට White board සවි කර දීම.